The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
தினமின
ශ්‍රී බුද්ධ වර්ෂ 2566ක් වූ උඳුවප් අව එකොළොස්වක තිථිය ලත් සඳු දින | කාණ්ඩය 114 | පත්‍රය 02 | පිටු 16 | මිල රු.60
web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත්පතකි | 2022 දෙසැම්බර් 19 සඳුදා

# ණය සහන කඩිනම් කරන චීන සාකච්ඡා සාර්ථකයි

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධානී

ශ්‍රී ලංකාවේ ණය සහන කඩිනම් කිරීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් චීනය සමඟ ඵලදායී සාකච්ඡාවක් සිදු කිරීමට හැකි වූ බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධානී ක්‍රිස්ටලීනා ජෝර්ජිවා මහත්මිය පැවසූ බව විදෙස් පුවත් සේවා වාර්තා කර තිබේ.

6 පිටුවට

## ‘ඔබ එන තුරු මම ඉන්නවා’ යනුවෙන් SMS පණිවිඩය යැව්වේ

# දිනේෂ්ගේ ඝාතකයා!



### ගෙදර සිට කෙළින්ම ගිහින් තියෙන්නේ බොරැල්ල කනත්තටයි

### දිනේෂ්ගේ හා බ්‍රයන් තෝමස්ගේ දුරකතන ව්‍යවහාරික පරීක්ෂණයකට යොමු කරයි

### SMS පණිවිඩය ගියේ කනත්ත ආසන්නයේ දුරකතන කුළුනු හරහා

### තවත් සැකකටයුතු තොරතුරු රැසක් ගැනත් පරීක්ෂණ

ගයාන් කුමාර වීරසිංහ සහ බණ්ඩාරගම බිමල් ජයසිංහ

7 පිටුවට

# පාසල් සිසුන්ට මත්ද්‍රව්‍ය විකුණූ 75ක් අත්අඩංගුවට



## මහනුවරදීත් 2ක් දැලේ

ගයාන් කුමාර වීරසිංහ සහ අසේල කුරුළුවංශ

සිසුන් ඉලක්ක කරගෙන මත්ද්‍රව්‍ය අලෙවි කිරීමට පැමිණි බවට සැක කරන පුද්ගලයන් 75 දෙනකු බස්නාහිර පළාතේ පාසල් 121ක් ආශ්‍රිතව පොලිසිය පසුගිය සිකුරාදා දහවල් 12.00 සිට සවස 3.00 දක්වා පැය 03ක් පුරාවට කළ විශේෂ මෙහෙයුමකදී අත්අඩංගුවට ගත් බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරී නිහාල් තල්දූව මහතා සඳහන් කරයි.

6 පිටුවට



# සැමියාගෙන් ලක්ෂ 50ක කප්පමක් ගන්න ඥාති නිවෙසක හැංගී සිටි බිරිය අත්අඩංගුවට

ගයාන් කුමාර වීරසිංහ, පුත්තලම අතිරේක - හිරාන් ප්‍රියංකර ජයසිංහ

සිය දියණියගේ නිවසට ගොස් පැමිණෙමින් සිටියදී සන්නද්ධ කණ්ඩායමක් විසින් පැහැර ගත්තේ යැයි කියමින් දින කිහිපයක් තිස්සේ ඥාති නිවසක රැඳී සිටිමින් සැමියාගෙන් රුපියල් ලක්ෂ 50ක කප්පමක් ගැනීමට උත්සාහ ගත් බිරියක් ආණමඩුව පොලිසිය විසින් දීර්ඝ විමර්ශනයකින් අනතුරුව ඊයේ (18) අත්අඩංගුවට ගෙන තිබේ.

6 පිටුවට

# නව නාවික හමුදාපති රියර් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා

රක්ෂණ ශ්‍රියන්ත



සන්නද්ධ හමුදා සේනාධිනායක, ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් රියර් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා මහතා වයිස් අද්මිරාල් නිලයට උසස් කිරීමෙන් අනතුරුව, ඊයේ (18) ශ්‍රී ලංකා නාවික හමුදාවේ 25 වැනි නාවික හමුදාපතිවරයා ලෙස පත් කර තිබේ.

6 පිටුවට

## ශිෂ්‍යත්වය නිම වීමේ සතුට...



කැලණිය ගුරුකුල විදුහලේ පහ ශ්‍රේණියේ සිසු සිසුවියන් ශිෂ්‍යත්ව විභාගය නිම කර සතුටින් යුතුව පාසලින් පිටතට එන අයුරු. *ඡායාරූපය - රාගම සමූහ - කේ. එස්.හැන්නදි*

# 75 වැනි නිදහස් සැමරුමට රටට - ජනතාවට සෙත් පතා දළදා ප්‍රදර්ශනයක් පවත්වන්න

## ජනපතිගේ සංදේශය අගමැති අතින් මහානායක හිමිවරුන්ට

අසේල කුරුළුවංශ

5 පිටුවට

## අපරාධ අංශ ඕඅයිසීට නිකන් අරක්කු නොදුන්නැයි

# කුඩු ලෝලියා බාර් හිමියාට පිහියෙන් ඇනලා

ගයාන් කුමාර වීරසිංහ

6 පිටුවට



# පාන් කෙටි ආහාර මිල බසී

අනුර ප්‍රේමලාල් සහ කරන්දෙණිය අනුරාධ ප්‍රියදර්ශන

ග්‍රෑම් 450ක පාන් ගෙඩියක මිල හා කෙටි ආහාරවල මිල රුපියල් දහයකින් අඩු කෙරේ. ඒ අනුව රුපියල් 190කට පැවැති සාමාන්‍ය පාන් ගෙඩියක මිල පෙරේදා (17) සිට රුපියල් 180 දක්වා අඩු කළ බව සමස්ත ලංකා බේකරි හිමියන්ගේ සංගමයේ සභාපති එන්.කේ. ජයවර්ධන මහතා පවසයි.

6 පිටුවට

# ගැඹුරු මුහුදේදී අත්අඩංගුවට ගත් අයිස් කිලෝ 234 හා සැකකරුවන් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයට



ඡායාරූපය-කැළුම් ලියනගේ

ගයාන් කුමාර වීරසිංහ, රක්ෂණ ශ්‍රියන්ත

රාජ්‍ය බුද්ධි සේවයට ලද තොරතුරකට අනුව දෙවුන්දර තුඩුවට ඔබ්බෙන් වූ ගැඹුරු මුහුදේ කළ මෙහෙයුමකදී හෙරොයින් සහ අයිස් කිලෝ 234ක් සමඟ නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගත් සැකකරුවන් 13 දෙනා සමඟ යාත්‍රා දෙක කොළඹ වරායට රැගෙන විත් විමර්ශන කටයුතු සඳහා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයට ඊයේ (18) භාර දෙන ලදි.

6 පිටුවට

# අහැටුවැව බණ්ඩාරනායකයේ ශිෂ්‍යත්ව අක්‍රමිකතාවක්



## විමර්ශනයක් කර සිසුන්ට සහනයක් දෙනවා

විභාග කොමසාරිස් ජනරාල් එල්.එම්.ඩී. ධර්මසේන

රක්ෂණ ශ්‍රියන්ත, මහව - එස්. ආරියරත්න

ගල්ගමුව අධ්‍යාපන කොට්ඨාසයේ අහැටුවැව බණ්ඩාරනායක ජාතික පාසලේදී ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රශ්න පත්‍ර බෙදා දීමේ අක්‍රමිකතාවක් සිදු වූ බවට සිසුහු සහ මවුපියෝ චෝදනා කරති.

6 පිටුවට

# මන්ත්‍රී වරප්‍රසාද අඩු කළ යුතුයි

පී.කේ. බණ්ඩාර

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද අඩු කළ යුතු බවට තමා විශ්වාස කරන බව සමඟි ජන බලවේගයේ භාණ්ඩාගාරික පා.ම. ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා කියා සිටියේය.



6 පිටුවට

## රාජකාරිය පැහැර හැරලා

# මහනුවර ට්‍රැෆික් OIC නුවරඑළියට මාරු කරයි

අසේල කුරුළුවංශ

රාජකාරී පැහැර හැරීමේ සිද්ධියක් මුල් කර ගනිමින් මහනුවර රථවාහන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්ලිව්.ආර්.ඒ.ඩී. සුගතදාස මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි නුවරඑළිය පොලිස් කොට්ඨාසයට මාරු කර තිබේ.

6 පිටුවට



# අනියත බියක් එපා

## පේරාදෙණිය සරසවියේ ආරක්ෂාව තහවුරුයි

### නියෝජ්‍ය උපකුලපති, මාධ්‍ය ප්‍රකාශක මහාචාර්ය ටෙරන්ස් මදුජිත්

අසේල කුරුළුවංශ

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ ආරක්ෂාව තහවුරු කර තිබෙන බැවින් විශ්වවිද්‍යාලය තුළ රාජකාරි කිරීම සම්බන්ධයෙන් ආචාර්යවරු අනියත බියක් ඇති කර නොගත යුතු යැයි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති, මාධ්‍ය ප්‍රකාශක මහාචාර්ය ටෙරන්ස් මදුජිත් මහතා පවසයි.

6 පිටුවට



# අමෙරිකානු ධනවතුන් රැගත් ‘ඕෂන් ඔඩිසි’ කොළඹට සේන්දු වෙයි

උපාලි කරුණාරත්න

6 පිටුවට

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2022 දෙසැම්බර් 19 සඳුදා

# අපට ඇවැසි 'නොබැඳි පිළිවෙත'

රටේ නායකයා රටේ පැවැත්මට හා දියුණුවට අදාළ සාධක කෙරෙහි පුළුල් වැටහීමකින් ක්‍රියා කළ යුතුය. එම සාධක අතර ප්‍රධාන වන්නේ ජාතික ආරක්ෂාව, ජාත්‍යන්තර සබඳතා සංවර්ධන උපාය මාර්ග හා තරුණ පරම්පරාව කෙරෙහි දක්වන ආකල්ප ආදිය බව අපගේ පිළිගැනීම වෙයි. ජාතික ආරක්ෂාව රට හා ජනතාව රැක ගැනීමටය. ජාත්‍යන්තර සබඳතා ලෝකය සමග ගනුදෙනු කරමින් ඉදිරියට යෑමටය. සංවර්ධන උපාය මාර්ග රට දියුණු කිරීමටය. තරුණ පරම්පරාව රටේ අනාගතය වන අතර ඔවුන් පිළිබඳ සාධනීය ආකල්පවලින් තොරව රටක් ඉදිරිගාමී කළ හැකි නොවේ.

දියතලාව යුද හමුදා විද්‍යා පීඨයේ පැවති කැඩෙට් නිලධාරීන් විසිර යෑමේ උත්සවයකදී ජනාධිපතිවරයා කළ කතාව ඉහත කරුණු සම්බන්ධයෙන් හොඳින් ගළපා ගත හැකිය. අපේ රාජ්‍ය නායකයා රටේ අනාගතය පිළිබඳ දක්වන සුබවාදී දැක්ම එම කතාවෙන් උකහා ගත හැකිය. ජනාධිපතිවරයා ශ්‍රී ලංකාව හැඳින්වූයේ දූපත් රාජ්‍යයක් හැටියටය. අපට දේශ සීමා අරගල හෝ යුද්ධ නැත. එහෙත් අප ජාත්‍යන්තර සබඳතා මනාව කළමනාකරණයට යොමු වෙමින් රටේ අනාගතය සුබවාදී කර ගත යුතුය. ඒ සඳහා විධිමත් වැඩපිළිවෙළක් මෙන්ම අවබෝධයක් ද අප සතු විය යුතුය.

ඉතිහාසය දෙස බලන විට අපේ ඇතැම් නායකයන් විදේශ සබඳතා හසුරුවාගෙන ඇත්තේ එතරම් සතුටුදායක නොවන අයුරින් බව පෙනී යයි. සමහර නායකයන් ලෝකයේ එකිනෙක බලකඳවුරු කෙරෙහි දැඩි විශ්වාසය තබමින් ක්‍රියා කර ඇත. එයින් අපට බලවත් පාඩු සිදු වී ඇත. රනිල් වික්‍රමසිංහ මහතා පෙන්වා දෙන අන්දමට අප අනුගමනය කළ යුත්තේ නොබැඳි පිළිවෙතකි. අප කිසිදු බලකඳවුරක් සමග ගිවිසුම් ගත විය යුතු නැත. අප කිසිදු බලකඳවුරක ඉත්තෙකු විය යුතු ද නැත. නිදසුනක් ගතහොත් රුසියානු යුක්රේන යුද්ධයේදී අප කිසිදු පාර්ශ්වයකට සහයෝගය දක්වන අයුරින් ක්‍රියා කළ යුතු නැත. රුසියාව මෙන්ම යුක්රේනය ද අපේ මිතුරෝ වෙති.

අමෙරිකාව, රුසියාව, චීනය, ජපානය වැනි ලෝක බලවතුන්ගේ ආර්ථික සහයෝගය අපට ඉතා වැදගත්ය. එමෙන්ම කලාපීය වශයෙන් ඉන්දියාව ඇතුළු සාක් රටවල සහයෝගය ද ඒ තරමටම වැදගත්ය. තවත් අතකින් ජගත් සංවිධානවල ආර්ථික සහයෝගය ද අපට අත්‍යවශ්‍ය වේ. ජනාධිපතිවරයා ක්‍රියා කරන්නේ මේ සියලු අංශ කෙරෙහි ඇති කරගත් මනා අවබෝධයකින්ය. මේ නිසාම බලවත් රටවල් හා ජගත් සංවිධාන අපේ රට දෙස නව මානයකින් බලන්නට පෙලැඹී ඇති බව පැහැදිලිය. අපේ ආර්ථික අර්බුදය කෙටි කාලයක් තුළ විසඳාගත හැකි උපාය මාර්ග මේ වන විටත් ක්‍රියාත්මක වන බව ද දැකගත හැකිය.

1954 ඉන්දු - චීන යුද්ධය, 1967 අරාබි - ඊශ්‍රායල් යුද්ධය, 1971 ඉන්දු - පාකිස්තාන යුද්ධය අපට සිහිපත් වේ. මේ අවස්ථාවලදී ශ්‍රී ලංකාව ක්‍රියා කර ඇත්තේ ගැටුම් නවතා සාම සාකච්ඡා ඇති කිරීමට දායක වූ මැදිහත්කරුවකු හැටියටය. චීනය මෙන්ම ඉන්දියාව ද ශ්‍රී ලංකාවේ මැදිහත් වීම පිළිගත්තේය. ඉන්දු - පාකිස්තාන යුද්ධයේදී එය සමථයකට පත් කිරීම සඳහා ශ්‍රී ලංකාව විශේෂයෙන් මැදිහත් වී ඇත. ඉන්දියානු නායකයෝ මෙන්ම පාකිස්තානු නායකයෝ ද එය සාධනීය මැදිහත් වීමක් ලෙස පිළිගත්හ. ලෝකයේ කවර රටක වුව යුද්ධයක් අනුමත කිරීමේ හැකියාව නිදහස් රාජ්‍යයකට නැත. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ලෙස අප එය හැම විටම පාහේ ඉටු කර ඇති බව පෙනෙයි. ජනාධිපතිවරයා පෙන්වා දෙන ලෙස ජාතික ආරක්ෂාව රටකට ඉතා වැදගත්ය. එහෙත් යුද්ධයක් ඇති වීම වැළැක්වීම අප සැමගේ වගකීමය.

කැඩෙට් නිලධාරීන් විසිර යෑමේ උත්සවයේදී ජාතික ආරක්ෂාව හා හමුදාවේ වගකීම සම්බන්ධයෙන් රනිල් වික්‍රමසිංහ මහතා දැක්වූ අදහස් ද ඉතා වැදගත්ය. එම අදහස් අපගේ විමසුමට ලක්විය යුතුය. රටේ සේනාධිනායකයා හැටියට හමුදාවේ ධෛර්යය ඔසවා තබන අයුරින් ජනාධිපතිවරයා කතා කළේය. එය බොහෝ දෙනාගේ අවධානයට ලක් වී ඇත. ආරක්ෂක නිලධාරීන් රටට එල්ල වන විදේශීය හා දේශීය තර්ජන ගැන අවධානයකින් සිටිය යුතු බව ද, ඒවා වැළැක්වීම සඳහා අභියෝගාත්මක ලෙස ක්‍රියා කළ යුතු බව ද ජනාධිපතිවරයා පෙන්වා දෙයි. හමුදාවක් යනු අභියෝග හමුවේ පලා යන කණ්ඩායමක් නොවේ. හමුදාව අභියෝගවලට නොබියව මුහුණ දී ඒවා ජය ගත යුතුය. ඊට අවශ්‍ය දිරිය හා කැපවීම ද හමුදාවකට තිබිය යුතුය.

ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාව යුද්ධයේ අත්දැකීම් සහිත විනයගරුක හමුදාවක් බව ලෝකය පිළිගෙන තිබේ. ඒ අනුව එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවට එකතු වී රාජකාරි කිරීමේ අවස්ථාව ද අපේ හමුදාවට හිමි වී ඇත. මාලි රාජ්‍යයේ සාමය උදෙසා අදත් අපේ හමුදා භටයෝ කැපවීමකින් යුතුව රාජකාරියේ යෙදී සිටිති. දියතලාවේ කැඩෙට් නිලධාරීන්ගේ පුහුණුව සඳහා විදේශ රටවල පිරිසක් ද එක්වී සිටියහ. ඉන් පෙනී යන්නේ අපේ ආරක්ෂක ඇකඩමිවල විද්‍යාත්මක පුහුණුව ලෝකයේ පිළිගැනීමට ලක්වී ඇති බවය. සාමයට මැදිහත් වීම සම්බන්ධයෙන් පමණක් නොව හමුදා පුහුණුව ගැනද කීර්තිනාමයක් ශ්‍රී ලංකාවට ලැබී ඇත. එය සුවිශේෂී තත්ත්වයකි. සාර්ථක නායකත්වයක් තුළ බොහෝ ජයග්‍රහණ අපට ලබා ගත හැකිය.

# තිත්ත බෙහෙත



ලෙඩ හොඳ වෙන්න බීමට ඇති බොහෝ බෙහෙත් වර්ග තිත්තය. හැබැයි තිත්තට තැන දී බෙහෙත් නොබිව්වොත් සිදු වන්නේ ලෙඩ වැඩි කර ගන්නය. නැත්නම් ලෙඩේ ඔඩුදුවා මිය යන්නත් පුළුවන. තිත්ත බෙහෙත් ගැන කතාවකින් මේ සටහන ආරම්භ කළේ, මේ වන විට මෙරට ආර්ථික අර්බුදය නම් රෝගය උත්සන්නව පණ අදින තැනක තිබෙන නිසාය. එය කොතෙක් උත්සන්නව ඇත්දැයි කියනවා නම්, මෙතෙක් ආර්ථික දුෂ්කරතා මගහරවා ගත්තේ, රටේ සල්ලි නැත්නම් විදේශයකින් හෝ ණයක් අරගෙන ය. නමුත් මේ වන විට ශ්‍රී ලංකාව සැලකෙන්නේ නිල වශයෙන් බංකොලොත් රටක් ලෙසය. එනම් ගත්ත ණයවල පොලී වාරික ටිකවත් ගෙවාගන්න බැරි වූ නිසාය.

වඩාත් අවාසනාවන්ත තත්ත්වය නම්, මේ ආකාරයට නිල වශයෙන් බංකොලොත් බව ප්‍රකාශයට පත් කළ රටකට වැරදිලාවත් ණයක් දෙන්න කෙනෙක් නොසිටීමය. කිසිම රටක්, කිසිම අන්තර්ජාතික මූල්‍ය ආයතනයක් අපට සත පහක් දෙන්නේ නැත. උපරිම වුණොත් සාගතයක් ආවොත් කන්න ටිකක් විසිකරනවා විතරය. එහෙව් රටක ඉරණම ලියවෙන්නේ මහා බේදාන්තයක් වශයෙන් මිස වෙන කොහොමද? ඒ මෙහෙම රාජ්‍යයන් ගොඩදාන අනේපිඬුලා හෝ වෙස්සන්තරලා නොසිටින නිසාය.

අමතක නොකළ යුත්තේ, රට මෙතනට වැටුණේද වෙන කාගේවත් වරදකින් නොවන බවය. එය දේශපාලනඥයන් වෙත පමණක් පැටවිය නොහැකිය. වඩාත් නිවැරදි කියවීම නම්, ජනතාව සතුටු කරන්න , ජනතාව අන්දන්න, දේශපාලනඥයන් ගනු ලැබූ ජනප්‍රිය තීන්දු තීරණවල අවසන් ප්‍රතිඵලය ලෙස අද රට මෙතැනට ඇද වැටී ඇති බවය. රටේ බහුතරයක් නිදහස් සහ සාධාරණ ඡන්දවලදී රට මෙතැනට ඇද දැමීමේ මල් වට්ටියට අත ගැසූ බවය.

## ■ අනාගතය දැකීම

කොහොම නමුත් මේ වන විට යම් ආකාරයකට සැනසුම් සුසුමක් හෙළීමට අවස්ථාව ලැබී ඇත. පෝලිම් යුගය අවසන් ය. ගොවීන්ට පොහොර ලැබෙමින් ඇත. පැය 14 -15 විදුලි කප්පාදුව හමුවේ වැසෙන්නට ගිය කර්මාන්ත යළිත් හිස ඔසවන තැනට පත්කරගෙන ඇත. එහෙත් පෙනුමෙන් දර්ශනය මෙසේ වුවත්, තවමත් රට පවතින්නේ බරපතළ ආර්ථික අවදානමකය. අවශ්‍යයෙන්ම රට ඇත්තේ තිත්ත බෙහෙත් අවශ්‍යම මොහොතකය. ඒ තිත්ත බෙහෙත් දීම තනි ආණ්ඩුවකට තනි පක්ෂයකට සිදු කළ නොහැකිය.

මේ බව කල්තියා නිවැරදි ලෙස පුරෝකථනය කළ නායකයා අන් කවුරුත් නොව ජනාධිපති රනිල් ය. පසුගිය සමයේ ඔහු විපක්ෂයේ තනි මන්ත්‍රීවරයකු ලෙසත් ඒ බව අවධාරණය කළේ පාට පක්ෂ භේද පසෙකලා ඉතිහාසයේ අමාරුම අවස්ථාවේ කවුරුත් එක්ව පොදු විසඳුමක් වෙත යා යුතු බව කියමින්ය. ජනාධිපති ධුරය ලැබුවත් කියන්නේ ඒ කතාවය. ජනාධිපති රනිල් දිගින් දිගටම සර්වපාක්ෂික එකඟතාවක්, සර්වපාක්ෂික වැඩපිළිවෙළක්, සර්වපාක්ෂික ආණ්ඩුවක් ගැන කතා කරන්නේ ඒ නිසාය. නමුත් විපක්ෂයේ ප්‍රතිචාරය නිෂේධනාත්මකය.

එහෙත්, ජනාධිපතිවරයා උත්සාහය අත්හැර නොමැත. ඔහු විපක්ෂයේ විශ්වාසය තනි තනිව හෝ දිනා ගන්නට කටයුතු කරමින් ඇත. එහිදී ජනාධිපති ධුරය සතුව තිබූ විධායක බලතල යම් ප්‍රමාණයක් ඉවත් කරගෙන පාර්ලිමේන්තුවට දී ඇත. ප්‍රධාන පෙළේ පාර්ලිමේන්තු කමිටුවල ප්‍රධානීත්වය විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට පවරා ඇත. දැන් ඔවුන් ප්‍රතිපත්ති සම්පාදනයේ සිට, ඒවා ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව දක්වා ගැටගැසී සිටී. ඒ නිසා රට මුහුණදී ඇති අර්බුදයේ තරම ප්‍රායෝගිකව අත්දකියි. දැන් තිබෙන්නේ තවදුරටත් කතා සාප්පුවලට සීමා නොවී එම කමිටු හරහා ක්‍රියාත්මක වීමය.

## ■ දෙමළ පක්ෂ

සැබවින්ම එය මෑත කාලයේ මෙරට රාජ්‍ය නායකයකු දියත් කළ දියුණු උපාය මාර්ගික ප්‍රවේශයක්ය. ආර්ථික තලයේදී පමණක් නොව දේශපාලන තලයේද උපාය මාර්ගික එළඹුම සාර්ථකව වැඩ කරන බව පෙනෙන්නට ඇත. ඊට හොඳම නිදර්ශනය උතුරු නැඟෙනහිර ජනතාවගේ මූලික ප්‍රශ්න විසඳා බලය බෙදීම සම්බන්ධයෙන් පොදු එකඟතාවයකට ඒමට පසුගියදා කැඳවනු ලැබූ සර්ව පාක්ෂික සමුළුවය.

මේ සඳහා ජනාධිපතිවරයා අවස්ථාව ලබාගත් ආකාරයත් අපූරුය. ඒ 2023 අය වැය විවාදය අවස්ථාවේ සිදු වූ සිදුවීමක් තුළදීය. ඒ දිනවල ජනාධිපතිවරයාද නිතර සිටියේ පාර්ලිමේන්තුවේය. එවැනි දිනක දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රී එස්. සුමන්තිරන් දෙමළ ජනතාව මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් විසඳුම් ඉල්ලා අවධාරණාත්මක ප්‍රකාශයක් කළේය. එහිදී ක්ෂණිකව ක්‍රියාත්මක වූ ජනාධිපතිවරයා, ඊට ප්‍රතිචාර දක්වා සිටියේ , සුමන්තිරන් මතුකළ කරුණු විසඳීම පාර්ලිමේන්තුව මගින් සිදු විය යුතු බව අවධාරණය කරමින් ය. එසේම ඒ අවස්ථාවේ පාර්ලිමේන්තුවේ සිටි පක්ෂ නායක මන්ත්‍රීවරුන් නම් කරමින් ඔවුන්ගෙන් ද සෘජුව විමසා සිටියේ "මොකද කියන්නේ සියලු පක්ෂ එකතුව මේ ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් දීම වෙනුවෙන් වන සාකච්ඡාවකට එකඟ වනවාද?" කියාය. එහිදී ඊට එකඟතාව පළ කරනවා හැර වෙනත් විකල්පයක් විපක්ෂයට තිබුණේ නැත.

මෙරට ඉතිහාසයේ පැවති සර්ව පාක්ෂික සමුළුවලට වෙනස්ව යමින්, පසුගිය 13 වනදා පැවති සර්ව පාක්ෂික සමුළුව වෙනස්ම ආකාරයේ එකක් වූයේද ඒ අනුවය. මෙතෙක් දේශපාලන සිරකරුවන් සම්බන්ධයෙන් ජාතිවාදී ස්ථාවරයක සිට අදහස් දැක්වූ නායකයන් ඒ අදහස් වෙනස් කරගෙන තිබිණ. එය දකුණේ සමාජයෙන් උතුරට යැවෙන යහපත් පණිවිඩයක් විය. එසේම විශේෂත්වයක් වූයේ උතුරු නැඟෙනහිර කේන්ද්‍රීයව දේශපාලනය කරන පක්ෂ ද දැඩි උනන්දුවකින් ඒ සඳහා සහභාගීව සිටීමය. වෙනදා දකින්න ලැබුණු වාර්ගික මතගැටුම් ඉක්මවා ගැටලුව විසඳා ගැනීම වෙනුවෙන් සාධනීය ඉදිරිගාමී යෝජනා රැසක් එහිදී අසන්න ලැබිණ. වඩාත් සතුටු දනවන සිදුවීම වන්නේ 2023ට නියමිත 75 වැනි නිදහස් උත්සව සැමරුමට පෙර මූලික විසඳුම් ඉදිරිපත් කිරීමට දින වකවානු ප්‍රකාශ කිරීමට තරම් ප්‍රවේශයක් ගැනීමය. එහිදී පෙන්නුම් කෙරුණේ සර්ව පාක්ෂික එකඟතාව යන්න මේ රටේ ප්‍රශ්න විසඳා ගැනීම වෙනුවෙන් මේ මොහොතේ ඇති සුදුසුම ක්‍රමය බවය.

## ■ පක්ෂ සමුළුව

ආර්ථික අර්බුදය සම්බන්ධයෙන්ද මෙවැනිම සර්ව පාක්ෂික සමුළුවක් කැඳවා ජාතික ප්‍රතිපත්තියක් සැකසිය යුතු බවට ජනාධිපති රනිල් යෝජනා කළේ ඒ නිසාය. එම කටයුතු යෝජනා වී ඇත්තේ එළඹෙන පෙබරවාරියේදී සිදු කිරීමටය. ඒ සඳහා සහභාගී වීමත් කවුරුවත් ප්‍රතික්ෂේප කර සිටියේද නැත. මෙහි ඇති තවත් ලස්සන සිදුවීමක් නම්, සර්ව පාක්ෂික එකමුතුව හමුවේ ජනාධිපති රනිල් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් වන තමන්ගේ අදහසද සෘජුව හෙළි කිරීමය. අනතුරුව ඔහු ඒ සම්බන්ධයෙන් පක්ෂ විපක්ෂ ස්ථාවරය විමසයි. විපක්ෂයේ කාර්ය භාරය සේරටම විරෝධය දැක්වීම යන මුග්ධ මතයේ තවදුරටත් රැඳෙන්න එහිදී ජනාධිපතිවරයා ඉඩ දෙන්නේ නැත. තමන්ගේ අදහසට විරෝධයක් ඇත්නම් ඒ සම්බන්ධයෙන් විපක්ෂයේ අදහස විමසයි. විපක්ෂයේ විසඳුම වඩාත් සුදුසු නම් සියලු දෙනාට ඒ සමඟ එකඟ විය හැකි බව පෙන්වා දෙයි. මේ හැසිරීම හමුවේ විපක්ෂය දැන් තල්ලු වෙමින් ඇත්තේ, ජනාධිපති රනිල්ගේ පාලනයට අනියමින් හෝ සහය දෙන්න වන තැනකටය.

## ■ නව උපාය

සර්ව පාක්ෂික ආණ්ඩුවක් පිහිටුවීමට කැඳවූ අවස්ථාවේ එය ප්‍රතික්ෂේප කරන්නට දහසක් කරුණු කියූ විපක්ෂයේ ඇතැම් ඊනියා නායකයන්ට ජනාධිපති රනිල්ගේ මේ නව උපාය මාර්ගික ප්‍රවේශය දැනටමත් හිසරදයක් බවට පත්ව හමාරය. ඒ බව මේ වන විටත් ඔවුන් කියන කරන දෙයින් පෙනෙන්නට ඇත. දැන් අහන අලුත්ම ප්‍රශ්නය, "ඉතිහාසය පුරාවට විසඳන්න නොහැකි වූ ප්‍රශ්නයක් දින 75න් විසඳන්නේ කොහොමද ?" කියාය. වියත් වෙස්ගත් තවත් චරිතයක් මේ මොහොතේ ආණ්ඩුව හමුවේ තිබෙන අභියෝග පෙළගස්සවා තිබුණේ මෙසේය. "පළමු අභියෝගය නිල කාලය නිමා වෙමින් තිබෙන පළාත් පාලන මැතිවරණය පැවැත්වීමය" කියමින්ය. මේ උගත් ආචාරියා අන්දවන්න එන්නේ කාවද? රට හමුවේ ඇති පළමු අභියෝගය පළාත් පාලන මැතිවරණයක් පැවැත්වීමද? මේ මොහොතේ මැතිවරණ අවශ්‍යව සිටින්නේ සජිත් ප්‍රමුඛ සීමිත ප්‍රමාණයකට පමණය. අනිත් පාර්ශ්වය ගෝධාභය පාලනයට නැව් කඹ ගිල්ලවූ ඊනියා වියත්මග නඩයටය. දැන් ඔවුන් රාජපක්ෂට පසුව ශරීරය ලෙස සජිත්ව තෝරාගෙන ඇත. අන්න ඒ නිසා රටේ මූලික ප්‍රශ්නය අමතක කර වෙනත් ප්‍රශ්න මූලික කිරීමේ වගකීම ඔවුන් බාරගෙන ඇත. සජිත් ඡන්ද ඉල්ලා හන්දි ගානේ රස්තියාදු වන විට, ඊනියා වියත්මග ඡන්ද ඉල්ලා ලියන මාගල් දකින්න ඇත්තේ ඒ අනුවය.

ඔවුන්ට අමතක ඉතිහාසයේ මෙන් නොව, පෙර නොවූ විරූ ආකාරයට මෙවර තීරණාත්මක ප්‍රශ්න ඉදිරියට ගන්න වන්නේ, රටේ පවතින වාස්තවික තත්ත්වයට අනුව බවය. ඒ ප්‍රශ්නය විසඳන්න වෙන්නේ, කවුරුත් එක මේසයක එකට ඉඳගෙන බවය. දැන් කාට කාටත් කතා සාප්පු වෙනුවට ප්‍රායෝගික සහ දියුණු ස්ථිර විසඳුම් වෙනුවෙන් පෙනී සිටින්නට සිදුව ඇති බවය. ඒ වෙනුවෙන් අත උස්සන්න සිදුව ඇති බවය. නැත්නම් හකුළාගෙන පැත්තකට යන්න සිදුවෙන බවය. ඒ හමුවේ මේ කවුද මොනවද කරන්නේ යන්න ජනතාවට හොඳටම දැකබලා ගන්න ලැබෙන බවය.

## ■ සාමය

මේ අතර දිවයිනට පැමිණ සිටින ජනාධිපති රනිල්ගේ අන්තර්ජාතික දේශගුණය පිළිබඳ උපදේශක එරික් සෝල්හයිම් සමඟ ද්‍රවිඩ ප්‍රගතිශීලි සන්ධානයේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී මනෝ ගනේෂන් සමඟ පැවති හමුවකින් අනතුරුව මාධ්‍ය අමතා කියා තිබුණේ, ජනාධිපති රනිල් විසින් කැඳවනු ලැබූ සර්ව පාක්ෂික සමුළුව මෙරට දේශපාලන ගැටලු බොහොමයකට විසඳුම් ගෙන එන වැදගත් පියවරක් බවය. එහිදී ඔහු මෙසේ ද කියා තිබිණ.

"ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ ආරාධනයෙන් මම ශ්‍රී ලංකාවට පැමිණියේ ආර්ථික අර්බුදය සඳහා හරිත තිරසර විසඳුම් දිය හැකි ආකාරය පිළිබඳ සොයා බැලීමටයි. සුළං හා සූර්ය විදුලිබල ක්ෂේත්‍රවල නව ආයෝජනයන් ගෙන ඒමටත් මම බලාපොරොත්තු වෙනවා."

"මෙහි පැවති සර්ව පාක්ෂික සමුළුව ගැන විස්තර සාකච්ඡාව අවස්ථාවේ මනෝ ගනේෂන් මන්ත්‍රීවරයා මට දැනුම් දුන්නා. එය ශ්‍රී ලංකාවේ දේශපාලන ගැටලු බොහොමයකට විසඳුම් ගෙන එන වැදගත් පියවරක්. එහිදී ඉන්දීය සම්භවයක් සහිත මෙරට දෙමළ ජනතාව නැත්නම් උඩරට දෙමළ ජනතාවට සිංහල හා මුස්ලිම් ජනතාව සමඟ සාමයෙන් ජීවත්වීමට ඇති අභිලාෂයත් ඔහු පැහැදිලි කළා. ඒ වගේම ශ්‍රී ලංකාවේ දුප්පත්ම ජනකොටස් වන වතුකරයේ ජනතාවට ආහාර ආධාර සහ අනෙකුත් අත්‍යවශ්‍ය දෑ සැපයීමේ අවශ්‍යතාව මෙහිදී අවධාරණය කෙරුණා. ඉතා දුෂ්කර කාලයක් පසු කරන ශ්‍රී ලාංකික ජනතාව වෙත මගේ සහාය පළ කරනවා.

## ■ හොඳ කලක්


"ඔවුන් අතරින් සමහර පිරිස්වලට ප්‍රමාණවත් ආහාර වේලක් නොලැබෙන බවත්, දෛනික ආහාර වේල් ප්‍රමාණය අඩු කිරීමටත් සිදුව ඇති බව දැනගන්න ලැබී තිබෙනවා. මේ දුෂ්කරතාවලින් මිදෙන මඟක් පිළිබඳ සොයා ගැනීම සඳහා ජගත් ප්‍රජාව සමඟ කටයුතු කරන්න මම සූදානම්. එමෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟතාවකට පැමිණීමට ජනාධිපතිවරයා දැඩි පරිශ්‍රමයක් දරනවා. චීනය සහ ඉන්දියාව සමඟත් එලෙසමයි. මේ හරහා නැවතත් ආර්ථිකය ප්‍රකෘති කිරීමට හැකි වුවහොත් සියලු දෙනාටම මීට වඩා හොඳ කාලයක් උදා වේවි'"

විපක්ෂයේ එක් එක් මන්ත්‍රීවරුන් අතර ජනාධිපතිගේ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් විශ්වාසයක් ගොඩනැගෙමින් ඇති බව එයින්ද පැහැදිලිය. අනෙක සෝල්හයිම් වැනි කීර්තිමත් රාජතාන්ත්‍රිකයන් පවා ඒ ගැන විශ්වාසයෙන් යුතුව කටයුතු කරන බවය. සැබවින්ම ජාත්‍යන්තරයේ සහාය ගැනීමට මෙවැනි සම්බන්ධතා සහ මැදිහත් වීම් අත්‍යවශ්‍ය ය. මේවා ගැනත් දැන් දැන් ජනතාව ගැන හිතන විපක්ෂයේ මන්ත්‍රීවරුන් සිතනවා වන්නට පුළුවන.

පසුගියදා සම්මත වූ 2023 අය වැය හමුවේද දකින්නට ලැබුණේත් ඔය වැනිම තත්ත්වයක්ය. කාටත් සිදු වුණේ ජනාධිපති රනිල්ගේ ප්‍රතිපත්තිය පිළිගන්නය. 2023 අයවැයට එරෙහි වීමට තරම් පදනමක් ඔවුන්ට තිබුණේද නැත. ඒ අනුව ඡන්දය පවා විමසුණේ කාටත් පේන්න මිස ඇති වැදගැම්මකට නොවේය. එය කැමැත්තෙන් අඳින ජනයාට ඒ සඳහා අවස්ථාව පෙන්වීමට වඩා වැඩි දෙයක් නොවීය.

කොහොම නමුත් දැන් වන විට එක දෙයක් පැහැදිලිය. ඒ එක පසෙකින් ජනාධිපති රනිල් මල් වට්ටියට අතගහන කලාව විපක්ෂයටත් කියා දී හමාර බවය. අනෙක් පසින් රනිල් රාජපක්ෂ ආණ්ඩුව සහ පොදු ජනතාව ලෙස අඳිනු ලැබූ ඊනියා බෙදුම් රේඛාවත් තවදුරටත් නඩත්තු කරගත නොහැකි ලෙස මැකී යමින් ඇති බවය. දැන් ඇත්තේ තීන්දුවක් ගන්නය. ඒ ජනාධිපති රනිල් සමඟ එක්ව ගොඩ යනවාද නැත්නම් සජිත්ලා වැන්නන්ගේ දොළ සන්සිඳින්න ගොස් සාමූහිකව වැළලෙනවාද යන තීන්දුව ගන්නය. බෙහෙත කොච්චර තිත්තද යන්න වැදගත් නැත. ලෙඩේ හොඳ වෙන්න නම් බෙහෙත කොච්චර තිත්ත වුණත් බොන්න ඕනමය. මේ එහෙම කාලයක්ය.

**කුලසිරි ලියනගේ**



# ජාත්‍යන්තරය හා කටයුතු කිරීමේදී ශ්‍රී ලංකාව සියලු රටවල් සමග මිත්‍රශීලි පිළිවෙතක් අනුගමනය කළ යුතුයි

## ජනපති දියතලාවේදී කියයි

### කැඩෙට් නිලධාරීන් 351ක් අධිකාරියට









**ශිරෝමි අබයසිංහ**

දූපත් රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය සමග කටයුතු කිරීමේදී සියලු රටවල් සමග මිත්‍රශීලි පිළිවෙතක් අනුගමනය කළ යුතු බව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය.

ලෝක බලවතුන්ගේ අරගලවලදී එක් පිලකට බෙදී වෙන් නොවී, සියලු රටවල් සමග මිත්‍රශීලිව කටයුතු කිරීම තුළින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තරයේ යහපත් තලයකට ඔසවා තැබිය හැකි බව ද ජනාධිපතිවරයා පෙන්වා දුන්නේය.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මේ බව සඳහන් කළේ දියතලාව යුද හමුදා විද්‍යාපීඨයේ කැඩෙට් නිලධාරීන්ගේ 97 වැනි විසිර යාමේ පෙළපාළියට පෙරේදා (17) පෙරවරුවේ එක්වෙමිනි.

දියතලාව යුද හමුදා විද්‍යාපීඨයේ පුහුණුව නිම කළ කැඩෙට් නිලධාරීන් තුන්සිය පනස් එක් දෙනකු (351) අධිකාරියට පත් කිරීම එදින සිදු කෙරිණි.

විදේශ රාජ්‍යයන් හතරක කැඩෙට් නිලධාරීන් ද පුහුණුව ලබා අධිකාරියට පත්වීම විශේෂත්වයකි.

යුද හමුදා විද්‍යාපීඨය වෙත පැමිණි සේනාධිනායක ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ඉතා අභිමානවත් අයුරින් පිළිගැනිණි.

ප්‍රථමයෙන් එම පරිශ්‍රයේ ඇති රණවිරු ස්මාරකය වෙත ගිය ජනාධිපතිවරයා ඊට පුෂ්පෝපහාර දැක්වීය.

අනතුරුව කැඩෙට් නිලධාරීන්ගේ පෙළපාළිය පරීක්ෂා කළ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා දක්ෂතම කැඩෙට් කණ්ඩායම වෙත ශූරතා ධජය පිළිගැන්වීම හා කැඩෙට් නිලධාරීන් වෙත අසිපත පිළිගැන්වීම සිදු කළේය.

එදින අධිකාරි ලත් කැඩෙට් නිලධාරීන් සමඟ සමූහ ඡායාරූපයකට පෙනී සිටි ජනාධිපතිවරයා සිය සංචාරය සනිටුහන් කරමින් විද්‍යාපීඨ භූමියේ නා පැළයක් රෝපණය කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා, අද ඔබට ඉතා වැදගත් දිනයක්. අද ඔබ දියතලාව යුද හමුදා විද්‍යාපීඨයේ පුහුණුව අවසන් කරනවා. නමුත් එය ඔබගේ ජීවිතයේ අලුත් ආරම්භයක්. අද ඔබ සියලු දෙනාම යුද්ධ හමුදාවේ නිත්‍ය සාමාජිකයන් ලෙස සේවය ආරම්භ කරනවා.

ශ්‍රී ලංකා යුද හමුදාවේ නායකන් ලෙස අද සිට ඔබටත් වගකීමක් තිබෙනවා. යුද හමුදාව හා එහි සෙබළුන් ආරක්ෂා කිරීමේ වගකීම ඒ අනුව ඔබට පැවරෙනවා. අද ඔබට මෙම වගකීම පවරන්නේ ජනරජයක් ලෙසයි. ජනරජය සතුරාගෙන් ආරක්ෂා කිරීමේ වගකීමත් ඔබට පැවරී තිබෙනවා. සෑම විටම ඔබ පුහුණු කරන ආයතනයේ ගෞරවය සහ කීර්තිනාමය ආරක්ෂා කළ යුතුයි.

රටක් ලෙස අප ලෝක බලවතුන් සමඟ එක පිලකට වෙන් වී නෑ. ලොව බලවතුන් සමඟ අපි ගිවිසුම්ගත වී නෑ. මොකද අපි දූපත් රාජ්‍යයක්. අපි සියලු රටවල් සමඟ මිත්‍රශීලිව කටයුතු කළ යුතුයි.

මේ රට ආරක්ෂා කර ගැනීමේ වගකීම ඔබට පැවරෙනවා. අභ්‍යන්තර මෙන්ම බාහිර බලපෑම්වලින් රට ආරක්ෂා කර ගැනීමේ හැකියාව ඔබට තිබෙනවා. ඔබ ඇතුළත් වන අපගේ යුද හමුදාවට යුද අත්දැකීම් තිබෙනවා. ඒ වගේම ජාත්‍යන්තර යුද අත්දැකීම් ඔවුන් සතුයි. එක්සත් ජාතීන්ගේ හමුදාව සමඟ එක්ව මාලි රාජ්‍යයේ මෙහෙයුම්වලට අපේ ආරක්ෂා හමුදා ද සහභාගී වී සිටිනවා.

එම නිසා ඔබට අභියෝග ජය ගත හැකියි. ඉදිරියේ දී පැමිණිය හැකි කුමන හෝ අන්දමේ අභියෝග භාර ගෙන ඒවාට ශක්තිමත්ව මුහුණ දීමේ හැකියාව ඔබ සතු වෙනවා. එබැවින් එම වගකීම මා ඔබට භාර දෙන අතර, ශක්තිමත්ව ඉදිරියට කටයුතු කරන ලෙස ඔබ සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා.

ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්, ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී හා ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යේෂ්ඨ උපදේශක සාගල රත්නායක, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා, යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් වික්‍රම් ලියනගේ, දියතලාව යුද හමුදා විද්‍යාපීඨයේ සේනාවිධායක මේජර් ජෙනරාල් නියන්ගොඩ යන මහත්වරු ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

# 75 වැනි නිදහස් සැමරුමට රටට - ජනතාවට සෙත් පතා දළදා ප්‍රදර්ශනයක් පවත්වන්න

## ජනපතිගේ සංදේශය අගමැති අතින් මහා නායක හිමිවරුන්ට





**අසේල කුරුළුවංශ**

හැත්තෑපස් වැනි නිදහස් සැමරුමට සමගාමීව රටට සහ ජනතාවට සෙත් පතා ලබන වසරේ මාර්තු මාසයේදී විශේෂ දළදා ප්‍රදර්ශනයක් පවත්වන ලෙස ජනපති රනිල් වික්‍රමසිංහ මහතා මල්වතු අස්ගිරි උභය මහා විහාරීය මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ දෙනමගෙන් සහ දියවඩන නිලමේවරයාගෙන් ඉල්ලීමක් කර තිබේ.

අදාළ යෝජනාව ඇතුළත් ලිපිය අගමැති දිනේෂ් ගුණවර්ධන මහතා මහ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාට සහ දියවඩන නිලමේවරයා වෙත පෙරේදා (17) බාර දුන්නේය.

අගමැතිවරයා මල්වතු මහා විහාරයට ගොස් එම පාර්ශ්වයේ මහා නායක තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහනාහිමියන් බැහැදැක ආශිර්වාද ලබා ගැනීමෙන් පසු අදාළ ලිපිය පිළිගන්වා රටේ වත්මන් තත්ත්වය සම්බන්ධව උන්වහන්සේ සමග සුහද පිළිසඳරක යෙදුණේය.

අනතුරුව අස්ගිරි මහා විහාරයට ගිය අගමැතිවරයා එම පාර්ශ්වයේ මහා නායක වරකාගොඩ ශ්‍රී ඤාණරතන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ බැහැදැක ජනපතිවරයාගේ ලිපිය පිළිගැන්වූවේය.

අදාළ යෝජනාව කාරක සංඝ සභාව වෙත යොමු කර සාකච්ඡා කිරීමෙන් පසු ඒ සම්බන්ධ අදහස දැනුම් දෙන බව මහනාහිමිවරු අගමැතිවරයාට දැනුම් දී තිබේ.

අගමැතිවරයා පෙරේදා (17) පස්වරුවේ ශ්‍රී දළදා මාලිගාවට ගොස් දළදා සමිඳුන් වැඳ පුදා ගැනීමෙන් අනතුරුව දියවඩන නිලමේ නිලංග දැල මහතා වෙත ද දළදා ප්‍රදර්ශනයක් පැවැත්වීම සඳහා වන ජනපතිවරයාගේ යෝජනාව ඇතුළත් ලිපිය බාර දුන්නේය. අවසන් වරට දළදා ප්‍රදර්ශනයක් පවත්වා ඇත්තේ 2009 වසරේදීය.

# දක්ෂිණ අධිවේගය දෙපස කුරුඳු පැළ සිටුවයි



ප්‍රවාහන මහා මාර්ග හා ජනමාධ්‍ය අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතාගේ සංකල්පයකට ක්‍රියාත්මක කෙරෙන දක්ෂිණ අධිවේගී මාර්ගය දෙපස කුරුඳු පැළ සිටුවීමේ ව්‍යාපෘතියේ නියමු වැඩසටහනක් බෙලිඅත්ත අන්තර් හුවමාරුව ආශ්‍රිතව ආරම්භ කෙරිණි.

අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතාගේ ඉල්ලීම පරිදි මෙම ව්‍යාපෘතියට අදාළ සියලුම කුරුඳු පැළ වැවිලි කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතා සම්පූර්ණයෙන්ම නොමිලේ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පරිත්‍යාග කර ඇත.

බෙලිඅත්ත අන්තර් හුවමාරු පරිශ්‍රය ආශ්‍රිතව සිදු කෙරුණු පැළ සිටුවීමේ නියමු ව්‍යාපෘතියට ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයේ සහ



මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ පිරිසක් එක්ව සිටියහ.

### හිටපු උපකුලපතිට පහර දීම

# වැඩිදුර විමර්ශන CIDයට

**ගයාන් කුමාර වීරසිංහ**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපතිවරයාට සහ ඔහුගේ පුතාට පහර දීමේ සිද්ධියේ වැඩිදුර විමර්ශන පොලිස්පති නියමයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී තිබේ. මේ සම්බන්ධව පේරාදෙණිය පොලිසිය කරන විමර්ශන සම්බන්ධයෙන් සෑහීමකට පත් විය නොහැකි බවට එල්ල වන චෝදනා හේතුවෙන් මේ තීරණය ගෙන තිබේ.

හිටපු උපකුලපති ජ්‍යේෂ්ඨ මහාචාර්ය අතුල සේනාරත්න මහතා ද පේරාදෙණිය පොලිසියේ ක්‍රියාකාරීත්වය ගැන පවා මාධ්‍ය හමුවක් පවත්වමින් චෝදනාවක් එල්ල කර තිබුණි.

මෙම පහර දීම සම්බන්ධයෙන් සිසුන් 12 දෙනකු පේරාදෙණිය පොලිසිය අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු හඳුනා ගැනීමේ පෙරට්ටුවකට ඉදිරිපත් කරන තුරු රක්ෂිත බන්ධනාගාරගත කරන ලදි.

විශ්වවවිද්‍යාල සිසුන්ගේ පාර්ශ්වයෙන් ඒ සම්බන්ධයෙන් පොලිසියට එරෙහිව චෝදනාවක් එල්ල වන්නේ එදා එම සිදුවීමට කිසිදු සම්බන්ධයක් නොමැති සිසුවෙක් පවා පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර ඇති බවටය. නිසි විමර්ශනයකින් තොරව අත්අඩංගුවට ගැනීමක් කර ඇති බවට සිසුහු චෝදනා කරති.

ඒ සියල්ල කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් පොලිස්පතිවරයා විසින් මෙම විමර්ශනය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙනු ලැබුවේ පෙරේදා (17)ය.

විශ්වවිද්‍යාල ආශ්‍රිත සිදුවීම් සහ නවක වද සිදුවීම් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙනම ඒකකයක්ද මේ වන විට ක්‍රියාත්මකය.

# මැතිවරණයට නව සන්ධානයකින් එනවා

## ඇමැති ප්‍රසන්න රණතුංග

**උපාලි කරුණාරත්න**



නව සන්ධානයකින් එළැඹෙන මැතිවරණයට ඉදිරිපත් වන බවත් ඒ සඳහා පක්ෂ 8ක් සමග දැනටමත් සාකච්ඡා කරමින් සිටින බවත් අදාළ ලකුණ ඉදිරියේදී තීරණය කරන බවත් නාගරික සංවර්ධන හා නිවාස ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පැවසීය.

පළාත් පාලන මැතිවරණයකින් රටේ ආර්ථික ප්‍රශ්න විසඳිය නොහැකි බවත් මේ මොහොතේ ඡන්දයක් ඉල්ලන්නේ දේශපාලන උවමනාවට මිස මැතිවරණයක අවශ්‍යතාවකට නොවන බවත් කී ඇමැතිවරයා, රජය ඕනෑම මොහොතක මැතිවරණයකට මුහුණ දීමට සූදානම් බවත් කීවේය.

නාගරික සංවර්ධන හා නිවාස ඇමැති ප්‍රසන්න රණතුංග මහතා එම අදහස් පළ කළේ ගම්පහ, උඩුගම්පොළ දී පෙරේදා (17) පැවැති උත්සවයකින් අනතුරුව මාධ්‍යවේදීන් නැඟූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමිනි.

'පසුගිය කාලයේදී සිදූ වූ දේවල් නිවැරැදි වීම ප්‍රමාද වෙනව නම් පළාත් පාලන මැතිවරණය පැරණි ක්‍රමයට හෝ පැවැත්විය යුතු බව මම පෞද්ගලිකව විශ්වාස කරනවා.

මැතිවරණයේ ජයග්‍රහණය තීරණය කිරීමේ බලය ජනතාවට ලබා දිය යුතුයි. ජ.වි.පෙ. ඇතුළු සමහර පක්ෂ හැමදාම කළේ කයිවාරු ගහන එක විතරයි. වැඩක් කළේ නෑ. සාමකාමී අරගලය සමහර පිරිස් හයිජැක් කළා. ඒකෙ හිටියේ කුඩු කාරයොයි, ගංජා කාරයොයි, ගණිකාවොයි. ඒ බව අරගලයේ හිටපු අයම කියනවා. රට තුළ සාමකාමීව ජීවත් වීම, ලබන වැටුපට සරිලන ආර්ථිකයක් රට තුළ ඇති කිරීම වගේ දේවල් මිස නැවත අරගලයක් මිනිස්සු බලාපොරොත්තු වන්නේ නැහැ.

අපි බලන්න ඕන මේ අර්බුදයෙන් ගොඩ එන්න. අද රටට සංචාරකයන් එනවා. සංචාරකයන් එනකොට විදෙස් සංචිත වැඩි වෙනවා. මේ අර්බුදයට එකතු වෙලා මුහුණ දෙන්න ඕන. වෙන්ව කටයුතු කිරීමෙන් රටට වාසියක් අත් වෙන්නේ නෑ.' යැයි ද ඇමැතිවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

# 17 හැවිරිදි හිමිනමට විහාර පරිශ්‍රයේදී බලෙන් වස පොවලා

**අසේල කුරුළුවංශ**

මල්වතු මහා විහාර පාර්ශ්වයට අයත් හිඳගල රජමහා විහාරයේ වැඩ වාසය කරන 17 හැවිරිදි හිමිනමකට විහාර පරිශ්‍රයේ දී බලහත්කාරයෙන් වස පොවා පැරසිටමෝල් පෙති දෙකක් ගිල්ලවීමෙන් බරපතළ තත්ත්වයට පත්ව සිටියදී ප්‍රතිකාර සඳහා පේරාදෙණිය ශික්ෂණ රෝහලට ඊයේ (18) පෙරවරුවේ ඇතුළත් කර තිබේ.

ඊයේ (18) පෙරවරු 10.30ට පමණ මෙය සිදු වී ඇති අතර, මෙසේ අසාධ්‍ය තත්ත්වයෙන් රෝහල් ගත කර ඇත්තේ අත්තරගම ධම්මරතන නම් හිමිනමකි.

විහාර භූමියට දින කිහිපයක් තිස්සේ පැමිණි නාඳුනන පුද්ගලයෙකු හිමිනමට මෙම වස පෙවීම සිදු කර තිබෙන බව හිඳගල රජමහා විහාරාධිවාසී ඇඹිල්මීගම පඤ්ඤාකිත්ති හිමියෝ පවසති.

වස බෝතලයක් අතැතිව විහාර භූමියේ රැඳී සිටි එම පුද්ගලයා එය පානය කරන බව ප්‍රකාශ කිරීමත් සමඟ මෙම හිමිනම විහාර භූමියේ එවැන්නක් නොකරන ලෙස දැනුම් දී ඔහුට එම ස්ථානයෙන් ඉවත්ව යන ලෙස දැනුම් දුන් අවස්ථාවේ ඔහු හිමිනමගේ ගෙලට පිහියක් තබා වස බෝතලය බලහත්කාරයෙන් පොවා තිබෙන බව දැනට සිදු කර තිබෙන පරීක්ෂණ මඟින් අනාවරණය වී තිබේ.

වස තිබූ බෝතලය රෝහලට බාර දීමට විහාරවාසී හිමිවරු පියවර ගෙන ඇත. බලහත්කාරයෙන් වස පෙවීමට ගිය අවස්ථාවේ හිමිනමගේ මුහුණ ප්‍රදේශයට තුවාල සිදුව තිබේ. රෝහල් ගත කරන අවස්ථාවේ හිමිනම සිහිසුන්ව පසු වූ බව ද දැන ගන්නට ඇත.

මේ සම්බන්ධයෙන් අදහස් දැක් වූ ඇඹිල්මීගම පඤ්ඤාකිත්ති හිමියෝ මෙසේ පැවසූහ. විහාර භූමියට දින තුනක පමණ කාලයක් තිස්සේ නාඳුනන පුද්ගලයෙක් පැමිණ තිබෙනවා. ඔහු ඊයේ (18) පෙරවරුවේ විහාරස්ථානය පහළ නුග ගස අසල සිටිනු දහම් පාසලේ උගන්වමින් සිටි ධම්මරතන හිමි දැක ඒ බව මට දැනුම් දුන්නා. මම ගිහින් කවුද කියලා බලන්න ද කියලා මගෙන් ඇහුවා. ගියාට කමක් නැහැ මොනවා හරි ප්‍රශ්නයක් නම් සෝභිත පොඩි හාමුදුරුවෝ දැනුම්වත් කරන්න කියලා මම උපදෙස් දුන්නා. පසුව මම දළදා මාලිගාවට ගියා. එතන දී සෝභිත හිමි දුරකතනයෙන් කතා කරලා කිව්වා පොඩි හාමුදුරුවන්ට වස පොවලා හොඳටම අමාරුයි කියලා.

නුග ගස අසල සිටි පුද්ගලයාට ඉවත්ව යන ලෙස දැනුම් දුන් අවස්ථාවේ ඔහු හාමුදුරුවන් පස්සෙන් පන්නාගෙන ඇවිත් ගෙලට පිහියක් තියලා වස බෝතලය පොවා තිබෙන බව තමයි දැන ගන්න තිබෙන්නේ. අතේ තිබුණු පැරසිටමෝල් කාඩ් පතක් ගෙන එයින් පෙති දෙකක් ද ඔහු පොඩි හාමුදුරුවන්ට පොවා තිබෙනවා. පේරාදෙණිය ශික්ෂණ රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකයේ උන්වහන්සේ මේ වන විට ප්‍රතිකාර ලබමින් ඉන්නවා.

සිද්ධිය සම්බන්ධයෙන් පඤ්ඤාකිත්ති හිමියන් පේරාදෙණිය පොලිසියට පැමිණිල්ලක් කර තිබේ. සිද්ධියට සම්බන්ධ පුද්ගලයා මෙතෙක් අත්අඩංගුවට ගෙන නොමැති අතර, පොලිසිය අදාළ ප්‍රදේශයේ පුද්ගලයින් කිහිප දෙනෙකුගෙන්ම ප්‍රකාශ ලබා ගෙන ඇත.

# පොලිස් පොඩ්ඩා ලොක්කගෙ මූණට ගහලා

**ගයාන් කුමාර වීරසිංහ**

හලාවත කොට්ඨාස අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ සැරයන්වරයකු ස්ථාන මාරුවක් සඳහා වූ අභියාචනයකට නිර්දේශයක් ගැනීමට පැමිණි අවස්ථාවේ බහින්බස් වීමක් දුර දිග යාම නිසා සැරයන්වරයා විසින් පරීක්ෂණාගාර ස්ථානාධිපතිවරයාගේ මුහුණට පහර දී තිබේ.

එම අභියාචනයට නිර්දේශයක් ගැනීමට සැරයන්වරයා පෙරේදා ස්ථානාධිපතිවරයා හමු වී ඇති අතර එහිදී දෙදෙනා අතර ඇති වූ බහින්බස් වීමක් දුරදිග ගොස් කර ඇති මේ පහර දීම සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර ඇතැයි නාත්තණ්ඩිය සහකාර පොලිස් අධිකාරී කාර්යාලයේ තොරතුරු සඳහන් කරයි.

එහිදී පොලිස් සැරයන්වරයාව ස්ථානාධිපතිවරයා විසින් තල්ලු කර ඇති බවත් දෙදෙනාම එකිනෙකාට එරෙහිව පොලිසියට පැමිණිලි ඉදිරිපත් කර ඇති බවත් සහකාර පොලිස් අධිකාරී කාර්යාලය සඳහන් කරයි. මෙම නිලධාරීන් දෙදෙනා සම්බන්ධයෙන් නාත්තණ්ඩිය සහකාර පොලිස් අධිකාරීවරයා විසින් විමර්ශනයක් මේ වන විට ආරම්භ කර තිබේ.

හලාවත අපරාධ ස්ථාන පරීක්ෂණාගාරය ස්ථාපිත කර ඇත්තේ නාත්තණ්ඩිය සහකාර පොලිස් අධිකාරී කාර්යාල සංකීර්ණයේය.

# 1 වැනි පිටුවෙන්...

## පාසල් සිසුන්ට...

පාසල් සිසුන්ට මත්ද්‍රව්‍ය අලෙවි කරන බවට බුද්ධි අංශවලින් ලද තොරතුරුවල සඳහන් පුද්ගලයන් පිරිසක් මෙසේ අත්අඩංගුවට ගෙන ඇති බවද නිහාල් තල්දූව මහතා පැවසීය.

මෙහිදී අයිස් මත්ද්‍රව්‍ය මිලිග්‍රෑම් 1522ක්, හෙරොයින් මිලිග්‍රෑම් 9578ක්, විවිධ මත්පෙති වර්ග 10ක්, ගංජා මිලිග්‍රෑම් 19,045ක්, ගංජා මිශ්‍ර මාවා නමැති විට කිලෝ 02ක්, සහ වෙනත් මත්ද්‍රව්‍ය වර්ග 11ක් මෙහිදී පොලිසිය මෙම සැකකරුවන් සතුව තිබී සොයාගෙන තිබේ.

මෙම පරීක්ෂාවට පාසල් අවට වෙළඳාම් කරන වෙළඳ සැල්, ආහාර ද්‍රව්‍ය හා වෙනත් ද්‍රව්‍ය අලෙවි කරන පුද්ගලයන් ලක්වී ඇත. එහිදී වෙළඳ සැල් 491ක් පරීක්ෂාවට ලක්ව ඇති බව නිහාල් තල්දූව මහතා කීය.

බස්නාහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ උපදෙසින් මෙම මෙහෙයුම ක්‍රියාත්මක වී තිබේ. ඉදිරියටත් මෙවැනි මෙහෙයුම් සිදු කරන බව පොලිසිය කියයි. මෙවැනි මෙහෙයුම් දිවයිනේ සෙසු පළාත්වල පාසල් ආශ්‍රිතව ද සිදුවන බව ද නිහාල් තල්දූව මහතා කීය.

විදුහල්පතිවරු මගින් පොලිසියේ ස්ථානාධිපතිවරයාට පාසල් තුළ කෙරන පරීක්ෂා කිරීම්වලට සහාය ඉල්ලා සිටියහොත් පොලිසියට සහාය දීමට හැකි බවද නිහාල් තල්දූව මහතා සඳහන් කළේය.

මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් තොරතුරු වෙතොත් 118, 119 යන දුරකතන අංක වෙතත් මහා පරිමාණයේ මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධයෙන් 1997 දුරකතන අංකයටත් තොරතුරු දෙන ලෙස නිහාල් තල්දූව මහතා මහජනතාවගෙන් ඉල්ලීමක් ද කරයි.

මේ අතර පාසල් ළමයින් ඉලක්ක කර මත්පෙති අලෙවි කරමින් සිටි මහනුවර ප්‍රධාන පෙළේ පාසලක උසස් පෙළ සිසුවකු හා තවත් අයකු කඩුගන්නාව හේනාවල ප්‍රදේශයේ දී පොලිසිය අත්අඩංගුවට ගෙන තිබේ.

සැකකරුවන් සතුව තිබී රුපියල් 45,000ක වටිනාකමින් යුත් මත්පෙති 288ක් පොලිසිය සොයා ගෙන ඇත. මත්පෙති අලෙවි කිරීමෙන් උපයා ගත් රුපියල් 15,680ක මුදලක් ද සැකකරුවන් සතුව තිබුණු බව පොලිසිය පවසයි. අයිස් මත්ද්‍රව්‍ය භාවිත කිරීමට උපයෝගි කර ගන්නා උපකරණ කට්ටලයක් ද සැකකරුවන් සතුව තිබී පොලිස් භාරයට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් එක් සැකකරුවකු මහනුවර ප්‍රධාන පෙළේ පාසලක උසස් පෙළ හදාරන බවත් විසි හැවිරිදි අනෙක් තරුණයා මෑතක පාසල හැරගිය අයකු බවත් පොලිස් පරීක්ෂණ මගින් අනාවරණය වී ඇත.

පොලිස් විශේෂ කාර්යාංශයේ පොලිස් කොස්තාපල් 93443 කෝනාර නිලධාරියාට ලැබුණු තොරතුරක් මත කඩුගන්නාව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක රෝහණ කරුණාරත්න මහතාගේ උපදෙස් මත කඩුගන්නාව පොලිසියේ වැටලීම් අංශයේ පොලිස් සැරයන්වරුන් වන 32426 කරුණාරත්න, 18817 අමරසිංහ, පොලිස් කොස්තාපල් 81297 ජයවර්ධන යන නිලධාරීන් මෙම වැටලීම සිදු කර තිබේ.

## රාජකාරිය පැහැර...

රථවාහන අංශ ස්ථානාධිපතිවරයා නිසි ලෙස රාජකාරි ඉටු නොකිරීම නිසා අටමස්ථානාධිපති නාහිමියන් ප්‍රමුඛ මහා සංඝරත්නය මහනුවරට වැඩම කළ පසුගිය 06 වැනි දින මාර්ග තදබදයක් ඇති වූ බැවින් උන්වහන්සේ ඇතුළු මහා සංඝරත්නයට නියමිත වේලාවට හීල්දානය ගැනීමට නොහැකි වූ බව මධ්‍යම පළාත් නියෝජ්‍ය පොලිස්පති මහින්ද දිසානායක මහතා මධ්‍යම පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත ලිපියක් යොමු කරමින් දැනුම් දී ඇත.

ප්‍රධාන පොලිස් පරීක්ෂක සුගතදාස මහතා කළ රාජකාරි පැහැර හැරීමක් සම්බන්ධයෙන් පසුගිය 03 වැනි දින ද නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සංජීව ධර්මරත්න මහතාව දැනුම්වත් කර තිබේ.

අදාළ නිලධාරියා මහනුවර රථ වාහන අංශයේ ස්ථානාධිපති ලෙස හෝ කොට්ඨාසයේ රැඳී සිටීමෙන් විනය පවත්වා ගැනීමට නොහැකි බැවින් ඔහු කොට්ඨාසයෙන් පිටතට මාරු කිරීම සුදුසු බව මහින්ද දිසානායක මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වෙත යොමු කළ ලිපියේ සඳහන් කර ඇත.

අටමස්ථානාධිපති හිමි ප්‍රමුඛ මහා සංඝරත්නය ගමන් ගත් වාහනය මාර්ග තදබදයට අසුවූ අවස්ථාවේ එම රථ පෙළ සමග මධ්‍යම පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාත් ගමන් ගෙන තිබෙන අතර රථ වාහන අංශ ස්ථානාධිපතිවරයා කළ රාජකාරි පැහැර හැරීම සම්බන්ධයෙන් නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ උපදෙස් මත මහනුවර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා පරීක්ෂණයක් සිදු කර තිබේ.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා විසින් දුන් වාර්තාවේ ඇති නිරීක්ෂණ හා නිර්දේශ පදනම් කර ගනිමින් රථවාහන අංශයේ ස්ථානාධිපතිවරයා කොට්ඨාසයෙන් පිටතට මාරු කිරීම සුදුසු බව නිර්දේශ කරමින් නියෝජ්‍ය පොලිස්පති මහින්ද දිසානායක මහතා අදාළ ලිපිය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත යොමු කර ඇත.

## අමෙරිකානු ධනවතුන්...

අමෙරිකාවේ ධනවත්ම සංචාරකයන් 108 දෙනකු රැගත් 'ඕෂන් ඔඩිසි' නෞකාව ඊයේ (18) දින දහවල් කොළඹ වරායට සේන්දු විය.

අමෙරිකානු සමාගමකට අයත් මෙම නෞකාව දිගින් මීටර් 105ක් හා පළලින් මීටර් 18.5ක් වේ. ඉන්දියාවේ කොචින් වරායේ සිට කොළඹ වරායට පැමිණි මෙම නෞකාව දෙසැම්බර් 19 දින ත්‍රිකුණාමලය වරාය දක්වා යාත්‍රා කිරීමට නියමිතය.

මෙම නෞකාවේ පැමිණි සංචාරකයින් කොළඹ වරායෙන් බැස දින දෙකහමාරක් පමණ කොළඹ, කුරුණෑගල, හබරණ, සීගිරිය සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල සුඛෝපභෝගී බස් රථ මගින් සංචාරය කර අනිද්දා (21) දින ත්‍රිකුණාමලය වරායෙන් නැවත නැගීමට නියමිත බව "ඩෙව් මරයින්" නාවික ඒජන්ත සමාගම අවධාරණය කරයි.

ඉන්පසු මෙම "ඕෂන් ඔඩිසි" නෞකාව එදින රාත්‍රී 7.00ට ත්‍රිකුණාමලය වරායේ සිට තායිලන්තය දක්වා යාත්‍රා කිරීමට නියමිතය.

මෙම "ඕෂන් ඔඩිසි" නෞකාව ප්‍රථම වරට කොළඹ වරායට පැමිණීම සනිටුහන් කරමින් චාරිත්‍රානුකූල සමරු ඵලක හුවමාරු කර ගැනීම වරාය නාවික හා ගුවන් සේවා ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා සහ නෞකාවේ කපිතාන්වරයා අතර සිදු විය.

මෙම අවස්ථාවට වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ නිලධාරීන්, වරාය අධිකාරියේ සහ නාවික ඒජන්ත සමාගමේ නිලධාරීහු පිරිසක් සහභාගි වූහ.

## අනියත බියක් එපා...

නිලධාරීන් 300ක දෙනකුගෙන් පමණ සමන්විත ආරක්ෂක ඒකකයක් විශ්වවිද්‍යාලය සතු බවත් ඔවුන් සියලු දෙනා හා එක්ව පාලනාධිකාරිය අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවලත් සිසුන්ගේත් ආරක්ෂාව වෙනුවෙන් පොදු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙන බවත් ඒ මහතා කීය.

එක් එක් ආචාර්යවරයාට වෙන් වෙන්ව ආරක්ෂක නිලධාරීන් ලබා දිය නොහැකි බවත් විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක පොදු ආරක්ෂක වැඩපිළිවෙළ තුළ සියලු දෙනාගේ ආරක්ෂාව තහවුරු වන බවත් හෙතෙම අවධාරණය කළේය.

හිටපු උපකුලපතිවරයාගේ නිල නිවෙසට ප්‍රහාරයක් එල්ල වීම අහඹු සිදුවීමක් බවත් එය පදනම් කර ගනිමින් විශ්වවිද්‍යාලයේ ආරක්ෂාවක් නැතැයි කවුරුන් හෝ චෝදනා කරන්නේ නම් එය පිළිගත නොහැකි බවත් මදුජිත් මහතා පැවසුවේය.

විශ්වවිද්‍යාලයේ නිල නිවාස 412ක් තිබෙන බවත් පීඨ 09ට අයත් ගොඩනැගිලි හයසීයකට අධික සංඛ්‍යාවක් තිබෙන බවත් කී මහාචාර්යවරයා සියලු නිල නිවාසවලට ආරක්ෂක නිලධාරීන් යෙදවීමේ හැකියාවක් ප්‍රායෝගිකව නොමැති බවද අවධාරණය කළේය.

## ණය සහන...

පුද්ගලික අංශයේ ණය හිමියන් ඇතුළු විවිධ පාර්ශ්වකරුවන් ඇතුළත් වන ගෝලීය ස්වෛරී ණය "වටමේසයක්" පිහිටුවීමට චීන නිලධාරීන් එකඟ වී ඇති බවත් ඇය පවසා තිබේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පසුගිය බ්‍රහස්පතින්දා පවත්වන ලද උත්සවයකට සහභාගි වෙමින් ඇය මේ බව කියා ඇති බව ද විදෙස් පුවත් වාර්තා කර ඇත.

පසුගිය සතියේ පැවැත්වූ චීන බලධාරීන් සමග ඉහළ මට්ටමේ රැස්වීම්වලින් පසු අඩු හා මධ්‍යම ආදායම් ලබන රටවල් මුහුණ දෙන ප්‍රධාන ණය ගැටලු සමග කටයුතු කිරීමේ අපේක්ෂාවන් පිළිබඳව තමාට තරමක් ශුභවාදී හැඟීමක් ඇති වූ බවත් ජෝර්ජීවා මහත්මිය මෙහිදී කියා තිබේ.

ණය ගැටලු සම්බන්ධයෙන් වඩාත් ක්‍රමානුකූලව මැදිහත් වීමට වේදිකාවක් සඳහා අවකාශයක් ඇති බවත් චීනයට ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කළ හැකි බවත් සඳහන් කර තිබේ.

පොදු රාමුව යටතේ ණය ප්‍රතිකාර කඩිනම් කිරීම සහ මධ්‍යම ආදායම් ලබන රාජ්‍යයන් ඇතුළත් කිරීම සඳහා එය පුළුල් කිරීම සඳහා ප්‍රතිසංස්කරණ සඳහා නැවත නැවතත් කරන ලද ඉල්ලීම්වලින් පසුව ඇයගේ රැස්වීම් අතරතුර ණය ගැටලුව සම්බන්ධයෙන් චීන නායකයින් සමග "ඉතා නිර්මාණාත්මක මැදිහත් වීමක්" ඇති බවත් කියා ඇත.

එක්සත් ජනපද භාණ්ඩාගාර ලේකම් ජැනට් යෙලන් සහ අනෙකුත් බටහිර නිලධාරීන් G-20 රාමුව යටතේ සහන සැලසීමේදී, දැන් ලෝකයේ විශාලතම ස්වෛරී ණයහිමියා වන චීනය විසින් පාගා දැමීමක් ලෙස ඔවුන් දකින දෙය ගැන වැඩි කලකිරීමක් ප්‍රකාශ කර ඇත.

චීනයේ පැවති සාකච්ඡාවලින් යම් ප්‍රගතියක් ඇති වූ බව ජෝර්ජීවා පැවසීය.

ලෝක බැංකුව, IMF සහ G-20 සභාපතිත්වය සම කැඳවුම්කරුවන් වන ප්‍රධාන ණය හිමියන්, සමහර ණය ගැතියන්, පුද්ගලික අංශය - ඉහළම මට්ටමේ ගෝලීය ස්වෛරී ණය වටමේසයක් සකස් කළ යුතු බවට එකඟ වූ බවත් කියා ඇත.

යෝජිත වටමේස මගින් ණය ප්‍රතිකාර ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට සහ පද්ධතිමය ණය අර්බුදයක් වළක්වා ගැනීමට ව්‍යුහයක් ඉදිරිපත් කරන බවද කියා තිබේ.

ජෝර්ජීවා, ලෝක බැංකු සභාපති ඩේවිඩ් මැල්පාස් සහ අනෙකුත් මූල්‍ය නායකයින් පසුගිය සතියේ චීනයේ අන්හුයි පළාතේ දී චීන මහජන බැංකුවේ, චීනයේ මුදල් අමාත්‍යාංශයේ සහ එහි එක්සිම් බැංකුවේ සහ චීන සංවර්ධන බැංකුවේ නිලධාරීන් හමුවිය.

## ඕඅයිසීට නිකන් අරක්කු...

කොහුවල පොලිසියේ අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයාට නොමිලයේ අරක්කු බෝතලයක් නොදීම නිසා උරණ වූ මත්කුඩු ලෝලියෙක් අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා සමග පැමිණ කොහුවල පිහිටි මත්පැන් අලෙවි ස්ථානයක හිමිකරුට පිහියෙන් ඇන තුවාල කිරීමක් සම්බන්ධයෙන් ගල්කිස්ස කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මංගල දෙහිදෙණිය මහතාගේ උපදෙසින් විශේෂ පරීක්ෂණයක් ආරම්භ කර තිබේ.

සහකාර පොලිස් අධිකාරී පුෂ්පකුමාර මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මෙම විමර්ශනයේදී හෙළි වී ඇත්තේ මෙම සිදුවීම ඉහළ පොලිස් නිලධාරීන්ට පවා වසන් කිරීමට කොහුවල පොලිසියේ නිලධාරීන් පියවර ගෙන ඇති බවය. මෙම පිහි ඇනුම සිදුව ඇත්තේ පසුගිය 16 වෙනිදා රාත්‍රී කාලයේදීය. කොහුවල පොලිසියේ නිතර ගැවසෙමින් පොලිස් නිලධාරින්ට කඩේ යමින් විවිධ අවශ්‍යතා කර දෙන මත්කුඩු භාවිතයට ඇබ්බැහි වී සිටින ෆොන්සේකා නමැති පුද්ගලයෙක් එදින රාත්‍රී කාලයේ කොහුවල 120 බස් මාර්ගයට යාබදව පිහිටි මත්පැන් අලෙවි ස්ථානයට පැමිණ අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා විසින් ඉල්ලාගෙන එන ලෙස කීවා යැයි කියා මත්පැන් බෝතලයක් ඉල්ලා තිබේ.

මත්පැන් හලේ දෛනික ආදායම් මුදල් රැගෙන යාමට එම මත්පැන් හලේ හිමිකරු වන රංජිත් දයාලාල් එම අවස්ථාවේදී එහි පැමිණ සිට ඇති අතර, ඔහු පවසා ඇත්තේ මුදල් නොදී මත්පැන් ලබා දීමට නොහැකි බවය.

එහිදී එම මත්කුඩු ලෝලියා හිමිකරු සමග බහින්බස් වීමකින් පසු එම ස්ථානයෙන් පිටව ගොස් ඇත්තේ අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයාව රැගෙන එන බව සඳහන් කරමිනි.

ඊට විනාඩි 15කට පමණ පසු පොලිස් ස්ථානාධිපතිවරයා සිවිල් ඇඳුමකින් සැරසී සිය මත්පැන් හල වෙත යතුරුපැදියක නැගී පැමිණි බව රංජිත් දයාලාල් මහතා පවසයි. ඒ පැමිණි අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා "ඇයි උඹට අරක්කු බෝතලයක් පොලිසියට දෙන්න බැරි" යැයි කී බවත් එම අවස්ථාවේදී පෙර පැමිණි පුද්ගලයා ද එතැනට පාගමනින් පැමිණි බවත්ය.

අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා සමග තමා රැඳී සිටි ස්ථානයට ඔහු පැමිණ "අරක්කු බෝතලේ දීපන්" යැයි පැවසූ බවත් මුදල් නොදී මත්පැන් ලබා දීමට නොහැකි බව පැවසීමත් සමග එම පුද්ගලයා තමාට එකවරම පිහියකින් ඇන තුවාල කළ බවත් රංජිත් දයාලාල් පවසයි. මෙම සිදුවීමෙන් පසු කලබල වූ අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා අදාළ පුද්ගලයා සමග යතුරුපැදියේ නැග එම ස්ථානයෙන් පලා ගොස් ඇත්තේ පිහි ඇනුමට ලක්වූ පුද්ගලයා ගැන කිසිවක් සොයා බැලීමකින් ද තොරවය.

මෙහිදී තමාව රෝහල්ගත කරනු ලැබුවේ සිය මත්පැන් හලේ කළමනාකරු විසින් බව ඔහු පවසයි.

මත්පැන් හලේ හිමිකරු රංජිත් දයාලාල් ඊයේ වන විටත් රෝහල්ගතව ප්‍රතිකාර ලබමින් සිට ඇත. ගල්කිස්ස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මංගල දෙහිදෙණිය මහතා සඳහන් කරනු ලැබුවේ මේ ගැන තමාගෙන් ජනමාධ්‍ය විමසන තුරු මෙවැනි සිදුවීමක් වී ඇති බව කොහුවල පොලිසියේ නිලධාරීන් විසින් තමාව දැනුම්වත් කර නොතිබුණු බවය. මේ ගැන කරුණු සොයා බැලීමේදී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාට අනාවරණය වී ඇත්තේ සාමාන්‍ය සිදුවීමක් ලෙස මෙය වාර්තා කර පිහියෙන් ඇනීන ලද පුද්ගලයාව අත්අඩංගුවට ගැනීමට පමණක් අපරාධ අංශයේ නිලධාරීන් පියවර ගෙන ඇති බවය.

මෙම පිහි ඇනුම මෙන්ම අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා එම ස්ථානයට පැමිණීම ඇතුළු සියලුම සිදුවීම මත්පැන් හලේ ආරක්ෂක කැමරාවල සටහන්ව ඇති බවත් ඒ ඔස්සේ කරනු ලබන විමර්ශනයෙන් පසුව අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයාගේ වැඩ තහනම් කිරීමට පියවර ගන්නා බවත් මංගල දෙහිදෙණිය මහතා පැවසීය. මෙම සිදුවීම වී ඇත්තේ කොහුවල පොලිසියේ මාසික පරීක්ෂණය පැවැත්වීමට පෙර දිනයේ බව පොලිස් තොරතුරු අනාවරණය කළේය. මෙදින රාත්‍රියේ පොලිස් නිලධාරීන් රැසක් පොලිස් ස්ථානයේ රැඳී සිටිමින් පසුදින සිදු කරන සහකාර පොලිස් අධිකාරීවරයාගේ පරීක්ෂණයට සූදානම් වෙමින් සිට ඇත. මෙම සිදුවීම වී ඇත්තේ ඒ අතර තුරදී වීම විශේෂිතය.

## සැමියාගෙන් ලක්ෂ 50ක...

මෙම කාන්තාවගේ සැමියා විශ්‍රාමික මේජර්වරයෙකි. දරුවන් තිදෙනෙකුගේ මවක් වන ඇගේ වැඩිමහල් පුතා ද යුද හමුදාවේ සේවය කරයි. දෙවැන්නා දියණියකි. ඇය කුරුණෑගල පොලිසියේ සේවය කරන සිවිල් කාර්ය මණ්ඩල සාමාජිකාවකි. බාලයා යුද හමුදාවේ සේවය කර ඉන් ඉවත්ව විදෙස්ගත වීමේ අපේක්ෂාවෙන් සිටින්නෙකි.

ආණමඩුවේ තෙන්නංකුරියාවේ පදිංචිකාරියක් වන 51 වියැති ඇය පසුගිය 15 වෙනිදා උදෑසනම නිවසින් පිටත්ව ගොස් ඇත්තේ වාරියපොළ හංගමුවන පදිංචිව සිටින සිය දියණියගේ දරුවා බලන්නට යනවා යැයි කියාය. ඒ ගොස් සවස ඇය නැවත පැමිණෙන විට සිය සැමියාට දුරකතන ඇමතුමක් දෙමින් පවසා ඇත්තේ ආණමඩුවට කිට්ටු කර දුරකතන ඇමතුමක් දුන් විට බාල පුතාව තමාව රැගෙන යාමට ආණමඩුව නගරයට එවන ලෙසය. ඒ අනුව ඇය 5.10ට පමණ ඇමතුමක් දෙමින් පවසා ඇත්තේ තමා ආණමඩුව නගරයට පැමිණ සිටින බැවින් රැගෙන යාමට පැමිණෙන ලෙසය. ඒ අනුව ඇයව රැගෙන යාමට පැමිණ ඇත්තේ බාල පුතාය. ඒ ඇවිත් පරීක්ෂා කර බැලීමේදී මව සිට නැති අතර මවගේ ජංගම දුරකතනය ද තිබී ඇත්තේ ක්‍රියා විරහිත කරය. ඒ ගැන සැකයක් ඇති වූ බැවින් ඔහු සිය පියාට මේ ගැන කියා ආණමඩුව පොලිසියට ද ගොස් පැමිණිල්ලක් කර නිවසට ගොස් තිබේ. එදින රාත්‍රියේදී ඇගේ දුරකතනයෙන් බාල පුතාට දුරකතන ඇමතුමක් ලැබෙන්නේ තමා ආණමඩුව නගරයේ රැඳී සිටියදී වෑන් රථයකින් පැමිණි සිවු දෙනෙක් තමාගේ මුහුණට ලේන්සුවක් වැනි යමක් ඇල්ලූ බවත් සිහිය එන විට තමා සිටියේ නිවසක කාමරයක් තුළ බවත්ය. තමාව නිදහස් කිරීමට නම් රුපියල් ලක්ෂ 50ක් ඉල්ලා සිටින බව ද ඇය කියා සිටියාය. එහිදී ඇය සිය පුතාගෙන් බැගෑපත් වෙමින් ඉල්ලා ඇත්තේ කප්පම් මුදල ගෙවා තමාව නිදහස් කර ගන්නා ලෙසය. එම මුදල තමාගේ බැංකු ගිණුමට දමන ලෙසත් බැංකු පාස් පොත තමාගේ අතේ තිබෙන බවත් ඇය පවසා ඇත. තවත් වරෙක ඇය දුරකතන ඇමතුමක් දෙමින් පවසා ඇත්තේ ඉඩමක් විකුණා හෝ මුදල් ලබා ගෙන තමාව බේරා ගන්නා ලෙසත් එසේ නොමැති වුවහොත් තමාව මරා දැමීමට මේ පිරිස සූදානම් වන බවත්ය.

මේ ගැන බාල පුතා සිය පියාට පැවසීමෙන් පසු ඔහු පොලිසියට පැමිණ දැනුම් දීමක් ද කර තිබේ. දිගින් දිගටම ඇමතුම් ලබා ගනිමින් කප්පම් මුදල රුපියල් ලක්ෂ 15 දක්වා අඩු කර ඇති අතර, 17 වෙනිදා පිරිමි පුද්ගලයෙක් විසින් ඇමතුමක් දෙමින් පවසා ඇත්තේ මුදල් නොලැබුණහොත් ඇයව මරා දමන බවය. මේ බව අධිකරණයට කරුණු වාර්තා කරමින් පොලිසිය දුරකතන ජාල පරීක්ෂාවක් කිරීමේදී හෙළි වන්නේ එදා ඇය ආණමඩුවට පැමිණ නැති බවත් කටුපොත පැත්තට ගමන් කර ඇති බවත්ය. දුරකතනය ඇති ස්ථානයේ පිහිටීම ගැන පවා මෙහිදී තොරතුරු ලබා ගත් පොලිසිය ඊයේ එම ස්ථානය වැටලීමේදී අනාවරණය වී ඇත්තේ ඇය සිය සහෝදරයාගේ නිවසේ රැඳී සිටිමින් මෙම රංගනයේ නිරතව සිට ඇති බවය. එම නිවැසියන්ට ඇය පවසා ඇත්තේ තමා ණය මුදලක් අරගෙන ඇති බැවින් ණයකාරයෝ නිවසට පැමිණ කරදර කරන බැවින් සතියකට නවාතැන් ගැනීමට එහි පැමිණි බවය. ඇය එහි රැඳී සිටිමින් ඉතා සූක්ෂ්ම ලෙස නිවැසියන්ටත් හොරෙන් සිය සැමියාට දුරකතන ඇමතුම් දෙමින් කප්පම් මුදල ලබා ගැනීමට උත්සාහ දරා ඇති බව පොලිසිය කියයි. අවසාන දිනයේ කප්පම ඉල්ලා තර්ජනය කර ඇත්තේ ඇගේ ඉල්ලීමට අනුව ගවයන් බැඳීමට පැමිණි තරුණයෙකු විසින් බවද පොලිසිය කියයි. එම තරුණයා විසින් එම ඇමතුම ලබා දීම ප්‍රතික්ෂේප කළ විට ඇය බලහත්කාරයෙන්ම මෙන් ඔහුට දුරකතනය ලබා දෙමින් එම තර්ජනය කරවා ඇති බව විමර්ශනවලින් අනාවරණය වී ඇත. සිය බාල පුතා විදෙස්ගත කිරීමට රැකියා නියෝජිතයෙකුට මුදල් ලබා දී ඇති බවත් ලක්ෂ හතහ මාරක මුදලක් ඒ වෙනුවෙන් ණය වී ඇති බැවින් එම ණය පියවීම සඳහා මුදල් රැස් කර ගැනීමට මෙම රංගනයේ ඇය නිරත වී සිට ඇති බවත් විමර්ශනවලින් අනාවරණය වී තිබේ.

පුත්තලම නියෝජ්‍ය පොලිස්පති එස්.එම්.වයි. සෙනෙවිරත්න, පුත්ලම කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අජිත් හේසිරි, සහකාර පොලිස් අධිකාරී එච්.එම්.සී.පී. හේරත් යන මහත්වරුන්ගේ අධීක්ෂණයෙන් ආණමඩුව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්.ආර්. හේමන්ත නන්ද බණ්ඩාර, අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සුනිල් ජයන්ත, පොලිස් සැරයන්වරුන් වන කුමාර (34208), හේරත් (37482), විරසේකර (17005), විජිත් (39027), කොස්තාපල්වරුන් වන වර්ණසූරිය (7674) යන නිලධාරීන් විසින් මෙම විමර්ශනය සිදු කර තිබුණි.

## පාන් කෙටි ආහාර...

මේ අතර ආපනශාලා හිමියන්ගේ සංගමයේ සභාපති අසේල සම්පත් මහතා කියා සිටියේ ඊයේ (18) සිට කෙටි කෑමවල මිල රුපියල් දහයකින් අඩු කරන බවයි.

සමස්ත ලංකා බේකරි හිමියන්ගේ සංගමයේ සභාපති එන්. කේ. ජයවර්ධන මහතා පැවසුවේ අනෙකුත් බේකරි නිෂ්පාදනවල මිල පහත දැමීම කෙරෙහි අවධානය යොමු වුණත් බිත්තර මිල රුපියල් හැත්තෑව ලෙස ඉහළ යෑමත් වෙළෙඳ පොළේ බිත්තර හිඟ වීම නිසා ඒවායේ මිල අඩු කිරීමට නොහැකි වී තිබෙන බවත් 'දිනමිණ'ට පැවසීය. රුපියල් පනස්පහට වැඩිය බිත්තර අලෙවි කරන වෙළෙඳ සැල්වලින් බිත්තර මිල දී නොගෙන වර්ජනය කරන ලෙස ද පාරිභෝගික අධිකාරිය ජනතාවට දැනුම් දී තිබේ.

## ගැඹුරු මුහුදේදී අත්අඩංගුවට ගත්...

මෙහිදී පළමු බහුදින යාත්‍රාව කොටු කරගෙන ඇත්තේ පසුගිය 13 වෙනිදාය. එම යාත්‍රාවේ හෙරොයින් කිලෝ 106යි ග්‍රෑම් 474ක් අඩංගු පාර්සල් 94ක්ද, අයිස් කිලෝ 128යි ග්‍රෑම් 327ක් අඩංගු පාර්සල් 98ක් ද තිබී ඇත.

හෙරොයින්වල වර්තමාන වීදි වටිනාකම ග්‍රෑම් එකක් රුපියල් 30,000ක් පමණ වන බැවින් මෙම හෙරොයින් තොගයේ වීදි වටිනාකම රුපියල් කෝටි 318ක් පමණ වනු ඇත. අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් එකක වීදි වටිනාකම රුපියල් 12,000ක් පමණ වනු ඇති බැවින් මෙම අයිස් තොගයේ වටිනාකම රුපියල් කෝටි 1536ක් පමණ වනු ඇත.

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් මෙම මත්කුඩු තොගයේ වටිනාකම ගණනය කර ඇත්තේ රුපියල් මිලියන 4586ක් ලෙසටය.

මෙම මත්ද්‍රව්‍ය තොගය පකිස්තානයේ සිට පැමිණි කුඩා නෞකාවකින් ශ්‍රී ලංකාවට ඔබ්බෙන් වූ ජාත්‍යන්තර මුහුදු සීමාවට රැගෙන ආ පසු එය භාරගෙන ඇත්තේ 14 වෙනිදා මත්ද්‍රව්‍ය තොගය සමග නාවික හමුදාව විසින් කොටු කරගත් පළමු යාත්‍රාවේ සිටි කණ්ඩායම බව විමර්ශනවලින් අනාවරණය වී ඇත. එම බහුදින යාත්‍රාව පසුගිය ඔක්තෝබර් 29 වෙනිදා තංගල්ල කුඩාවැල්ල ධීවර වරායෙන් පිටත් වූවක් බව ද අනාවරණය වී තිබේ. මෙම පළමු යාත්‍රාව කොටු කරගනු ලැබුවේ ශ්‍රී ලංකාවට දකුණින් දෙවුන්දර තුඩුවේ සිට නාවික සැතපුම් 229ක් පමණ වූ ගැඹුරු මුහුදේ දී බව නාවික හමුදාව සඳහන් කරයි. නාවික හමුදාව විසින් 13 වෙනිදා එම යාත්‍රාව කොටු කරගන්නේ මත්ද්‍රව්‍ය තොගය පාකිස්තානු නෞකාවෙන් භාරගෙන දින දෙකක් තුළදීය. එම අවස්ථාවේදී තංගල්ලෙන් ගිය යාත්‍රාවේ 08 දෙනෙක් සිට ඇති අතර, ඒ එක් අයෙක් අත්අඩංගුවට ගැනීමෙන් දින කිහිපයකට පසු මියගොස් තිබේ. එම පුද්ගලයා නාවලපිටියේ පදිංචිකරුවෙකි. පාකිස්තානයෙන් පැමිණි යාත්‍රාවෙන් මත්ද්‍රව්‍ය තොගය භාර ගැනීම මුළුමනින්ම මෙහෙයවා ඇත්තේ මිය ගිය එම පුද්ගලයා විසින් බවත් චන්ද්‍රිකා තාක්ෂණ දුරකතනයක් ඔහු අත තිබී ඇති බවත් ඔහුට එම දුරකතනයට ප්‍රධාන ජාවාරම්කරුගෙන් නිතරම ඇමතුම් ලැබී ඇති බවත් විමර්ශනවලින් අනාවරණය වී ඇත. එම පුද්ගලයා මියගිය අයුරු ගැන තොරතුරු අනාවරණය කර ගැනීමට පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදු කෙරෙන බව උසස් පොලිස් නිලධාරියෙක් කීය.

මෙම හෙරොයින් තොගයෙන් කොටසක් භාර ගැනීමට බේරුවලින් ද බහුදින යාත්‍රාවක් ගමන් කර තිබේ. එම යාත්‍රාව ද පළමු යාත්‍රාව අත්අඩංගුවට ගෙන දින දෙකකට පසුව කොටු කරගෙන ඇත. එහි 06 දෙනෙක් සිට ඇති අතර, එම සැකකරුවන් 06 දෙනාම අත්අඩංගුවට ගෙන සෙසු අය සමග ගොඩබිමට රැගෙන ඒමට නාවික හමුදාව පියවර ගෙන තිබුණි. මෙම මත්ද්‍රව්‍ය තොගය ඩුබායි හි රැඳී සිටින ප්‍රබල මත්කුඩු ජාවාරම්කරුවෙකු විසින් ඇණවුම් කර ඇති බව විමර්ශනවලින් පෙනී ගොස් ඇති අතර, ඔහුව පැහැදිලිවම හඳුනා ගැනීමට විමර්ශන මේ වන විට පැවැත්වෙන බව පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ උසස් නිලධාරියෙක් පැවසීය.

අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 29ත් 59ත් අතර පසුවන්නන්ය. ඔවුහු තංගල්ල, නාකුළුගමුව, කොස්ගොඩ, බලපිටිය යන ප්‍රදේශවල පදිංචිකරුවෝය.

# රාජ්‍ය බැංකු නිලධාරියා ලක්ෂ 650ක් වංචා කරලා

ගයාන් කුමාර වීරසිංහ

රාජ්‍ය බැංකු ශාඛාවක ගිණුමකින් රුපියල් ලක්ෂ 650ක් වංචා කළේ යැයි කියන එම බැංකුවේ මාණ්ඩලික නිලධාරියකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අත්අඩංගුවට ගෙන තිබේ.

ඔහු මෙම වංචාව කර ඇත්තේ ගිණුම් හිමියා ලෙස පෙනී සිටිමින් බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ මහර, කඩවත පදිංචි අවුරුදු 26ක් වන තරුණයෙකි.

සාපරාධි විශ්වාසය කඩ කර වංචා කිරීම, සාවද්‍ය පරිහරණය සඳහා අනුබල දීම හා කුමන්ත්‍රණය කිරීම යන චෝදනා සම්බන්ධයෙන් මෙම මාණ්ඩලික බැංකු නිලධාරියා අත්අඩංගුවට ගත් බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරියෙක් පැවසීය.

# 1 වැනි පිටුවෙන්...

## නව නාවික...

ඊයේ (18) උදෑසන, හිටපු නාවික හමුදාපති, අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න මහතා විසින් නව නාවික හමුදාපතිවරයා වෙත සම්ප්‍රදායානුකූලව නාවික හමුදාපතිවරයාගේ අසිපත පිරිනැමීම සහ රාජකාරි භාර දීම නාවික හමුදා මූලස්ථානයේ දී සිදු කෙරුණු අතර, නව නාවික හමුදාපතිවරයා වෙත නාවික හමුදා සම්ප්‍රදායානුකූලව විශේෂ සම්මාන ආචාර වෙඩි මුරයක් මගින් ආචාරය පිරිනැමීම නාවික හමුදා මූලස්ථානයේ දී සිදු කෙරිණි.

වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා කොළඹ රාජකීය විද්‍යාලයේ දීප්තිමත් ආදි ශිෂ්‍යයෙකි. ඔහු 1987 වර්ෂයේ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ 05 වන බඳවා ගැනීමට අයත් ශිෂ්‍යභට නිලධාරියෙකු වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවේ විධායක අංශයට එක් විය. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙන් සහ නාවික හා සාගරික විද්‍යාපීඨයෙන් මූලික පුහුණුව සාර්ථක ලෙස අවසන් කර 1989 වර්ෂයේ උප ලුතිනන් වරයෙකු වශයෙන් අධිකාරියට පත් වන ඔහු, සිය උප ලුතිනන් තාක්‍ෂණික පාඨමාලාව 1992 වර්ෂයේ නාවික හා සාගරික විද්‍යාපීඨයෙන් සාර්ථකව හදාරා, කිමිදුම් නිෂ්කාශනය සම්බන්ධ විශේෂඥතාව 1994 දී ඉන්දීය නාවික හමුදා කිමිදුම් පාසල වෙතින් ලබා ඇත. එතැන් සිට ක්‍රමානුකූලව උසස් වීම් ලබමින් 2020 වර්ෂයේ ජූලි මස 15 දින ඔහු රියර් අද්මිරාල් නිලයටත්, 2022 දෙසැම්බර් 18 දින වයිස් අද්මිරාල් නිලයටත් උසස් වී ඇත.

සිය සේවා කාලය තුළ ශ්‍රී ලංකා නාවික හමුදාවේ විවිධ නිල තල රාශියක් දරා ඇති ඔහු, වේග ප්‍රහාරක මුර යාත්‍රාවන්හි අණ භාර නිලධාරී ලෙස සහ ශ්‍රී ලංකා නාවික හමුදා නෞකා හා ආයතනයන්හි මෙන්ම විශේෂ යාත්‍රා බලඝණයේ අණ දෙන නිලධාරී වශයෙන් රාජකාරි සිදු කොට ඇත. තවද, ඔහු අධ්‍යක්ෂ නාවික පුහුණු, නාවික හමුදා පර්යේෂණ ඒකකයේ ප්‍රධානී, උතුරු මැද නාවික විධානයේ නියෝජ්‍ය ආඥාපති, අධ්‍යක්ෂ නාවික විශේෂ බළකා, අධ්‍යක්ෂ නාවික මෙහෙයුම්, අධ්‍යක්ෂ නාවික විදේශීය සහයෝගිතා, අධ්‍යක්ෂ නාවික සමුද්‍රීය ආවේක්ෂණ, දකුණු නාවික විධානයේ ආඥාපති සහ උතුරු නාවික විධානයේ ආඥාපති වශයෙන් රාජකාරි සිදු කර ඇත. එමෙන්ම, වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා නාවික හමුදාපති ලෙස පත්වීමට පෙර නාවික හමුදා මාණ්ඩලික ප්‍රධානී වශයෙන් කටයුතු කළ කීර්තිමත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකි.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙන් ආරක්ෂක හා උපාය මාර්ගික අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇති වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා, 2004 වර්ෂයේදී අමරිකා එක්සත් ජනපදයේ රෝඩ් අයිලන්ඩ් හි පිහිටි නාවික සංග්‍රාමික විද්‍යාලයේ නාවික මාණ්ඩලික පාසලෙන් අණ හා මාණ්ඩලික පාඨමාලාව හදාරා ඇත. තවද, ඔහු 2012 වර්ෂයේදී ඔස්ට්‍රේලියාවේ වොලොන්ග්ගොන්ග් විශ්වවිද්‍යාලයෙන් සමුද්‍රීය ප්‍රතිපත්ති සම්බන්ධ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇති අතර, 2018 වර්ෂයේදී චීනයේ ජාතික ආරක්ෂක විද්‍යාලයෙන් ආරක්‍ෂක සහ උපාය මාර්ගික අධ්‍යයනය පිළිබඳ පාඨමාලාව හදාරා ඇත.

තිස් වසරකට ආසන්න කාලයක් මෙරට වෙළාගෙන පැවති ත්‍රස්තවාදය පිටුදැකීමේ මෙහෙයුම් සඳහා සක්‍රියව දායක වී සතුරාට එරෙහිව සිදු කළ නිර්භීත ක්‍රියා වෙනුවෙන් රණ සූර පදක්කම තෙවතාවක් ද, අගනා සේවය නොකැලැල් චරිතය සහ රාජකාරියට කැපවීම වෙනුවෙන් උත්තම සේවා පදක්කමෙන් ද පිදුම් ලද වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා වෙත, ඔහුගේ දක්ෂතාවය කැපවීම සහ ආදර්ශමත් කාර්ය සාධනය ඇගයීම වෙනුවෙන් නාවික හමුදාපති විසින් අවස්ථා හතකදී (07) ප්‍රශංසාත්මක ලිපි ප්‍රදානය කර ඇත.

ආගමික වතාවත්වලට මුල් තැන ලබා දෙමින්, වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා සිය නාවික හමුදාපති ධුරයේ වැඩ කටයුතු ඊයේ (18) උදෑසන නිල වශයෙන් ආරම්භ කළ අතර, එම අවස්ථාව සඳහා ඔහුගේ දයාබර බිරිය, මාලා ළමාහේවා මහත්මිය සහ ඔවුන් දෙපළගේ පුතුන් වන සචිත් (24) සහ ෂමාල් (21) ද සහභාගි වී සිටියහ.

## අහැටුවැව බණ්ඩාරනායකයේ...

එහි විභාග ශාලාවක සිටි දරුවන් එකළොස්දෙනකු වරණ සහිත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයමින් සිටියදී නිරීක්ෂකවරියක් විසින් ප්‍රශ්න පත්‍ර නැවත ලබා ගෙන ඒවා හුවමාරු කර ඇති බවට චෝදනා එල්ල වේ.

එම අවස්ථාව වන විටත් දරුවන් විසින් ප්‍රශ්න 25කට පමණ පිළිතුරු සපයා ඇති අතර වෙනත් ප්‍රශ්න පත්‍රයක් ලබා දීමේදී මුල සිට නැවත පිළිතුරු ලිවීමට දරුවන්ට සිදු වී තිබේ.

මෙහිදී දරුවන් සහ මවුපියන් විසින් එම විදුහල අසල නොසන්සුන්කාරීව හැසිරුණු අතර පොලිස් නිලධාරීන් හා කලාප බලධාරීන් ද පැමිණ මවුපියන් සන්සුන් කිරීමට පියවර ගෙන තිබිණි.

විභාගයෙන් අනතුරුව එම දරුවන් පැවසුවේ භාගයක් පමණ පිළිතුරු ලියා තිබෙන විට ගුරුවරියක් විසින් ඒවා එකතු කර වෙනත් ළමයෙක් පිළිතුරු ලියා තිබූ ප්‍රශ්න පත්‍රයක් තමන්ට ලබා දුන් බවයි.

එම ගුරුවරිය මේ සම්බන්ධයෙන් යාළුවකුටවත් අම්මටවත් කියන්නට එපා යැයි තමන්ට පැවසූ බවද දරුවෝ පැවසූහ.

මේ සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් එල්.එම්.ඩී. ධර්මසේන මහතා පැවසුවේ මේ සිද්ධිය සම්බන්ධයෙන් වාර්තා වී ඇති බවත් ඒ ගැන විමර්ශනයක් කර අදාළ සිසුන්ට අසාධාරණයක් වී ඇත්තම් සහනයක් ලබා දෙන බවත්ය. එමෙන්ම මේ සිද්ධිය සම්බන්ධයෙන් වගකිව යුතු හා අනවශ්‍ය දෙයක් කවුරු හෝ කර ඇත්නම් ඒ අය සම්බන්ධයෙන් ද පියවර ගැනීමට කටයුතු කරන බවත් හෙතෙම කීවේය.

## මන්ත්‍රී වරප්‍රසාද...

මන්ත්‍රීවරයා මේ බව ප්‍රකාශ කර සිටියේ විපක්ෂ නායක කාර්යාලයේ ඊයේ (18) පැවැති මාධ්‍ය හමුවේදීය.

මම විශ්වාස කරනවා පාර්ලිමේන්තු වරප්‍රසාද අඩු කරන්න ඕන. ඒක පිළිබඳ අපිට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවක් ලබා ගන්න ඕන. කවුරුහරි ඒවට බෑ කියනවා නම් ඒ කියන්නේ ඒ ගොල්ලෝ ජනතාවට වගකියන වැඩ කරන්න ආපු කට්ටිය නෙමෙයි. ඇමැතිවරයෙක් වුණාම තමන්ගේ නිවෙසට මීටර් පන්සීයක් මෙහා පැත්තේ ආණ්ඩුවේ නිවෙසකට ආවම ලයිට් බිල්, වතුර බිල් ආණ්ඩුවෙන් ගෙවන්න ඕනේ. මේ අය ඇවිත් ඉන්නේ ජනතාවට සේවය කරන්න නොවන බව පැහැදිලියි. කොළඹ දිස්ත්‍රික්කයෙන් පිට ජීවත් වන මන්ත්‍රීවරයකු ඇමැතිවරයකු වෙලා ආවා නම් ඒක සාධාරණයි. මේ කිට්ටුව තමන්ට ගෙයක් තිබෙනවා නම් වරප්‍රසාද අයින් කරන්න ඕනෙ. ඇමැතිවරයකුට එක වාහනයක් මදිද? එකක් මදි නම් දෙකක් හොඳටම ඇති. ඒ වගේම ඇමැතිවරුන්ට පාර්ලිමේන්තුවෙන් බෙහෙත් දෙන්න ඕනෑද? බොහෝ දෙනා ගන්නේ නැහැ. නමුත් සමහරු පෙට්ටි ගණන් අරන් යනවා නම් මේවා සියල්ල නවත්වන්න ඕනේ. විනිවිදභාවය ඇති කරලා වංචාව, දූෂණය අවම කරන්න පුළුවන් තරම් කටයුතු කළ යුතු යැයි ද හෙතෙම කීවේය.

## ජනශක්ති අධ්‍යක්ෂ ඝාතනය

# ‘ඔබ එන තුරු මම ඉන්නවා’ යනුවෙන් SMS පණිවිඩය යැව්වේ දිනේෂ්ගේ ඝාතකයා!

## විමර්ශනවලින් හෙළි වෙයි

**ගයාන් කුමාර වීරසිංහ සහ බණ්ඩාරගම - බිමල් ජයසිංහ**

ජනශක්ති සමාගමේ අධ්‍යක්ෂ දිනේෂ් ෂාෆ්ටර් මහතාගේ ජංගම දුරකතනයෙන් ක්‍රිකට් විස්තර ප්‍රචාරක බ්‍රයන් තෝමස් මහතාගේ දුරකතනයට කෙටි පණිවිඩයක් යොමු වී ඇත්තේ ෂාෆ්ටර් මහතා බොරැල්ල පොදු සුසාන භූමියේදී අපරාධකරුවන්ගේ ගොදුරක් බවට පත් වීමෙන් අනතුරුව බව ඒ මහතාගේ ඝාතනය සම්බන්ධයෙන් මෙතෙක් සිදු කර ඇති විමර්ශනවලින් පෙනී ගොස් තිබේ.

ඒ අනුව පැහැදිලි වී ඇත්තේ එම කෙටි පණිවිඩය දිනේෂ් ෂාෆ්ටර් මහතාගේ ඝාතකයා විසින් බ්‍රයන් තෝමස් මහතාගේ ජංගම දුරකතනයට යොමු කර ඇති බවය.

එසේම කුරුඳුවත්ත මල්පාරේ පිහිටි සිය නිවසේ සිට ජනශක්ති සමාගමේ අධ්‍යක්ෂ දිනේෂ් ෂාෆ්ටර් මහතා පසුගිය 15 වෙනිදා ගමන්ගත් මෝටර් රථය කෙළින්ම පැමිණ ඇත්තේ බොරැල්ල පොදු සුසාන භූමිය වෙත බව ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන විමර්ශනවලින් අනාවරණය වී තිබේ.

දිනේෂ් ෂාෆ්ටර් මහතා සවස 2.06ට පමණ නිවෙසින් පිටත්ව ඇති බවත් නිවෙසින් පිටත් වීමෙන් පැය භාගයක් හෝ ඒ ආසන්න කාලයක් තුළ ඔහුට මේ අපරාධය සිදුව ඇති බවත් විමර්ශන තොරතුරු ඔස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන කණ්ඩායම් අනුමාන කරයි.

දිනේෂ් ෂාෆ්ටර් මහතා සිය නිවෙසින් පිටත් වූ අවස්ථාවේ සිට ඔහුගේ ගමන්මග ආරක්ෂක කැමරා දත්ත විශ්ලේෂණය තුළින් කළ පරීක්ෂාවේදී ඔහුගේ මෝටර් රථය බොරැල්ල පොදු සුසාන භූමිය වෙත කෙළින්ම පැමිණ ඇති බව පෙනී ගොස් තිබේ. අතරමගදී මෝටර් රථයට යම් පුද්ගලයෙක් ගොඩවූවාද නැතිනම් ඔහු යම් පුද්ගලයෙක් මුණගැසීමේ අපේක්ෂාවෙන් සුසාන භූමියට ගියේද යන්න පිළිබඳව තවදුරටත් විමර්ශන පැවැත්වෙන බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරියෙක් කීය. මෝටර් රථය සුසාන භූමියට ඇතුළු කර නතර කර තිබුණු ස්ථානයේ පිහිටීම නිරීක්ෂණය කිරීමේදී පෙනී යන්නේ බොරැල්ල පොදු සුසාන භූමිය ගැන හොඳ අවබෝධයක් ඇති අයෙක් මේ අපරාධයට සම්බන්ධව ඇති බවය.

දිනේෂ් ෂාෆ්ටර් මහතා සමඟ මුදල් ගනුදෙනුවක් සම්බන්ධයෙන් ආරවුලක් පවතින ක්‍රිකට් විස්තර විචාරක බ්‍රයන් තෝමස් මහතාගෙ ජංගම දුරකතනයට දිනේෂ් ෂාෆ්ටර් මහතාගේ ජංගම දුරකතනයෙන් ඔයා එනකම් මම ඉන්නවා යන අදහස ඇති කෙටි පණිවුඩයක් යොමු වී ඇත්තේ ද දිනේෂ් ෂාෆ්ටර් මහතාගේ මෝටර් රථය බොරැල්ල පොදු සුසාන භූමියට ඇතුළු කර තිබියදී බවද විමර්ශනවලින් පෙනී ගොස් තිබේ. බොහෝ විට එම පණිවිඩය දිනේෂ් ෂාෆ්ටර් මහතාගේ ජංගම දුරකතනයෙන් යොමු කර ඇත්තේ ඔහුව එම ස්ථානයට කැඳවා එම අපරාධය කළ පුද්ගලයා හෝ පුද්ගල කණ්ඩායම විසින් බවට සැකයක්ද ඇතැයි උසස් පොලිස් නිලධාරියෙක් සඳහන් කළේය. එම සැකය මතුවී ඇත්තේ එම කෙටි පණිවුඩය යොමුකර ඇත්තේ සවස 2.30න් පසුව වීම නිසාය. මේ ඝාතන සැලසුම්කරුවන් උත්සහ ගත්තේ බ්‍රයන් තෝමස් මහතාව එම ස්ථානයට ගෙන්වා ඔහුව මේ අපරාධයට කොටුකරලීමට විය හැකි බවට සැකයක්ද මේ වන විට මතුව තිබේ. එම කෙටි පණිවිඩයට බ්‍රයන් තෝමස් මහතාද පිළිතුරු පණිවුඩයක් යොමු කරමින් “මට ඔයා එක්ක කිසි කතාවක් නැහැ. මට ඔයාව හම්බවෙන්න උවමනාවක් නැහැ” යන අදහස ඇති කෙටි පණිවුඩයක් ඉංග්‍රීසියෙන් යොමු කර ඇති බව ද විමර්ශනවලින් අනාවරණය වී ඇත.

එසේ පණිවිඩ හුවමාරු වූ බ්‍රයන් තෝමස් සහ දිනේෂ් ෂාෆ්ටර් මහත්වරුන්ගේ ජංගම දුරකතන දෙක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සිය භාරයට ගෙන පරිගණක වෝහාරික පරීක්ෂණාගාරයට යොමු කර ඒ සම්බන්ධයෙන් බොහෝ තොරතුරු මතුකරගෙන ඇති බව පොලිස් ආරංචි මාර්ග අනාවරණය කළේය. පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නීතිඥ නිහාල් තල්දූව මහතා සඳහන් කරනු ලැබුවේ බ්‍රයන් තෝමස් මහතාගේ නිවසේ ඇති ආරක්ෂක කැමරා පද්ධතිය පවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශනයකට ලක්ව ඇති බවය. එහිදී එම ඝාතනය සිදුවූ කාල වකවානුව තුළ බ්‍රයන් තෝමස් මහතා නිවෙසින් බැහැර ගිය බවට හෝ මේ අපරාධයට ඔහුගේ සම්බන්ධයක් ඇතැයි මෙතෙක් කිසිදු තොරතුරක් අනාවරණය වී නැති බවද ඔහු පැවසීය. මේ ඝාතන විමර්ශනය පවත්වන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සංවිධානාත්මක අපරාධ හා මනුෂ්‍ය ඝාතන විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් පුද්ගලයන් 23 දෙනකුගෙන් ප්‍රකාශ ලබා ගෙන ඇති බවද නිහාල් තල්දූව මහතා පැවසීය.

ඒ අය අතර දිනේෂ් ෂාෆ්ටර් මහතාගේ පවුලේ සාමාජිකයන් කිහිප දෙනෙක් මෙන්ම බොරැල්ල සුසාන භූමියේ සේවකයන් කිහිප දෙනෙක්ද සිටින බව නිහාල් තල්දූව මහතා කීය. ආරක්ෂක කැමරා සහ දුරකතන විශ්ලේෂණ මෙන්ම ඇසින් දුටු සාක්ෂි පදනම් කරගෙන විමර්ශන ක්‍රියාත්මක වන බවද නිහාල් තල්දූව මහතා සඳහන් කළේය. ඔහු පවසන්නේ මේ විමර්ශනය පැතිකඩ කිහිපයක් ඔස්සේ සිදුකරන බවය. දිනේෂ් ෂාෆ්ටර් මහතා ව්‍යාපාරිකයෙක් මෙන්ම විවිධ ක්ෂේත්‍ර සමඟ සම්බන්ධකම් පැවැත්වූ අයෙක් වූ බැවින් ඒ හැම පැත්තක් කෙරෙහිම විමර්ශන වලදී අවධානය යොමු කර ඇති බවද නිහාල් තල්දූව මහතා කීය. මෙහිදී දිනේෂ් ෂාෆ්ටර් මහතාට එරෙහිව කිසියම් පැමිණිල්ලක් හෝ ඔහු සමඟ යම් ආරවුලකින් සිටි පුද්ගලයන් සිටියේදැයි කියාත් විමර්ශන පැවැත්වෙන බව නිහාල් තල්දූව මහතා කීය.

එහෙත් මෙතෙක් එවැනි අනාවරණයක් නැතැයිද නිහාල් තල්දූව මහතා සඳහන් කළේය. විද්‍යාත්මක මෙන්ම තාක්ෂණික සාක්ෂි රැසක් ඔස්සේ මේ වන විට විමර්ශන පැවැත්වෙන බවත් පොලිසියේ අපේක්ෂාව කඩිනමින් විමර්ශන පවත්වා සැකකරුවන් අත්අඩංගුවට ගැනීම බවත් නිහාල් තල්දූව මහතා කීය. මෙම අපරාධය සිදුවූ දින දිනේෂ් ෂාෆ්ටර් මහතා නිවෙසින් පිටත්ව ඇත්තේද තමා බොරැල්ලට යන බව බිරියට කියා බව මුල් ප්‍රකාශවලින් කියැවෙන බැවින් ඒ ගැන ඇගෙන් වැඩිදුර තොරතුරු විමසීමටද නියමිතව ඇති බව උසස් පොලිස් නිලධාරියෙක් කීය. දිනේෂ් ෂාෆ්ටර් මහතාගේ දේහය පිළිබඳ අවසන් කටයුතු සිදුවන තුරු පවුලේ අයගෙන් මේ මරණය ගැන වැඩිදුර විමසීම්වලට පොලිසිය යොමුවී නැත. ඊයේ දේහය පිළිබඳ අවසන් කටයුතු සිදු කළ බැවින් හෙට සිට එම කටයුත්තට අත තබනු ඇතැයිද එම නිලධාරියා කීය.

සිය සැමියා පැය භාගයකින් පැමිණෙන බව කියමින් නිවෙසින් පිටත්ව ගිය බව දිනේෂ් ෂාෆ්ටර් මහතාගේ බිරිය මුල් අවස්ථාවේදී පොලිසියට පවසා තිබුණි. හරියටම පැය භාගයක් ගෙවී යන විට ඇය සිය සැමියාට දුරකතන ඇමතුමක් ගෙන ඊට ප්‍රතිචාර නොවූ තැන කලබල වූයේ සිය සැමියාට යම් තර්ජනයක් තිබුණු බැවින් දැයි කියා දීර්ඝ වශයෙන් ඇගෙන් විමසීමට ඇති බවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු තොරතුරු අනාවරණය කළේය. දිනේෂ් ෂාෆ්ටර් මහතා තමා සිටිනා තැන හඳුනා ගැනීමට හැකි දුරකතනයේ පහසුකම සිය බිරියට අමතරව ව්‍යාපාරික සගයාටද යොමු කර තිබීම ගැනද විමර්ශනවලදී විශේෂ අවධානයක් යොමුකර තිබේ. දිනේෂ් ෂාෆ්ටර් මහතා බ්‍රයන් තෝමස් හමුවීමට යන බව තමාට කීවේ යැයි පොලිසියට කියා ඇත්තේ සමාගම් අධ්‍යක්ෂවරයෙක් වන එම ව්‍යාපාරික සගයාය. අපරාධකරුවන්ට ගොදුරු වී සිටි දිනේෂ් ෂාෆ්ටර් මහතාව මුලින්ම හමුවන්නේද ඔහුටය. කෙටි පණිවුඩය ගැන බ්‍රයන් තෝමස් මහතා පවසන හැටියට තමාට එවැනි හමුවක් ගැන දිනේෂ් ෂාෆ්ටර් මහතාගෙන් ආරාධනාවක් ලැබෙන්නේ එදින 2.30 හෝ ඒ ආසන්න කාලයකදී ලැබෙන කෙටි පණිවුඩය හරහාය. සැබෑ ලෙසම දිනේෂ් ෂාෆ්ටර් මහතා නිවෙසින් පිටත් වූයේ බ්‍රයන් තෝමස් හමුවීමට නම් බොරැල්ල පොදු සුසාන භූමියේ සිට ඔහුට කෙටි පණිවුඩයක් යොමු නොකරන බවත් කාර්ය බහුල ව්‍යාපාරිකයෙක් වන ඔහු කල්වේලා ඇතිව වේලාවල් වෙන් කරගන්නා බවත් විමර්ශනවලින් පෙනී ගොස් ඇත. දිනේෂ් ෂාෆ්ටර් මහතාගේ ජංගම දුරකතනයෙන් බ්‍රයන් තෝමස් මහතාගේ දුරකතනයට කෙටි පණිවුඩය ගොස් ඇත්තේද බොරැල්ල සුසාන භූමිය අවට දුරකතන සංඥා කුලුනුවලින් බවද පෙනී ගොස් ඇත.

“සතුරෙකු අතින් මේ ඝාතනය වෙලා තියෙන්නේ. සතුරා ගැන සොයා ගන්න හැම ක්ෂේත්‍රයක් ගැනම සොයා බලනවා“ යනුවෙන් මේ සම්බන්ධයෙන් පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නීතිඥ නිහාල් තල්දූව මහතා කීය. දිනේෂ් ෂාෆ්ටර් මහතාගේ ඝාතන විමර්ශන මේ වන විට සිදුවන්නේ මුල් අවස්ථාවේ පැවති තත්ත්වයට වඩා අලුත් මඟක බවත් මේ ඝාතනය සම්බන්ධයෙන් සැක කටයුතු තොරතුරු රැසක් අනාවරණය වෙමින් ඇති බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තොරතුරු සඳහන් කරයි. මේ වන විට ඇත්තේ එම තොරතුරු වඩාත් තහවුරු කර ගැනීමේ කටයුතු වන බවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු ආරංචි මාර්ග සඳහන් කළේය.

එම තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඇතැම් විට හිතා ගැනීමටත් නොහැකි සිදුවීම් රැසක් අනාවරණය වනු ඇතැයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තොරතුරු වැඩිදුරටත් අනාවරණය කළේය. මේ ඝාතනය සම්බන්ධයෙන් සිදුකෙරෙන විමර්ශන වලට අදාළව ඒ මහතා නිවෙසේ සිට කනත්ත දක්වා පැමිණි මාර්ගයේ තිබූ CCTV 42ක්ද පරීක්ෂා කර තිබේ.

# අනතුරට පත් මියන්මාර් යාත්‍රාව නාවික හමුදාවෙන් බේරා ගනී

## මියන්මාර් ජාතිකයන් 132ක් නිරුපද්‍රිතව කන්කසන්තුරේ වරායට

## මෙහෙයුමට නාවික යාත්‍රා 4ක්

**රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ**



යාපනයේ මරදන්කේණි මුහුදට, මුහුදු සැතපුම් සීයක පමණ දුරින් වූ ගැඹුරු මුහුදේදී අනතුරකට පත් බෝට්ටුවක සිටි මගීන් 132ක් නාවික හමුදාව මඟින් බේරාගෙන පෙරේදා (17) කන්කසන්තුරේ වරාය වෙත රැගෙන විත් තිබේ.

මේ මගීන් සියලු දෙනාම මියන්මාර් ජාතිකයන් බවට මූලිකව හඳුනාගෙන ඇතත් ඔවුන් සම්බන්ධයෙන් සිදු කෙරෙන පරීක්ෂා කිරීම් හමාරවීම හේතුවෙන් ඔවුන් ගැන තොරතුරු හෙළි කළ නොහැකි බව යාපනයේ ආගමන විගමන නිලධාරීහු කියා සිටිති.

මහ මුහුද මැද බෝට්ටුවක් අනතුරට පත්ව ඇති බව ධීවරයන් පිරිසක් විසින් නාවික හමුදාවට දැනුම් දීමෙන් පසුව නාවික හමුදා යාත්‍රා හතරක් එම තොරතුර ප්‍රකාශ වූ දෙසට ගමන් කිරීමෙන් පසුව මහ මුහුද මැද දී බෝට්ටුව අනතුරට ලක්වීමෙන් පසුව අතරමං වූ පිරිස බේරාගෙන තිබේ. අනතුරට පත් බෝට්ටුව ගොඩබිමට රැගෙන ඒමට නාවික හමුදාව පියවර ගෙන තිබේ. මුහුද මැද දී විපතට පත්ව සිටි මගීන්ට නාවික හමුදාව මඟින් වෛද්‍ය පහසුකම් හා මූලික ප්‍රථමාධාර දී තිබේ.

කන්කසන්තුරේ පොලිසිය හා නාවික හමුදාව සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වයි.

# CID වෙසින් ගෙට පැන රන්වලට සුද්දෙ දුන් 6ක් පොලිසියට කොටු

## චීවරධාරියකුත් අත්අඩංගුවට

**ගයාන් කුමාර වීරසිංහ**

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ලෙස පෙනී සිටිමින් මාවතගම පිහිටි නිවෙසකට පෙරේදා (17) අලුයම් කාලයේදී කඩාවැදී දේපොළ කොල්ලකෑමකට සම්බන්ධ වූ හිමිනමක ඇතුළු 06 දෙනකුගේ කණ්ඩායමක් මාවතගම පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන තිබේ.

කඩිගමුවේ චන්ද්‍රාලංකාර නමැති 26 හැවිරිදි එම හිමිනම විසින් තමන් වහන්සේ රැඳී සිටින විහාරස්ථානය ලෙස පවසා ඇත්තේ රාජගිරියේ පිහිටි ප්‍රසිද්ධ හිමිනමක් වැඩසිටින විහාරස්ථානයක ලිපිනයකි. එම විහාරාධිපති හිමි මුළු රටම නම කියූ සැණින් දන්නා සංවිධානයක මහ ලේකම් ධුරය දරන අතර මේ සැකකාර හිමිනම ඇතුළු අත්අඩංගුවට ගත් සැකකරුවන් එම සංවිධානයේ ක්‍රියාකාරිකයන් බව පවසන බව පොලිසිය කියයි.

අත්අඩංගුවට ගත් හිමිනම ගැන වැඩිදුර විමර්ශනයේදී පෙනී ගොස් ඇත්තේ උන්වහන්සේ අතුරුගිරිය ප්‍රදේශයේ පිහිටි විහාරස්ථානයක වැඩසිටින බවය. උන්වහන්සේ සමඟ අත්අඩංගුවට ගත් සැකකරුවන් අතර රදාවාන කිතුලකන්ද පාරේ පදිංචිකරුවකු වන ශෙහාන් මිලින්ද (25), දංඕවිට වේරගොඩ පදිංචිකරුවකු වන මධුරංග අබේවර්ධන (30), අතුරුගිරිය ගල්පොත්ත පාරේ පදිංචිකරුවකු වන සිනෙත් නිලන්ත (27), තක්කහින්න, කොට්ටපොළ පදිංචිකරුවකු වන ජයාන් මධුසංක (18) සහ තඹුත්තේගම, කලුන්දෑවේ පදිංචිකරුවකු වන සුගත් රුවන් කුමාර (37) යන අය සිටින බව පොලිසිය කියයි.

මේ සැකකරුවන් අතර අත්අඩංගුවට ගත් හිමිනමගේ සහෝදරයා ඇතුළු ඥාතීන් කිහිපදෙනකු සිටින බව විමර්ශනවලින් අනාවරණය වී තිබේ. මේ පිරිස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ලෙස පෙනී සිටිමින් කඩාවැදී ඇත්තේ මාවතගම, මැද්දේගොඩ, පිටකන්ද පාරේ නිවෙසකටය.

සරෝජා චන්ද්‍රකාන්ත නමැති 59 වියැති එම නිවෙස හිමි කාන්තාව පොලිසියට පවසා ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ලෙස 17 වැනිදා අලුයම් කාලයේදී සිය නිවෙසට මේ හිමිනම ඇතුළු 07 දෙනකුගේ කණ්ඩායමක් කඩාවැදී රන් බුදු පිළිමයක් සොයා මුළු නිවෙසම පරීක්ෂා කළ බවය. නිවෙසේ බඩු මුට්ටු අවුස්සමින් ඒ අය නිවෙස පරීක්ෂා කරමින් සිටියදී මේ කාන්තාව 119 පොලිස් හදිසි ඇමතුම් අංශයට මේ ගැන දැනුම් දී ඇති බවත් එම ඇමතුමට අනුව මාවතගම පොලිසිය එහි පැමිණ විමර්ශන පවත්වා සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබෙන බවත් පොලිස් තොරතුරු සඳහන් කළේය. පොලිසිය එහි එන විට එක් සැකකරුවකු පලා ගොස් ඇති බව නිවෙස් හිමි කාන්තාව පවසයි. ඇය පොලිසියට පවසා ඇත්තේ රන් මාලයක් සහ මුදු දෙකක් සොරාගෙන ගොස් ඇති බවත් පලා ගොස් සිටින පුද්ගලයා විසින් එය රැගෙන යන්නට ඇති බවත්ය. එම රන් භාණ්ඩවල වටිනාකම රුපියල් ලක්ෂ 06ක් පමණ වන බව ඇය පොලිසියට ප්‍රකාශයක්ද දී ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් ලෙස පෙනී සිටිමින් මේ භික්ෂුව ඇතුළු පිරිස නිවෙසට කඩාවැදී සොයා ඇති රන් පිළිමය ගැනද මෙහිදී පොලිසිය යම් සොයා බැලීමක් කර තිබේ. එහිදී සැකකාර භික්ෂුව පොලිසියට පවසා ඇත්තේ එම රන් පිළිමය නිවෙසක තබා වැඳුම් පිදුම් කරන විට සිතූ සිතූ සම්පත් ලැබෙන බවය. තමන් වහන්සේ සතුව තිබුණු එම පිළිමය කලක් තමන් වහන්සේගේ රියැදුරු ලෙස කටයුතු කළ දුලාන් නමැති අයකුට දුන් බවද උන්වහන්සේ පොලිසියට පවසා ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ලෙස මේ අය කඩාවැදී ඇත්තේ එම දුලාන් නමැති රියැදුරාගේ නිවෙසටය. එම අවස්ථාවේදී දුලාන් නමැති මේ රියැදුරා නිවෙසේ සිට නැත.

දුලාන් නමැති රියැදුරාද මේ පිළිමය ගැන මාස එකහමාරකට පෙර මාවතගම පොලිසියට පැමිණිල්ලක් කර තිබී ඇත.

එහිදී ඔහු පොලිසියට පවසා ඇත්තේ පරම්පරාවෙන් තමාට උරුම වී තිබුණු පිළිමය සොරකම් කර ඇති බවය. මේ පිරිස නිවෙසට කඩාවදින විට නිවෙසේ සිට ඇත්තේ කාන්තාව සහ වයස අවුරුදු 15ක් පමණ වන ඇගේ පුතා පමණක් බවද පොලිසිය කියයි. මෝටර් රථයකින් සහ යතුරුපැදි දෙකකින් මේ සැකකරුවන් මෙහි පැමිණ ඇති බවත් සැකකාර හිමිනමගේ ගම්පළාත කෑගල්ල ප්‍රදේශය බවත් පොලිසිය කියයි. මේ සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

# ඉඩම් ආරවුලට නෑනටයි - දරුවටයි කොස්තාපල් පොරොවෙන් කොටන්න ගිහින්

**ගයාන් කුමාර වීරසිංහ**

ඉඩම් ආරවුලක් මුල් කරගෙන ඇති වුණු ආරවුලකදී මවකට සහ දරුවකුට පොරොවකින් කෙටීමට ගිය පොලිස් සැරයන්වරයකු දෙහිඅත්තකණ්ඩිය පොලිසියේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ දෙහිඅත්තකණ්ඩිය පොලිසියට අනුයුක්තව සේවයේ නිරතව සිටින පොලිස් සැරයන්වරයෙකි.

මැදගම නවමැදගමදී පෙරේදා (17) මේ සිදුවීම වී ඇතැයි පොලිසිය කියයි. මේ නිලධාරියා පොරොවෙන් කෙටීමට ගොස් ඇත්තේ බිරියගේ සහෝදරයාගේ බිරියට සහ දරුවාට බව පොලිසිය කියයි.

පොරොවත් සමඟ අත්අඩංගුවට ගත් සැකකරු ඇප මත මුදාහැර තිබේ. ලබන 21 වැනිදා අධිකරණයට මේ සම්බන්ධයෙන් කරුණු වාර්තා කරන බව පොලිසිය පැවසීය.

# පාන්දර පන්සලට පැන ලොකු හාමුදුරුවන්ට පහර දී මුදල් - දුරකතනය උස්සලා

**ගයාන් කුමාර වීරසිංහ**

හබරණ අලුත්ඔය පිහිටි ඉසිපතනාරාම විහාරස්ථානයට කඩාවැදුණු කොල්ල කල්ලියක් විහාරාධිපති හිමිට පහරදී මුදල් හා දේපොළ කොල්ලකා පලා ගොස් තිබේ.

මේ කොල්ලය සිදුව ඇත්තේ පෙරේදා (17) අලුයම් කාලයේදීය.

විහාරාධිපති දෙහිවත්තේ ධම්මගවේෂි හිමියෝ වැඩසිටින ලැගුම්ගෙට ඇතුළු වූ තිදෙනකුගෙන් සමන්විත කොල්ල කල්ලිය උන් වහන්සේට පහර දී ඇති බවද පොලිසිය කියයි. මුදලින් රුපියල් 650,000ක්, රුපියල් 100,000ක් වටිනා ජංගම දුරකතනයක් මෙසේ කොල්ලකා ඇති බව උන් වහන්සේ විසින් පොලිසියට කර ඇති පැමිණිල්ලෙහි සඳහන්ය.

මේ කොල්ල කල්ලිය අත්අඩංගුවට ගැනීමට විමර්ශන පවත්වන බව හබරණ පොලිසිය සඳහන් කළේය.

# ‘අයිස්’ අල්ලන්න ගිය කොස්තාපල්ට ජාවාරම්කරු කඩුවෙන් කොටලා

**ගයාන් කුමාර වීරසිංහ**

අයිස් මත්ද්‍රව්‍ය පැකට් කරමින් සිටින ස්ථානයක් ගැන ලද තොරතුරකට අනුව කන්දෙවත්තේ පාරේ නිවෙසක් වැටලීමකට ගිය කිරුලපන පොලිසියේ නිලධාරීන් පිරිසකට පෙරේදා (17) මත්ද්‍රව්‍ය ජාවාරම්කරු විසින් කඩුවකින් කළ පහරදීමකින් නිලධාරියකු තුවාල ලබා රෝහල්ගත කර ඇත. පොලිස් කොස්තාපල් අධිකාරි (97292) යන නිලධාරියා මෙසේ තුවාල ලබා ඇති අතර ඔහු මේ වන විට කොළඹ ජාතික රෝහලට ප්‍රතිකාර සඳහා ඇතුළත් කර සිටියි. ඔහුගේ වම් අත කැපීමට ලක්ව ඇති බව පොලිසිය කියයි.

එම ප්‍රහාරයෙන් පසු දැඩි පරිශ්‍රමයකින් අනතුරුව පොලිස් කණ්ඩායම මඟින් සැකකරුව අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහු සතුව තිබී අයිස් මත්ද්‍රව්‍ය මිලිග්‍රෑම් 5270ක්ද සොයා ගැනීමට හැකියාව ලැබී ඇත. මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ කිරුලපන පූර්වාරාම පාරේ පදිංචිකරුවකු වන සමීර සුරංජන නමැති 32 හැවිරිදි පුද්ගලයෙකි.

සැකකරුව අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාරගත කර ඇත.

# පළමු වසරේ සිසුවාට සිවුවැනි වසරේ සිසුවා සූර් වී ඇවිත් පහර දීලා

**අසේල කුරුළුවංශ**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ පළමු වසරේ සිසුවකුට සිවුවන වසරේ සිසුවකු බීමතින් කළ පහර දීමක් හේතුවෙන් අදාළ සිසුවා ප්‍රතිකාර සඳහා පේරාදෙණිය ශික්ෂණ රෝහලට ඇතුළත් කර තිබේ.

මේ පහර දීම විශ්වවිද්‍යාලයේ අයිවර් ජෙනිංග්ස් නේවාසිකාගාරය තුළදී පෙරේදා (17) පස්වරු 5.30ට පමණ සිදුව ඇත. පහර කෑමට ලක් වූ සිසුවා කලා පීඨයේ පළමු වසරේ අධ්‍යාපනය ලබන අතර ඔහු නෝර්ටන් බ්‍රිජ් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. පහර දුන් සිසුවා යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවකු වන අතර සිද්ධිය සම්බන්ධයෙන් පේරාදෙණිය පොලිසිය හා විශ්වවිද්‍යාල පරිපාලනය වෙන් වෙන්ව පරීක්ෂණ සිදු කරයි.

තමන් නේවාසිකාගාරයේ සිටියදී ජ්‍යෙෂ්ඨ සිසුන් තිදෙනකු පැමිණි බවත් ඒ අතර සිටි එක් අයකු පහර දුන් බවත් පහර කෑමට ලක්ව රෝහලේ ප්‍රතිකාර ලබන සිසුවා පවසයි.

## අද දවස

රාහු කාලය
උදේ 07.43 - 09.12 දක්වා
රාත්‍රී 07.31 - 09.03 දක්වා

**යුග දිවියේ සතුට**
**මේෂ** මංගල කටයුතු උදාවේ. තම ගෘහ ජීවිතය යුග ජීවිතය යන සෑම අංශයකම ප්‍රබෝධයක් දක්නට ලැබේ. බොහෝවිට තම අභිවෘද්ධිය උදෙසා කරන බොහෝ කටයුතු සාර්ථක වන අතර, ආර්ථික වශයෙන්ද උසස් තත්ත්වයක් පෙන්වයි.

**පිටරට ගමන් කල් යයි**
**වෘෂභ** ප්‍රවේශම් විය යුතුයි. ආර්ථික පාඩු පෙන්වයි. පිටරට ගමන් බිමන් කල් යයි. සිතේ නොසන්සුන්තා මතු කරයි.

**වාසනාවන්ත දරු සම්පත්**
**මිථුන** තම ආර්ථික අභිවෘද්ධිය සැලසේ. තමාට උසස් අය සමඟ ඇසුරු කිරීමට අවස්ථාව උදාවේ. දරුවන් අපේක්ෂාවෙන් සිටි අයට වාසනාවන්ත දරු සම්පත් උදාවනු ඇත.

**වෘත්තීය ජයග්‍රහණ**
**කටක** ඔබට වාහන ඉඩම් නව නිවාස එල උදා කෙරේ. ඒ අතර ඔබ කරගෙනආ ව්‍යාපාරයක් නැවත වැඩි දියුණුවට මඟ සැලසේ. මිත්‍ර සංගම් ඥාති සබඳතා පුළුල් වන අතර වෘත්තීය ජයග්‍රහණද ඒ අතර වෙයි.

**දේපොළ හිමිකම්**
**සිංහ** දේපොළ හිමිකම් උදාවේ. පැවති නඩුවක තීන්දුව තමාගේ වාසියට පෙරළේ. වල් බිහිව තිබූ ඉඩමක් ශුද්ධ පවිත්‍ර කර ප්‍රයෝජනයට ගැනීමට පෙළඹේ.

**හදිසි ධන සම්පතක්**
**කන්‍යා** කන්‍යා ලග්නයට අනුව ඔබට සුබයි. හදිසි ධන සම්පත් හා තම අභිවෘද්ධියට වැඩ සැලසේ. තමා මීට පෙර ආයෝජනය කර තිබූ ව්‍යාපාරයක් ලාභ ලැබීමට පටන් ගනී.

**අනාගත සුබ සිද්ධිය උදාවේ**
**තුලා** දවස උදාවේ පටන් සිතට සතුට දැනවෙන ආකාරයේ ආරංචි ලැබේ. තමා බලාපොරොත්තුවෙන් සිටි අයකුගේ පැමිණීම අනාගත සුබසිද්ධිය පිණිස වෙයි.

**වාසස්ථානයේ වෙනසක්**
**වෘශ්චික** තමාට ප්‍රියයන්ගෙන් වෙන් වී කාලය ගත කිරීමට සිදුවේ. වාසස්ථානයෙන් දුරස්ව වාසය කිරීමට සිදු වේ. තම සමීපතමයන් වෙතින් විරෝධතා පළවේ.

**කාර්යබහුල දිනයක්**
**ධනු** තම ආර්ථික ප්‍රතිලාභ හා නව ව්‍යාපාරයකට අත පෙවීමට හැකිවේ. එදිනෙදා කටයුතුවල කාර්යබහුලතාවක් පෙන්වයි.

**රැකියා ප්‍රතිලාභ**
**මකර** රැකියා වාසනාව රැකියා උසස්වීම් පෙන්වයි. තම නිවෙසේ අලංකාරය උදෙසා අලුත්වැඩියාවන් වැනි කටයුත්තකට මුල පුරයි. හදිසි ධනලාභ හා නව බලාපොරොත්තු සඵල වනු ඇත.

**ව්‍යාපාර ලාභ**
**කුම්භ** පුණ්‍යවන්ත දිනකි. නිවෙසේ ආගමික කටයුත්තක් සිදු කෙරේ. පෙර පින් මහිමයට මෙන් තමා කරගෙන ආ ව්‍යාපාරයක ප්‍රතිලාභ පෙන්වයි.

**මවට අගුණයි**
**මීන** මීන ලග්නයට අනුව ඉතා ප්‍රවේශම් විය යුතුයි. තුනටියේ අපහසුවක් නිසා පීඩා විඳීමට සිදුවේ. මවට හෝ මවු පාර්ශ්වයේ අයකුට විපත් සිදුවනු ඇත.

සුබසෙත හිටපු කර්තෘ ප්‍රවීණ ජ්‍යොතිෂ්‍යවේදී
**අජිත් ධර්මසිරි**

බෙම්මුල්ල

# නාඳුනන කල්ලියක් මඟ හරස්කොට වී එයිට් එක උස්සලා

**ගම්පහ සමූහ ටෝනි කරුණානායක**

ගම්පහ, දොරණගොඩ හංදියෙන් බෙම්මුල්ල ප්‍රදේශයට ගමන් කරමින් තිබූ රුපියල් ලක්ෂ 175 ක් පමණ වටිනා නවීන පන්නයේ ජීප් රථයක් වෑන් රථයකින් සහ ඩිපෙන්ඩර් ජීප් රථයකින් පැමිණි නාඳුනන පිරිසක් මඟ හරස් කොට හිමිකරු එම ජීප් රථයෙන් එළියට ඇද දමා පැහැරගෙන යාමේ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ ආරම්භ කර ඇතැයි බෙම්මුල්ල පොලිසිය පවසයි.

ලෑන්ඩ් ක්‍රූෂර් ටොයොටා වී 08 වර්ගයේ ජීප් රථයක් මෙසේ පැහැරගෙන ගොස් තිබේ. එම ජීප් රථය පැදවූ මෝටර් රථ මිලට ගැනීම සහ අලෙවි කිරීමේ යෙදෙන ව්‍යාපාරිකයා ජීප් රථය පැහැරගත් පුද්ගලයන් විසින් වෙනත් වාහනයක නංවාගෙන විත් ගම්පහ, උඩුගම්පොළ ප්‍රදේශයේ වාහන මිලට ගන්නා සහ අලෙවිකරණ ව්‍යාපාරික ස්ථානයක් අසල අතහැර දමා ගොස් ඇති බව පොලිසිය පවසයි.

පැහැර ගැනීමට ලක්වූ ජීප් රථය ගරාජ් අංක තහඩුවකින් ධාවනය කර ඇති බව පොලිස් පරීක්ෂණවල දී අනාවරණය වී තිබේ. පැහැරගැනීමට ලක්වූ ජීප් රථය මූල්‍ය සමාගමකින් ලබාගත් ණය පහසුකම් මත ලබාගත් වාහනයක් ද යන්නත් මූල්‍ය සමාගමට ණය වාරික නොගෙවීම හේතුවෙන් පැහැරගැනීම සිදු කළේද යන්නත් සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකරන බව බෙම්මුල්ල පොලීසිය වැඩිදුරටත් සඳහන් කළේය.

# පොල්දූවේ උද්ඝෝෂණයේ දී නැති වූ යුද හමුදාවේ අධිබල සන්නිවේදන කට්ටලයක් පිළියන්දල කසළ ගොඩක



**බණ්ඩාරගම බිමල් ජයසිංහ**

යුද්ධ හමුදා පස්වන ශ්‍රී ලංකා සංඥා බළකාය භාවිතා කරන රිපිටර් වර්ගයේ අධි බල සන්නිවේදන උපකරණ කට්ටලයක් අඩංගු ප්ලාස්ටික් පෙට්ටියක් පිළියන්දල පැලැන්වත්ත ප්‍රදේශයේ කසළ බහාලන ස්ථානයක දමා ගොස් තිබිය දී හමුවූ බව පිළියන්දල පොලිසිය කියයි.

තම වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ කසළ බහාලීම සඳහා සකස් කර තිබෙන කුඩා කාමරය තුළ කළු පාටට හුරු ප්ලාස්ටික් පෙට්ටියක් තිබෙන බවත් එහි මතුපිට අංක 5, එස්එල් එස්සි යනුවෙන් ඉංග්‍රීසියෙන් ලියා ඇති බවටත් වෙළඳ සංකීර්ණයේ හිමිකරු 119 පොලිස් හදිසි ඇමතුම් අංශය හරහා ලබා දුන් තොරතුරක් අනුව මෙය සොයා ගත් බව පොලිසිය කියයි.

ඒ අනුව එම ස්ථානයට ගිය පිළියන්දල පොලිසියේ නිලධාරීන් එම කළු පාට පෙට්ටියෙ මතුපිටින් සඳහන් කර ඇති ඉංග්‍රීසි අක්ෂර අනුව එය යුද හමුදාව සංඥා බළකායට අයත් යම් උපකරණයක් බව සැක කර එය විවෘත කර බැලීමේදී ඒ තුළ කොටස් 4කින් යුත් සන්නිවේදන උපකරණ සහ වයර් තිබූ බව පොලිසිය කියයි.



පොලිස් නිලධාරීන් උපකරණ කට්ටලය පරීක්ෂා කරමින්

ඉකුත් ජූලි නව වැනි දින තලංගම පොල්දූව මංසන්ධියේ දී අරගලයට සමගාමීව පැවති උද්ඝෝෂණය අතරතුරදී යුද හමුදාවේ සහ පොලිසියේ ගිනි අවි ඇතුළු දේපළ රැසක් අස්ථානගත වී තිබූ බව උසස් පොලිස් නිලධාරියෙක් පැවැසීය.

මෙම අධි බල සන්නිවේදන උපකරණ කට්ටලයක් එදින අස්ථානගත වූ එකක් බවට සැක කරන බව පොලීසිය කියයි.

කිසියම් පුද්ගලයකු මේ රැගෙන විත් මෙපමණ කලක් නිවසේ තබාගෙනඑම ස්ථානයට ගෙනත් දමන්නට ඇතැයි සැක කරන බව පොලිස් නිලධාරියා කීය.

එම උපකරණ කට්ටලය සම්බන්ධයෙන් යුද හමුදා මූලස්ථානය දැනුම්වත් කිරීමට පියවර ගෙන ඇතැයි ද උසස් පොලිස් නිලධාරියා වැඩිදුරටත් පැවසීය.

පිළියන්දල පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සනත් රංජිත් මහතාගේ උපදෙස් මත අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක දිනේශ් හෙට්ටිආරච්චි මහතා පරීක්ෂණ පවත්වයි.



දංඕවිට

# කඳු මුදුනේ නවතා තිබූ පොලිස් ජීප්රිය නුවර පාරට පෙරළේ

**වේයන්ගොඩ විශේෂ සහ කොටදෙනියාව සමූහ**

දංඕවිට පොලීසියේ ජීප් රථයක් පෙරේදා 17 පස්වරුවේ වේවැල්දෙනිය ප්‍රදේශයේ කඳු මුදුනක නවතා තිබිය දී එය පහළට පෙරළී ගොස් කොළඹ-මහනුවර ප්‍රධාන මාර්ගයට වැටී බරපතළ හානි සිදු වී ඇත. පොලිස් නිලධාරීන් පිරිසක් කිසියම් රාජකාරි කටයුත්තක් සඳහා වේවැල්දෙනිය නගරාසන්නයේ කඳු මුදුනක පිහිටි ස්ථානයකට ගොස් ජීප් රථය

නවතා බැස ගොස් සිටිය දී එය කන්දෙන් පහළට පෙරළී ගොස් කොළඹ-මහනුවර ප්‍රධාන මාර්ගයට වැටී ඇති බව මූලික පොලිස් පරීක්ෂණවලදී හෙළි වී ඇත. කිසියම් යාන්ත්‍රික දෝෂයක් හේතුවෙන් අනතුර සිදු වී ඇති බවත් පරීක්ෂණවලදී හෙළි වී ඇත.

ජීප් රථය කොළඹ-මහනුවර ප්‍රධාන මාර්ගයට වැටුණු අවස්ථාවේ මාර්ගයේ ධාවනය වූ වෙනත් වාහනයක ගැටුණා නම් ජීවිත හානි පවා සිදු වීමට බොහෝ ඉඩ තිබූ බව ප්‍රදේශවාසීහු පිරිසක් පැවසූහ. ගම්පහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජගත් රෝහණ මහතාගේ උපදෙස් පරිදි පොලිස් නිලධාරී පිරිසක් වැඩිදුර පරීක්ෂණ පවත්වාගෙන යති.

# කුකුළු මස් අස්සේ අයිස් විකුණලා



කල්එළිය

**වේයන්ගොඩ විශේෂ සහ කොටදෙනියාව සමූහ**

කල්එළිය නගරයේ කුකුල් මස් කඩයක අයිස් මත් ද්‍රව්‍ය මිලි ග්‍රෑම් පන් දහස් එකසිය හතළිහක් සඟවා ගෙන තිබියදී පුද්ගලයන් දෙදෙනෙකු සමඟ අත්අඩංගුවට ගත් බව පල්ලෙවෙල පොලීසිය පවසයි.

එහි පොලිස් නිලධාරීන් පිරිසක් පෙරේදා 17 පස්වරුවේ කල්එළිය නගරයේ ප්‍රාථමික විද්‍යාලය ඉදිරිපිට පවත්වා ගෙන යන කුකුල් මස් කඩයක් පරීක්ෂා කිරීමේදී එහි කුකුල් මස් පැකට් අස්සේ සඟවා තිබූ අයිස් ග්‍රෑම් පහයි මිලි ග්‍රෑම් සීයක් සමඟ එහි හිමිකරුවාත්, එහි සේවකයෙකු සන්තකයේ තිබී අයිස් මිලි ග්‍රෑම් හතළික් සමඟ එම පුද්ගලයාත් අත් අඩංගුවට ගත් බව ද පොලීසිය කීය.

මොවුන් කාලයක් තිස්සේ කුකුල් මස් කඩය තුළ මත් ද්‍රව්‍ය සඟවා ගෙන අලෙවි කර ඇති බවට පරීක්ෂණවලදී හෙළි වී ඇති බවද පොලීසිය කියා සිටියේය.

ගම්පහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජගත් රෝහණ හා අත්තනගල්ල සහකාර පොලිස් අධිකාරී ප්‍රසාද් ප්‍රනාන්දු යන මහත්වරුන්ගේ උපදෙස් පරිදි පල්ලෙවෙල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඉන්දික සංජීව මහතාගේ මෙහෙයවීම යටතේ එහි පොලිස් සැරයන් වරුන් වන ප්‍රදීප් 48922, වසන්ත 64885 හා පොලිස් කොස්තාපල් දංගොල්ල 78933 යන මහත්වරු වැටලීමට සහභාගි වූහ.



වේයන්ගොඩ

# කෙසෙල් කැන් හොරකමට අත්හිටුවූ සිර දඬුවම්

**ගම්පහ සමූහ - ටෝනි කරුණානායක**

**වේයන්ගොඩ, කොරසෙ ප්‍රදේශයේ ඉඩමකට අයුතු ලෙස ඇතුළු වී රුපියල් 7,500ක් වටිනා කෙසෙල් කැන් 5ක් සොරකම් කිරීම සහ සොර බඩු අලෙවි කිරීම යන චෝදනා තුනට වරද භාර ගත් විත්තිකරුවකුට එක් චෝදනාවකට එක් මාසය බැගින්මාස තුනක සිරදඬුවමක් ගම්පහ මහේස්ත්‍රාත් මංජුල කරුණාරත්න මහතා නියම කළේය. විත්තිකරුට පෙර වැරදි නොමැතිවීම සැලකිල්ලට ගත් අධිකරණය එකී මාස තුනෙහි සිරදඬුවම වසර පහකට අත්හිටුවන ලෙසට නියම කළේය. එම අත්හිටවූ සිර දඬුවමට අමතරව අගතියට පත් පාර්ශ්වයට රුපියල් 7500 ක වන්දියක් ගෙවීමට ද නියම කෙරුණි. වන්දි මුදල් නොගෙවන්නේ නම් මාස 4 ක සිර දඬුවමක් නියම විය.**



දූසක

දස අත ම එක තැන

කළුතර

# අනියම් පෙම වැරදී පිහි පහරින් දිවිය නිමයි

**පොතුපිටිය සුමිත් ප්‍රේමතිලක**

කළුතර නගර මධ්‍යයේ පිහිටි බස් නැවතුම්පොළ අසල දී ඊයේ (18) පස්වරුවේ පිහි පාරවල් තුනක් ඇන පුද්ගලයකු ඝාතනය කර ඇතැයි කළුතර දකුණ පොලිසිය පවසයි. මියගොස් ඇත්තේ පන්විල ටෙරස්, කළුතර දකුණ ලිපිනයේ පදිංචිව සිටි ජී. එච්. තරිදු දර්ශන නමැති 30 හැවිරිදි පුද්ගලයකු බව පොලිසිය සඳහන් කරයි. ඝාතනය සිදු කර ඇති තැනැත්තාගේ බිරිඳ සමඟ මියගොස් ඇති තැනැත්තා අනියම් ඇසුරක් පවත්වන බවට මෙතෙක් කළ පරීක්ෂණවල දී තහවුරු ඇතැයි පොලිසිය කීය. දෙදෙනා අතර ඇති වූ බහින් බස් වීමකින් පසු ඝාතනය සිදුකළ තැනැත්තා සඟවාගෙන සිටි උල් පිහියක් රැගෙන පපුව සහ ගෙල ප්‍රදේශයට පිහි පහරවල් තුනක් එල්ල කර ඇතැයි සඳහන් වේ. බරපතළ තුවාල ලබා සිටි ඔහු 1990 සුවසැරියෙන් කළුතර ශික්ෂණ රෝහලට රැගෙන ගොස් ඇති බවත්, ඒ වන විටත් ඔහු මියගොස් සිටි බවත් රෝහල් ප්‍රකාශකයෙක් පැවසීය. ඝාතනය සිදුකළ තැනැත්තා ප්‍රදේශයෙන් පලාගොස් ඇති අතර, ඔහු සොයා පොලිස් කණ්ඩායම් කිහිපයක් යොදවා ඇති බව උසස් පොලිස් නිලධාරියෙක් කීය.

දිනමිණ දූසක

දෙහිවල

# නෝන වාට්ටුව ළඟ දී ඇල්ලූ නෝනා ළඟ ලක්ෂ 10ක කුඩු

**කොට්ටාව ප්‍රදීප් කුමාර**

අලෙවිය සඳහා රැගෙන යමින් තිබූ රුපියල් ලක්ෂ දහයකට ආසන්න වටිනාකමින් යුත් හෙරොයින් ග්‍රෑම් විස්සයි මිලිග්‍රෑම් දෙසීය අනූවක් සමඟ කාන්තාවක අත්අඩංගුවට ගත් බව බස්නාහිර පළාත දකුණ විෂ මත්ද්‍රව්‍ය ඒකකය පවසයි.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ දෙහිවල බඩෝවිට ප්‍රදේශයේ පදිංචි බඩෝවිට " සිට්ටි " නමැති (57) හැවිරිදි කාන්තාවකි.

හෙරොයින් තොගයක් රැගෙන බොරැල්ල රිජ්වේ ආර්යා ළමා රෝහල අසලට පැමිණෙන කාන්තාවක පිළිබඳ බස්නාහිර දකුණ විෂ මත්ද්‍රව්‍ය ඒකකයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ෂෙහාන් ආනන්ද මහතාට ලද තොරතුරක් මත සැකකාරිය අත්අඩංගුවට ගනු ලැබිණි.

සැකකාරිය සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනය කිරීමේ දී හෙරොයින් ජාවාරම සම්බන්ධයෙන් ගල්කිස්ස සහ දෙහිවල පොලිසි මගින් පවත්වාගෙන යන මහාධිකරණ නඩු දෙකක් පවතින බවට තොරතුරු අනාවරණය වූ බව පොලිසිය කියයි.

ඇය අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා බොරැල්ල පොලිසියට භාර දීමට නියමිතය .

මීගමුව

# රෝහලේ අටවැනි මහලෙන් වැටී රෝගී කත මරු දකී

**කටාන බර්ටි වීරසිංහ**

මීගමුව මහ රෝහලේ 19 වන වාට්ටුවේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටි කාන්තාවක් අටවැනි මහලෙන් ඇද වැටී ජීවිතක්ෂයට පත් ව තිබේ. මේ අවාසනාවන්ත ඉරණමට ගොදුරු වූයේ මීගමුව අලුත්වත්තේ පදිංචිව සිටි ටී. සෙල්වි නමැති 53 හැවිරිදි කාන්තාවකි. සිද්ධිය සම්බන්ධයෙන් මීගමුව පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

# සූර්පිට ඇවිත් ගම්පොළ ස්ටේෂමේ වැට කැඩූ අට දෙනාට වැඩ වරදී

**ගම්පොළ සමූහ-සුරංග දිල්හාන්**

රියදුරු පරීක්ෂණයට පැමිණි අධික ලෙස බීමත්ව සාද දමමින් ගම්පොළ දුම්රිය ස්ථානයට අයත් ආරක්ෂිත වැටක් කඩමින් සිටි තරුණයන් 8දෙනකුගම්පොළ පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන ඇත.

අපොස සාපෙළ විභාගයට පෙනී සිටි ගම්පොළ අවට ප්‍රදේශයේ පදිංචි තරුණ පිරිසක් රියදුරු පුහුණුව ලබා මෙම පරීක්ෂණයට පෙනී සිට ඇති බව පොලිසිය පවසයි.

විනාශයට පත්කළ දුම්රිය ආරක්ෂක වැටේ කැබලි දාහතරක් ද පොලිස් බාරයට ගෙන ඇති අතර දුම්රිය දෙපාර්තමේන්තුව මගින් එම හානියට පත් ආරක්ෂක වැටේ තක්සේරුවක් ගෙන මෙම සැකකරුවන් අට දෙනා ගම්පොළ අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ප්‍රදීප් රත්නායක මහතාගේ උපදෙස් මත කොට්ඨාස ප්‍රජා පොලිස් හා පරිසරය ඒකකයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඉන්දුල ඇතුළත්මුදලි මහතා ඇතුළු කණ්ඩායමක් මෙම සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබුණි.

මීරිගම

# ලයිට් නොකපා ඉන්න පගා ඉල්ලූ විදුලි සේවකයන්ට ගම්මුන්ගෙන් ගුටි පූජාවක්

**කොටදෙනියාව සමූහ එම්. පී. කුමාර**

අවසන් විදුලි බිලෙන් කොටසක් ද ගෙවා තිබිය දී නිවසක විදුලිය විසන්ධි කිරීමට පැමිණ එසේ නොකර සිටීමට රුපියල් දෙදහසකින් උදව්වක් කරන ලෙස ඉල්ලූ විදුලි බල මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකුගෙන් දෙදෙනෙකු ගම්වැසියන්ගේ ප්‍රහාරයට ලක්වීමේ සිද්ධියක් මීරිගම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී 16දා අනාවරණය විය.

මීරිගම මදුරුපිටිය ප්‍රදේශයේ නිවසක දී මෙම සිදුවීම සිදුවී ඇත්තේ ඉකුත් 15දාය. සැමියා නිවසේ නොසිටි අවස්ථාවක බිරිය මෙම සිද්ධියට මුහුණ පා ඇති අතර සිද්ධිය සැලවීමෙන් පසු එහි පැමිණි අසල්වැසියන්ගෙන් විදුලි නිලධාරීන්ට මෙම ප්‍රහාරය එල්ලවී ඇත. එක් අයෙකු පලා යද්දී සෙසු දෙදෙනා හොඳ හැටි පහරකෑමට ලක්ව ඇත.

මේ සම්බන්ධව මෙහිදී කරුණු දැක්වූ මීරිගම ප්‍රාදේශිය සභා මන්ත්‍රී කුමාර ගජනායක මහතා (ජාතික ජනතා පක්ෂය) ජනතාව දැඩි අසීරුවෙන් ජීවත්වන යුගයක මේ අන්දමින් ජනතාව නිකරුණේ පීඩාවට පත් කරන්නට රජයේ නිලධාරීන්ට ඉඩ නොදිය යුතු බව අවධාරණය කරනු ලැබීය.

විදුලි බල මණ්ඩලයේ නියෝජිතයකු මෙහි දී සඳහන් කළේ ඒ අන්දමට විදුලි බිල කොටසක් හෝ ගෙවා ඇත්නම්විදුලිය විසන්ධි කිරීමට බලයක් නැති බවයි.

# දෙහිවල-ගල්කිස්ස අයවැය සම්මතයි

**දෙහිවල ඩී පී. හේරත් සහ කොළඹ දකුණ සමූහ ගාමිණී රූපානන්ද**

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ 2023 වර්ෂය සඳහා වන අයවැය වැඩි ඡන්ද තිස් අටකින් සම්මත විය.

නගරාධිපති නාවලගේ ස්ටැන්ලි ඩයස් මහතා විසින් 2023 වර්ෂයට අදාළ අයවැය වාර්තාව සභාගත කරන ලද අතර, එදින දවස පුරාවට පැවැති දීර්ඝ විවාදයකින් පසු ඡන්ද විමසීමේ දී අයවැයට පක්ෂව ඡන්ද 41 ක් ද , විපක්ෂව ඡන්ද 4 ක් ද ලැබ වැඩි ඡන්ද 38කින් සභා සම්මත විය.

කටුනායක

# ස්වීඩන් පනින්න හැදූ ඉරාන සංගීතඥයාට ගුවන් තොටේ දී තනුව වරදී

**කටුනායක ටී. කේ. ජී. කපිල**

කූට ලෙස සකස් කළ ව්‍යාජ ගුවන් ගමන් බලපත්‍ර උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකාවට ඇතුළු වී ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවර වෙත පලා යෑමට තැත් කළ ඉරාන ජාතික ගුවන් මගීන් දෙදෙනකු ඊයේ අලුයම කටුනායක ගුවන් තොටුපළ පැමිණීමේ පර්යන්තයේ දී අත් අඩංගුවට ගත් ආගමන විගමන දෙපාර්තමේන්තු නිලධාරීන්, ඔවුන් පැමිණි ගුවන් යානයෙන්ම ආපසු පිටුවහල් කිරීමට පියවර ගෙන තිබේ.

මොවුන් අතරින් 41 හැවිරිදි එක් ඉරාන ජාතිකයකු එරට වෘත්තියෙන් සංගීතඥයෙකි. 50 හැවිරිදි අනෙක් ඉරාන ජාතිකයා එරට වෘත්තීය ජායාරූප ශිල්පියෙකි.

මොවුන් ඊයේ අලුයම 3.30ට අල් ජසීරා ගුවන් සේවයේ ජේ. 9551 දරන ගුවන් යානයෙන් කුවේට් සිට කටුනායක ගුවන් තොටුපළ වෙත පැමිණ තිබුණි.

මොවුන් කටුනායක ගුවන් තොටුපළ සිට ශ්‍රී ලංකාවට ඇතුළු වීම සඳහා වීසා අනුමැතිය ලබා ගැනීමට මෙම නෝර්වීජියානු ගුවන් ගමන් බලපත්‍ර ඉදිරිපත් කළ අවස්ථාවේ දී ආගමන විගමන දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් මේවා ව්‍යාජ බවට හඳුනා ගැනීමෙන් අනතුරුව, කටුනායක ගුවන් තොටුපළ දේශසීමා ආවේක්ෂණ ඒකකයේ නිලධාරීන් වෙත ද යොමු කර, මෙම ගුවන් ගමන් බලපත්‍ර ව්‍යාජ ඒවා බවට තහවුරු කර ගෙන තිබේ.

මෙම ඉරාන ජාතිකයන් දෙදෙනා ශ්‍රී ලංකාව තුළ දෙදිනක් රැඳී සිටීමෙන් අනතුරුව ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවර වෙත පලා යෑමට සැලසුම් කර තිබුණි.

ඉන්පසුව මෙම ඉරාන ජාතිකයන් දෙදෙනා ඔවුන් පැමිණි අල් ජසීරා ගුවන් සේවයේ ජේ. - 9552 දරන ගුවන් යානයෙන්ම 12/17 දින අලුයම 05.28 ට කුවේට් වෙත පිටුවහල් කිරීමට පියවර ගෙන තිබුණි.



මේ පිළිබඳව විමර්ශන කටයුතු අත් අඩංගුවට ගැනීම සහ මොවුන් මෙරටින් පිටුවහල් කිරීම ප්‍රධාන ආගමන විගමන නිලධාරී ආර්. ආර්. ජී. බී. රණසිංහ මහතාගේ උපදෙස් සහ අධීක්ෂණය යටතේ එම්. එම්. එස්. එන්. ගුණසේකර සහ එම්. ඒ. හෙට්ටිආරච්චි යන මහත්වරුන් විසින් සිදු කර තිබුණි.

# අම්බලන්ගොඩ නගර සභා අයවැයත් සම්මතයි

**අම්බලන්ගොඩ සමූහ සහ ගාල්ල දිස්ත්‍රික් සංචාරක**

අම්බලන්ගොඩ නගර සභා නව නගර සභාපති කමල් වැල්ලගේ මහතා (පො. ජ. පෙ.) විසින් පළමු වරට ඉදිරිපත් කරන ලද 2023 වර්ෂයේ අයවැය වැඩි ඡන්ද හතකින් සම්මත විය. අයවැයට පක්ෂව ඡන්ද එකොළහක් ලැබුණ අතර නගර සභාවේ විපක්ෂ නායක ජේ. ඩබ්ලිව්. ජයන්ත මහතා (එ.ජා.ප.) සහ එම පක්ෂයේ තවත් මන්ත්‍රීවරියක් පොදු පෙරමුණ සමඟ අයවැයට පක්ෂ වූහ. එක්සත් ජාතික පක්ෂයේ එක් මන්ත්‍රීවරියක ඡන්දය පාවිච්චි කිරීමෙන් වැළකී සිටියා ය.



# බෙන්තොට දී මත් සාදයකට සෙට් වුණු කොළඹ හාදයෝ 30ක් පොලිස් කූඩුවේ

අලුත්ගම තුසිත කුමාර ද සිල්වා
බෙන්තොට සිරිසේන මද්දෙවිතාන හා
ඉඳුරුව සමූහ ඇම්. පී. මුනිදාස

බෙන්තොට කෝම්මල බෝධි මළුව ප්‍රදේශයේ සංචාරක නිකේතනයක් අන්තර්ජාලයෙන් මුදල් ගෙවා වෙන්කරගෙන වසර අවසාන සාදයකට එක්ව සිටි කොළඹ සිට පැමිණි තිස්දෙනකුගෙන් යුත් කණ්ඩායමක් අයිස් මත්ද්‍රව්‍ය මිලි ග්‍රෑම් 200ක් සමඟ බෙන්තොට පොලිසිය පෙරේදා රාත්‍රියේ අත්අඩංගුවට ගෙන තිබේ. ඉරිදා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගය ට සූදානම් වෙමින් සිටි සිසු දරු දැරියන්ට හා අවට නිවැසියන්ට හිංසා වන වන අයුරින් විවිධ ඝෝෂාකාරී ශබ්ද නගමින් හැසිරී ඇති මෙම පිරිස පිළිබඳ ගම්වාසීන් බෙන්තොට පොලිසියට කළ දැනුම්දීම මත කළ වැටලීමේ දී අයිස් විෂ මත්ද්‍රව්‍ය පාවිච්චි කොට සාදයක නිරතව සිටි මෙම තරුණයන් අතරින් ඇතැමුන් තදබල ලෙස අයිස් පානය කර සිටි බවත් වැටලීම කළ උසස් පොලිස් නිලධාරියෙක් පැවැසීය. බෙන්තොට පොලිසිය එම අවස්ථාවේ මෙම පිරිස අත්අඩංගුවට ගන්නා විටත් තරුණයන් තිස්දෙනා සන්තකයේ එම විෂ මත්ද්‍රව්‍ය මිලිග්‍රෑම් 50ත්, මිලි ග්‍රෑම් 100 අතර ප්‍රමාණයේ කුඩා පැකට්වල මෙම අයිස් මිලි ග්‍රෑම් දෙසිය තිබී පොලිසිය අත්අඩංගුවට ගෙන ඇත.

වයස අවුරුදු 25 ත් 35 අතර වයස්වල පසුවන මෙම සැකකාර තරුණයන් වත්තල, මෝදර මට්ටක්කුලිය, දෙහිවල, මරදාන මාලිගාවත්ත මාබෝල, සංඝරාජ මාවත ප්‍රදේශවල පදිංචිකරුවන්වන ඉස්ලාම් සහ ද්‍රවිඩ ජාතිකයන් පිරිසක් ලෙස පොලිසිය හඳුනාගෙන තිබේ. මෙම වැටලීමේදී අත්අඩංගුවට ගත් තරුණයන් 30 දෙනා අතර කොළඹ ප්‍රදේශ කීපයක ගොඩනැඟිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යෘත්තියේ නියුතු සහ කොළඹ වරායේ සේවය කරන කීප දෙනෙකු ද සිටින බව පොලිසිය අනාවරණය කර ගෙන තිබේ. බෙන්තොට කෝම්මල ප්‍රදේශයේ සංචාරක නිකේතනයක් මේ සාදය සඳහා රුපියල් හැට දහසක මුදලක් ගෙවා දින දෙකකට ලබාගෙන ඇත්තේ පසුගිය 16වන දින බව පොලිසිය කියයි. බෙන්තොට පොලිසිය අත්අඩංගුවට ගත් සැකකාර තරුණයන් තිස් දෙනාට බෙන්තොට පොලිස් සිර මැදිරියේ ඉඩකඩ මදි වූ හෙයින් ඉන් පහළොස් දෙනෙකු බෙන්තොටටත් සෙසු සැකකරුවන් පහළොස් දෙනා කොස්ගොඩ පොලිස් සිර මැදිරියේ රඳවා තැබීමටත් කටයුතු කළ බව බෙන්තොට පොලිස් ස්ථානාධිපතිවරයා පැවසීය.

කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වයි. එල්. ලිලිවංශ, සහකාර පොලිස් අධිකාරී සම්පත් බණ්ඩාර යන මහත්වරුන්ගේ උපදෙස් මත බෙන්තොට පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක තුෂාර කාරියවසම්, උප පොලිස් පරීක්ෂක ජයලාල්, පොලිස් සැරයන්වරුන් වන සිල්වා (2889) සිසිර (553) පොලිස් කොස්තාපල්වරුන් වන සනත් (58468) ගුණවර්ධන (1448) ගමගේ (70765) චතුරංග (67091) හාතිය (103522) යන මහත්වරු මෙම වැටලීම සිදුකර සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබේ. සැකකරුවන් බලපිටිය අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

දිනමිණ දසත
දස අත ම එක තැන

# සරසවි ඇදුරාට නින්ද ගිහින් මෝටර් රිය මුහුදේ පාවෙයි



මාතර, තංගල්ල ප්‍රධාන මාර්ගයේ ගමන් කරමින් තිබූ මෝටර් රථයක් ඊයේ (18) දහවල් වැල්ලමඩම ප්‍රදේශයේ දී මුහුදට වැටී තිබේ. රුහුණු විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයකු වන 50 හැවිරිදි අයකු මෙම අනතුරින් තුවාල ලබා මාතර මහ රෝහලට ඇතුළත් කර ඇත. ඔහුට නින්ද යාම හේතුවෙන් මේ අනතුර සිදුව ඇති බව පොලිසිය සැක පළ කරයි.



# උතුවන්කන්දේ දී ඇල්ලූ ත්‍රිරෝද රියේ අයිස්

අරණායක සමූහ
රෝහණ ජයරත්න

කොළඹ සිට මාවනැල්ල දෙසට අයිස් මත්ද්‍රව්‍ය ත්‍රිරෝද රථයකින් ප්‍රවාහනය කරමින් සිටි තරුණයන් දෙදෙනකු අයිස් මිලිග්‍රෑම් 11600ක් සමග 18 දා පාන්දර උතුවන්කන්ද ප්‍රදේශයේ දී මාවනැල්ල පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. මාවනැල්ල පොලිස් විශේෂ උප ඒකකයට ලද තොරතුරක් මත සිදුකළ වැටලීමේදී කොළඹ අළුත්කඩේ ප්‍රදේශයෙ සිට රැගෙන එමින් සිටි රිටිගහවත්ත, මහවත්ත පදිංචි 30 සැකකරු සන්තකයේ තිබි අයිස් මිලිග්‍රෑම් 5800ක් ද, උසාවිය පාර මාවනැල්ල ලිපිනයේ පදිංචි 25 හැවිරිදි සැකකරු සන්තකයේ තිබි අයිස් මිලිග්‍රෑම් 5800 ක් ද අත්අඩංගුවට ගෙන ඇති බව පොලිසිය පැවසීය. සැකකරුවන් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. මාවනැල්ල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක ලසන්ත කළුආරච්චි මහතාගේ උපදෙස් මත වැටලීම සිදුකරනු ලැබීය

# කුරුඳු මුදලාලිගේ ඝාතකයා අවු. 3කට පසු කොටු

බණ්ඩාරගම - බිමල් ජයසිංහ සහ
අයි. එම්. වී. චන්ද්‍රසිරි ගුණසේකර
ඇල්පිටිය සමූහ

ඇනුම් 27ක් එල්ල කර ප්‍රසිද්ධ ව්‍යාපාරිකයකු ඝාතනය කිරීමේ සිද්ධියක සැකකරු වසර 3කට පසු අත්අඩංගුවට ගත් බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ කොට්ඨාසය කියයි.

මෙලෙස ඝාතනයට ලක්ව ඇත්තේ ඇල්පිටිය අටකොහොට සපුමල් උයන පදිංචිව සිටි පේදුරුහේවා සෝමතිලක (50) පොඩි මල්ලි හෙවත් කුරුඳු මුදලාලි නමැති දෙදරු පියකුය.

2019 අප්‍රේල් 28 වැනි දින රාත්‍රී 11.30ට පමණ ඝාතනයට ලක්වූ පුද්ගලයා පදිංචිව සිටි නිවෙස ඉදිරිපිටදී මේ ඝාතනය සිදු වී තිබිණි. ඝාතනයට ලක්වූ ව්‍යාපාරිකයා සිය නිවෙසට මඳක් දුරින් පිහිටි අවමංගල්‍ය නිවෙසකට සහභාගි වී යතුරුපැදියෙන් යළි නිවෙස කරා පැමිණෙමින් සිටියදී මේ පිහි ප්‍රහාරය එල්ල වී තිබූ අතර බරපතළ තුවාල ලබා සිටි ව්‍යාපාරිකයා ඇල්පිටිය රෝහලට ඇතුළත් කරන විට මියගොස් තිබූ බව පොලිසිය කියයි.

අදාළ ඝාතනය සම්බන්ධයෙන් ඇල්පිටිය පොලිසිය පරීක්ෂණ සිදු කළද කිසිදු සැකකරුවකු අත්අඩංගුවට ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ කොට්ඨාසයේ අධ්‍යක්ෂක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි හේමාල් ප්‍රශාන්ත මහතාට අදාළ සිද්ධියේ විමර්ශන කටයුතු භාරදී තිබිණි. ඒ සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වූ එම කොට්ඨාසයේ උප පොලිස් පරීක්ෂක ඩබ්ලිව්.ඒ. ගයන්ත මහතා ව්‍යාපාරිකයාගේ බිරිය ඇතුළු පුද්ගලයන් විස්සකට ආසන්න ප්‍රකාශ ගෙන විමර්ශන ආරම්භ කිරීමට කටයුතු කළ අතර ව්‍යාපාරිකයා යටතේ සේවය කරන පුද්ගලයන් කීපදෙනකුගේ ප්‍රකාශද ඒ අතර වන බව පොලිසිය කියයි. ව්‍යාපාරිකයාගේ මරණය සම්බන්ධයෙන් පැවති පශ්චාත් මරණ පරීක්ෂණයේදී ඔහුට ඉවක් බවක් නැතිව එල්ල කරන ලද පිහි පහරවල් පිළිබඳ අවධානය යොමු කළ විමර්ශන භාර උප පොලිස් පරීක්ෂකවරයා කිසියම් පුද්ගලයකු පළි ගැනීමේ චේතනාවකින් කළ එකක් බවට අනුමාන කරමින් ඒ ඔස්සේ පරීක්ෂණ සිදු කරන්නට විය.



ලබාගත් ප්‍රකාශවලින් ව්‍යාපාරිකයා සමග අමනාපකම් තිබෙන පුද්ගලයකු සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් අනාවරණ නොවුණත් තම සැකය බැහැර නොකළ විමර්ශන නිලධාරියා දිගින් දිගටම ඒ සම්බන්ධයෙන් විමර්ශන කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපාරිකයා ළඟ රියැදුරකු ලෙස සේවය කර ඉවත් වූ පුද්ගලයකු සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් සිය පරීක්ෂණ මෙහෙයවන්නට වූ බව පොලිසිය කියයි. එම පුද්ගලයා සම්බන්ධයෙන් පසුවිපරම් සිදු කර සොයා බැලීමේදී ඔහු මේ ආකාරයෙන්ම පුද්ගලයකුගේ සිරුරට විසි දෙවතාවක් පිහියකින් ඇන ඝාතනය කිරීමේ සිද්ධියේ ප්‍රධාන සැකකරු බවට අනාවරණය කර ගැනීමට හැකි වූ බව පොලිසිය කියයි. ඒ අනුව එම පුද්ගලයා අත්අඩංගුවට ගෙන කරන ලද දීර්ඝ ප්‍රශ්න කිරීමේදී කුරුඳු මුදලාලි යටතේ රියැදුරකු ලෙස සේවය කරන අවධියේදී තමන් නිසි අයුරින් සේවයේ නොයෙදෙන බව පවසමින් සේවයෙන් ඉවත් කළ බවත් එදින තමන් කොයි මොහොතක හෝ මුදලාලිගෙන් පළි ගන්නා බවට සිතට ගත් බවත් සැකකරු ප්‍රකාශ කළ බව පොලිසිය කියයි.

2019 අප්‍රේල් 28 වැනි දින අටකොහොට ගම් ප්‍රදේශයේ අවමංගල්‍ය නිවෙසක සිටියදී මුදලාලි පැමිණෙන අයුරු දැකීමෙන් පසු තමන්ගේ රැකියාව අහිමි කිරීමේ සිද්ධිය මතකයට ආ බවත් පසුව නිවෙසට පැමිණ උල් පිහියක් රැගෙන මුදලාලිගේ නිවෙස ආසන්නයේ රැක සිට ඔහු නිවෙස වෙත පැමිණෙද්දී පිහියෙන් ඇන්න බවත් සැකකරු පාපෝච්චාරණය කරන්නට වූ බව පොලිසිය කියයි. සැකකරුගේ ප්‍රකාශ මත ඝාතනයට යොදාගත් උල් පිහිය ඇල්පිටිය පහළගොඩ ඇළක් අසල කැලෑරොදකට වීසි කර තිබියදී සොයාගත් බව පොලිසිය කියයි.

ඇල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත්කිරීමෙන් පසු මෙම මස 29 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස ඇල්පිටිය වැඩබලන මහේස්ත්‍රාත් ජනක රුවන්පුර මහතා විසින් නියෝග කර තිබේ.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති ප්‍රසාද් රණසිංහ මහතාගේ උපදෙස් මත මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ කොට්ඨාසයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි හේමාල් ප්‍රශාන්ත, මහතාගේ මෙහෙයවීමෙන් උප පොලිස් පරීක්ෂක ඩබ්ලිව්.ඒ. ගයන්ත මහතා ඇතුළු කණ්ඩායමක් පරීක්ෂණ පවත්වයි.



හික්කඩුව

# පොලිස් ජීවිතාරක්ෂකයෝ මුහුදේ ගිලුණු රුසියානු කත බේරා ගනිති

අම්බලන්ගොඩ සමූහ
ආර්. ඤාණදාස

හික්කඩුව නාරිගම මුහුදේ පීනමින් සිටි විදෙස් සංචාරක කාන්නතාවක ඉකුත් 17 දින පෙරවරුවේ ඈත මුහුදට ගසා ගෙන යමින් සිටිය දී එම ස්ථානයේ රැඳී සිටි පොලිස් ජීවිතාරක්ෂක කණ්ඩායමක් මුහුදට පීනා ගොස් ඇගේ ජීවිතය බේරා ගෙන ඇතැයි හික්කඩුව සංචාරක පොලීසිය කියයි.

මෙම සිද්ධියෙන් ජීවිතය බේරා ගෙන ඇත්තේ රුසියාවේ සිට පැමිණී ලිලියා නමැත්තියකි. ඇගේ ජීවිත බේරාගෙන තිබෙන්නේ හික්කඩුව සංචාරක පොලීසියට අනුයුක්තව සේවය කරන පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ පොලිස් කොස්තපල්වරුන් වන හුලන්ගමුව ( 87308) සමන් ( 81212) කුමාර ( 85150) අබේසිංහ ( 87584) සහ මතුරංග (94884) යන මහත්වරුන් විසිනි. මෙම පොලිස් කණ්ඩායම ඒ වෙනුවෙන් මෙහෙයවා තිබෙන්නේ හික්කඩුව සංචාරක පොලිස් ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක සුනිල් චන්ද්‍රසිර මහතා විසිනි.

# ජ'පුර සරසවි සිසුවා වීරවිල වැවේ ගිලේ

තිස්සමහරාම සමූහ
ඒ. ඒ. ජේමසිරි

විශ්වවිද්‍යාල මිතුරන් පිරිසක් සමඟ විරවිල වැවේ දිය නෑමට ගිය ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පළමු වසරේ කලා පීඨයේ සිසුවකු දියේ ගිලී පෙරේදා (17) සවස මියගොස් තිබේ.

මිය ගොස් ඇත්තේ අංක 22 බී, දලුක්හිල්ල, දෙමටවැල්හින්න, බදුල්ල යන ස්ථානයෙහි පදිංචි සචින්ත පියුමාල් නමැති සිසුවා ය.

මෙම මියගිය සිසුවා ඇතළු තිහක පමණ පිරිසක් තිස්සමහරාම දෙබරවැව ගඟසිරිපුර ප්‍රද්ශයේ පදිංචි විශ්වවිද්‍යාල මිතුරකුගේ නිවසට පැමිණ තිබේ. එහිදි ඔවුන් සවස හතරට පමණ විරවිල වැවට දිය නෑමට ගොස් ඇති අතර, ඔවුන් දිය නා ගොඩට විත් බලන විට මියගිය අය අතුරුදන් ව ඇති බව දැන ගන්නට ලැබී තිබේ. එහි දි එම පිරිස මිතුරා සෙව්වත් ඔවුන්ට සොය ගැනීමට නොහැකි වී ඇති අතර පසුව ඔවුන් 119 හදිසි දුරකථන ඇමැතුම් අංශයට කථාකර සිද්ධිය පවසා තිබේ.

ඒ අනුව විරවිල පොලිසිය එම ස්ථානයට පැමිණ පරික්ෂා කිරිමේ දි විරවිල වැවේ පිටවාන් ඇළේ තිබි මියගිය අයගේ මළසිරුර රාත්‍රී 8.00 ට පමණ සොයා ගෙන තිබේ. විරවිල පොලිසිය මේ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදු කරයි.

# තෝලංගමුවටත් ඵලදායිතා සම්මාන



ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරනු ලබන "ජාතික ඵලදායිතා සම්මාන 2020 තරඟාවලියේ" පාසල් අංශයෙන් උසස් පෙළ දක්වා වූ කාණ්ඩයේ තෙවැනි ස්ථානය දිනා ගැනීමට තෝලංගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය විද්‍යාලය සමත් වී තිබේ. අගමැති දිනේෂ් ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් කම්කරු හා විදේශ රැකියා ඇමැති මනුෂ නානායක්කාර මහතාගේ සහභාගිත්වයෙන් ජාතික ඵලදායිතා සම්මාන ප්‍රදානෝත්සවය ඉකුත්දා කොළඹ අරලියගහ මන්දිරයේදී පැවැත්විණි. එහිදී තෝලංගමුව මධ්‍ය විද්‍යාලයට හිමි සම්මානය ඇමැති මනුෂ නානායක්කාර මහතා විසින් විද්‍යාලයේ විදුහල්පති ජේ. ඒ. අයි. යු. ජයකොඩි මහතා වෙත ප්‍රදානය කරනු ලැබූ අයුරු. පාර්ලිමේන්තු මන්ත්‍රී සුමිත් උඩුකුඹුර, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම් එම්. පී. ඩී. යු. මාපා පතිරණ, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂිකා චම්පිකා ඩී. ධර්මසේන, අධ්‍යක්ෂ ජී. යූ. කේ. අල්ගේවත්තගේ යන මහත්ම මහත්මීහු මේ අවස්ථාවට එක්ව සිටියහ.

# ස්කූටරයෙන් ඇවිත් කතුන් බය කරන නිරුවත් භූතයෙක්

රක්වාන-ඉන්දික සී. කුමාර

ගොඩකවෙල, බලවින්න, මීගහමඩයාය ගමට පිවිසෙන අතුරු මාර්ගයේ පාළු ස්ථානවල නිරුවතින් සිට කාන්තාවන් බිය කරන පුද්ගලයෙකු ගැවසෙන බවට තොරතුරු වාර්තා වු බව ගොඩකවෙල පොලිසිය සඳහන් කරයි. මෙම පුද්ගලයා ස්කුටර් වර්ගයේ යතුරුපැදියකින් පැමිණ මෙම ක්‍රියාවේ නිරත වන බව කාන්තාවන් පැවසු බව ද පොලිසිය පවසයි. ගොඩකවෙල බලවින්න, මීගහමඩයාය, රාජපක්ෂ වත්ත නමැති ප්‍රදේශයේ දිවා කාලයේ මාර්ගයේ තනිව ගමන් කරන කාන්නාවන් කිහිප දෙනෙකු ම නිරුවතින් සිටින පිරිමි පුද්ගලයා දැක බියට පත්ව ඇති බව වාර්තා විය. එලෙස නිරුවතින් සිටින පුද්ගලයා දැක බියෙන් කෑගසන කාන්තාවන්ගේ හඬත් සමඟ නිරුවත්ව සිටින පුද්ගලයා ස්කූටරයේ නැඟ පලා යන බව ද ගම්වැසියන් පොලිසියට පවසා ඇත. සිදුවීමට සම්බන්ධ සැකකරු අත්අඩංගුවට ගැනීමට පියවර ගන්නා බව ගොඩකවෙල පොලිසිය පැවසීය.

ගම්පොළ

# බාලිකාවේ මුර අන්කල්ලා රෑට රෑට ගංජා පාටි දාලා

ගම්පොළ සමූහ-සුරංග දිල්හාන්

ගම්පොළ නගරයේ ප්‍රධාන බාලිකා විද්‍යාලයක පාසල් මුරකරු සමඟ සිව්දෙනකු එකතුව ගුරු විවේකාගාරයේ ගංජා පානය කරමින් සිටිය දී ගම්පොළ කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් සිකුරාදා රාත්‍රී අත්අඩංගුවට ගෙන ඇත. පාසල් මුරකරු සමඟ ගේට්ටු මුරකරු ද මෙම සිව්දෙනා අතර සිටින බව පොලිසිය පවසයි.

මොවුන් දීර්ඝ කාලයක සිට පාසලට මත්ද්‍රව්‍ය රැගෙන විත් රංචු ගැසී ඒවා පානය කරන බව පොලිසිය වෙත ලැබී තිබූ තොරතුරු මත සිකුරාදා රාත්‍රියේ සිදු කළ විශේෂ වැටලීමකදී මොවුන් අත්අඩංගුවට පත්ව ඇත.

එම අවස්ථාවේ ඔවුන් පානය කරමින් සිටි ගංජා සුරුට්ටු හතරක් ද පොලිස් භාරයට ගෙන ඇත. මෙම පාසලේ කාන්තා නේවාසිකාගාර ද ඇති අතර මව්පියන් විසින් ඒ පිළිබඳව ද පොලිසිය දැනුවත් කර තිබී ඇත. ගම්පොළ කොට්ඨාස භාර පොලිස් අධිකාරි ප්‍රදීප් රත්නායක, මූලස්ථාන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ලක්සිරි ප්‍රනාන්දු යන මහත්වරුන්ගේ උපදෙස් මත වැටලීම සිදුකර තිබේ.

සැකකරුවන් ගම්පොළ අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

# ගම්පහ - ගාල්ල නමගිය හොර ඩබලක් තඹුත්තේගම දී කොටු වෙති



තලාව සමූහ-ධර්මකීර්ති

ගාල්ල ගම්පහ ප්‍රදේශවල නමගිය අපරාධකරුවන් දෙදෙනෙකු මංකොල්ලකෑ භාණ්ඩ සමග ඉකුත් 16දා අත්අඩංගුවට ගැනීමට තඹුත්තේගම පොලිසිය සමත් වී තිබේ.

ඊට සහාය දැක්වූ තඹුත්තේගම මැහිඇල්ලෑව මල්වානේගම පුද්ගලයන් දෙදෙනකු ද තඹුත්තේගම දී අත්අඩංගුවට ගෙන තිබෙන බව පොලිසිය පවසයි.

ප්‍රශ්නකිරීම්වලදී ඔවුන් විසින් තඹුත්තේගම ප්‍රදේශයේ දී මංකොල්ලකෑ බවට සැක කෙරෙන ව්‍යාජ අංක තහඩු සහිත යතුරුපැදි තුනක් රූපවාහිනි යන්ත්‍ර තුනක් සමග

හෙරොයින් ග්‍රෑම් 4 මිලිග්‍රෑම් 450 ද මංකොල්ල කෑම්වලට උපයෝගි කරගත් කඩු දෙකක් ද අත්අඩංගුවට ගෙන තිබේ. සැකකරුවන් තඹුත්තේගම මහේස්ත්‍රාත් නුවන් කෞෂල්‍ය මහතාගේ නියෝගයක් මත මෙම මස 21 දා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කෙරුණි.

# අසැබි ඡායාරූප ප්‍රසිද්ධ කරනවැයි සෙබළිය බය කළ බාබර් දැලේ

පොල්ගහවෙල

ගයාන් කුමාර වීරසිංහ

නිරුවත් ඡායාරූප අන්තර්ජාලය ඔස්සේ ප්‍රසිද්ධ කරන බව කියමින් යුද හමුදා සෙබළියක බිය ගන්වමින් ඇයට තමා සමඟ එකට සිටීමට එන ලෙසට තර්ජනය කළ රූපලාවණ්‍යාගාරයක් පවත්වාගෙන යන කරණවෑමියකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අත්අඩංගුවට ගෙන තිබේ.

පොල්ගහවෙල කුලීපිටියේ පදිංචිකරුවකු වන 24 හැවිරිදි තරුණ කරණවෑමියකු මෙසේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අත්අඩංගුවට ගෙන ඇත්තේ පසුගිය සිකුරාදාය.

මේ සෙබළිය කෑගල්ලේ පදිංචිකාරියකි. ඇය සිය පාසල් කාලයේ මිතුරකු සමඟ මෑතකදී පෙමින් බැඳී සිට ඇත. ඇගේ ඒ පෙම්වතාද රූපලාවණ්‍යාගාරයක් පවත්වාගෙන යන කරණවෑමියෙකි. දෙදෙනා අතර එහිදී තම තමන්ගේ නිරුවත් ඡායාරූප හුවමාරු වී ඇති බව සඳහන්ය. එම නිරුවත් ඡායාරූප කිහිපයක් කෑගල්ලේ රූපලාවණ්‍යාගාරයේ කරණවෑමියා අතට පත්වී තිබේ. එම ඡායාරූප ඇයට සමාජ මාධ්‍ය ජාල ඔස්සේ යොමු කරමින් ඔහු ඇයට තර්ජනය කර ඇති බව විමර්ශනවලින් හෙළි වී තිබේ. එහිදී හෙළි වී ඇත්තේ ඇගේ පෙම්වතා සහ පොල්ගවෙල කරණවෑමියා මිතුරන් බවය.

පෙම්වතා විසින් පොල්ගහවෙල කරණවෑමියාට එම ඡායාරූප දී ඇති බවද විමර්ශනවලින් අනාවරණය වී තිබේ.

ඒ අනුව පොල්ගහවෙල කරණවෑමියාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අත්අඩංගුවට ගෙන පොල්ගහවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත. එහිදී ඔහුව ඇප මත මුදාහැර තිබේ.

ඇය විසින් මේ ඡායාරූප සිය කැමැත්තෙන්ම ගෙන පෙම්වතාට දී ඇති බැවින් එම ඡායාරූප බලහත්කාරයෙන් ගත් ඒවා නොවන බැවින් නීතිය හමුවේ සැකකරුට වාසිසහගත තත්ත්වයක් ඇති වී තිබෙන බවත් එබැවින් මෙවැනි ක්‍රියාවලට යොමු වීමේදී තරුණ කාන්තාවන් ඒ ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතු බව පොලිස් මූලස්ථානයේ උසස් පොලිස් නිලධාරියෙක් සඳහන් කළේය.

# මිල ගණන් කැඳවීමයි

## අභ්‍යාස පොත් මිලදී ගැනීම

තංගල්ල ප්‍රාදේශීය සභාව සඳහා පිටු 80 CR තනි රූල් අභ්‍යාස පොත් 10000 ක් පමණ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් "**අභ්‍යාස පොත් සඳහා මිල ගණන්**" යනුවෙන් ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කරමින් ලියාපදිංචි තැපෑලෙන් 2022.12.29 දිනට පෙර පහත ලිපිනයට යොමු කරන්න.

**සභාපති,**
**තංගල්ල ප්‍රාදේශීය සභාව,**
**නෙටොල්පිටිය.**
**දු.අ. 047-2240475**

ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රා. ලේකම් කොට්ඨාසයේ 360 රදවඩුන්න ග්‍රාම සේවා වසමේ 28C, නුවර පාර, රදවඩුන්න ලිපිනයේ පදිංචි **ආර්. එම්. අයිවන් ජයරත්න** වන මම මෙතැන් සිට **රණසිංහ මුදියන්සේලාගේ අයිවන් ජයරත්න** යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත්, මෙයින් දැනුම් දෙමි.

**සතර පෝදා එළිදකින සදහම් ප්‍රදීපය**

**බුදුසරණ**

**පත්‍රය බාරේ පළවන දැන්වීම් සඳහා එවන පිළිතුරු සාමාන්‍ය තැපෑලෙන් එවිය යුතුයි**

**ලියාපදිංචි තැපෑලෙන් එවන ලියුම් බාරගනු නොලැබේ**

# රත්නපුර මහා නගර සභාව

# ටෙන්ඩර් කැඳවීමයි

## සේවා සහ ස්ථාන 2023 වර්ෂයට බදුදීම

රත්නපුර මහා නගර සභාවට අයත් පහත සඳහන් අංක 01 උපලේඛනයෙහි දක්වා ඇති සේවා සහ ස්ථාන 2023 වර්ෂයට බදු දීම සඳහා දෙවන වරට ටෙන්ඩර් කැඳවනු ලැබේ.

- **ලංසු අයදුම්පත් නිකුත් කිරීම ආරම්භ කරනු ලබන දිනය - 2022.12.19**
- **ලංසු අයදුම්පත් නිකුත් කිරීම අවසන් කරනු ලබන දිනය හා වේලාව - 2023.01.02 ප.ව.3.00**
- **ලංසු අයදුම්පත් භාරගැනීම අවසන් කරනු ලබන දිනය හා වේලාව - 2023.01.03 පෙ.ව. 10.00**
- **ලංසු විවෘත කරනු ලබන දිනය හා වේලාව - 2023.01.03 පෙ.ව. 10.30**

**උපලේඛන 01**

**ටෙන්ඩර් කිරීමට නියමිතව ඇති සේවා සහ ස්ථාන**

| අනු අංකය | සේවා සහ ස්ථාන | අවම මාසික ගාස්තුව | | අයදුම්පත් ගාස්තු | ටෙන්ඩර් ඇප තැන්පත් |
|---|---|---|---|---|---|
| 1 | පොදු වෙළඳපළ මාළු කඩ (කඩ අංක 38) | කඩ අංක 38 | රු. 42,000.00 | රු 3,000.00 | රු. 20,000.00 |
| 2 | පොදු වෙළඳපල එළු මස් / කුකුල් මස් (කඩ අංකය 37) | කඩ අංක 37 | රු. 90,000.00 | රු. 2,500.00 | රු. 10,000.00 |
| 3 | පොදු වෙළඳ පොළ මාළු කඩ (කඩ අංකය 39/40/44) | කඩ අංක 49 | රු. 45,000.00 | රු. 1,000.00 | රු. 15,000.00 |
| | | කඩ අංක 40 | රු.45,000.00 | රු. 1,000.00 | රු. 15,000.00 |
| | | කඩ අංක 44 | 61,000.00 | රු. 1,000.00 | රු. 15,000.00 |
| 4 | මධ්‍යම බස් නැවතුම්පළ පෞද්ගලික බස් රථ ගාල් කිරීමේ ගාස්තු අයකිරීම (බස් රථයකින් රු. 100.00) | | රු. 500,000.00 | රු. 3,500.00 | රු. 25,000.00 |
| 5 | පුළුගුපිටිය පොදු වැසිකිළිය පවත්වාගෙන යෑම (අයකිරීම රු. 20.00) | | රු. 4,500.00 | රු. 250.00 | රු. 2,500.00 |
| 6 | රත්නපුර මහා නගර සභාවේ පොදු වෙළඳ සංකීර්ණය පිටුපස රථගාල සහ පොදු වැසිකිළිය පවත්වාගෙන යාම | | 40,150.00 | රු. 2,500.00 | රු. 20,000.00 |
| 7 | රත්නපුර මහා නගර සභාවට අයත් පොම්පකැලේ පිහිටි නාගරික වන උද්‍යානය හා පිහිනුම් තටාකය පවත්වාගෙන යෑම | | රු. 50,100.00 | රු. 2,500.00 | රු. 15,000.00 |

**08.(I) රථවාහන නවතා තැබීමේ ගාස්තු අය කිරීම**

| අනු අංකය | සේවා සහ ස්ථාන | අවම මාසික ගාස්තුව | අයදුම්පත් ගාස්තු | ටෙන්ඩර් ඇප තැන්පත් |
|---|---|---|---|---|
| 1 | කෙලින් වීදිය කුඩුගල් වත්ත ජගත්සිරිය හන්දියේ සිට වරකාතොට පාලම දක්වා | රු. 145,800.00 | රු. 3,000.00 | රු. 20,000.00 |
| 2 | නගර සභා පෙදෙස ස.තො.ස. හන්දියේ සිට ගඟ අද්දර සීමාව දක්වා | | | |
| 3 | නගර සභාව ඉදිරිපිට නාඹටුන්න පිරවුම්හල සිට නගර සභා පෙදෙස | | | |
| 4 | නව නගරය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අසල | | | |
| 5 | බඩුගබඩා පාර පාලිත ස්ටෝර්ස් අසල සිට සෙලාන් බැංකුව දක්වා | | | |

**08.(ii) රථ වාහන නවතා තැබීමේදී අයකළ හැකි ගාස්තු**

| | වාහන වර්ගය | පළමු පැයට | අතිරේක පැයට |
|---|---|---|---|
| අ) | මෝටර් සයිකල් (අයකිරීම රු. 20.00) | රු. 20.00 | රු. 10.00 |
| ආ) | ත්‍රීරෝද රථ (අයකිරීම රු. 30.00) | රු. 30.00 | රු. 20.00 |
| ඇ) | කාර්, වෑන්, සැහැල්ලු වාහන (අයකිරීම රු. 50.00) | රු. 50.00 | රු. 20.00 |
| ඈ) | මගීන් 26 දෙනෙකු හෝ 26 දෙනෙකුට අඩු සංඛ්‍යාවක් ගෙන යාම සඳහා බලපත්‍රලත් බස් රථයක් සඳහා (අයකිරීම රු. 100.00) | රු. 100.00 | රු. 20.00 |
| ඉ) | මගීන් 26 දෙනෙකුට වැඩියෙන් ගෙනයාම සඳහා බලපත්‍රලත් බස් රථයක් හෝ මෝටර් කෝච් රථයක් සඳහා (අයකිරීම රු. 100.00) | රු. 100.00 | රු 25.00 |
| ඊ) | ලොරියක් සඳහා (අයකිරීම රු. 50.00) | රු. 50.00 | .රු 20.00 |
| උ) | වෙනත් වාහන සඳහා (අයකිරීම රු. 50.00) සැ. යු. රෝහල අසල ගාස්තු අයකිරීමෙන් නිදහස් කර ඇත. | රු. 50.00 | රු. 20.00 |

**08. (iii) පොදු වෙළඳ සංකීර්ණය පිටුපස රථ ගාලේ අය කළ හැකි ගාස්තු**

| අනු අංකය | වාහන වර්ගය | පළමු පැයට අයකිරීම | අතිරේක පැයකට |
|---|---|---|---|
| 01 | කාර් රථයකින් | රු. 50.00 | රු. 20.00 |
| 02 | වෑන් රථයකින් | රු. 50.00 | රු. 20.00 |
| 03 | ලොරි රථයකින් | රු. 50.00 | රු. 20.00 |

- මුද්‍රා තැබූ සියලුම ටෙන්ඩර් අයදුම්පත් 2023/01/03 වන දින පෙ.ව. 10.00 ට පෙර රත්නපුර මහා නගර සභාවේ නාගරික කොමසාරිස්තුමාගේ නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනැවිත් බහාලීමට හෝ **නාගරික කොමසාරිස් මහා නගර සභාව, රත්නපුර** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **ඉහත සඳහන් දින නියමිත වේලාවට පෙර** ලැබෙන සේ එවිය හැකිය.
- ඉහත සඳහන් දින නියමිත වේලාවට පසු ලැබෙන ටෙන්ඩර් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ඉදිරිපත් කරනු ලබන මාසික ගාස්තුව වලට හා අයදුම්පත් ගාස්තු සඳහා VAT (රජයේ බදු මුදල්) අය කරනු ලැබේ.
- ටෙන්ඩර්පත් සමග අමුණා ඇති උපදෙස් පත්‍රිකා මනාව අවබෝධ කරගෙන එම උපදෙස් වලට එකඟව ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය.
- ටෙන්ඩර්පත පිළිගත් බව දැනුම් දී **දින 07 ක්** ඇතුළත ත්‍රෛමාසික ඇප තැන්පත් කර ගිවිසුම් අත්සන් කළ යුතුය.
- ටෙන්ඩර් අයදුම්පත් අදාළ ගාස්තු ගෙවා මහා නගර සභාවෙන් 2022.12.19 වන දින සිට රජයේ වැඩකරන දිනවල 2023.01.02 වන දින දක්වා පෙ.ව. 8.30 සිට ප.ව. 3.00 දක්වා ලබාගත හැකිය.
- ටෙන්ඩර් පිළිබඳව අවසාන තීරණය මහා නගර සභා ටෙන්ඩර් මණ්ඩලය සතුය.
- වැඩි විස්තර සඳහා විමසීම් : **නාගරික කොමසාරිස් : 045-2222275 / 045-2222759 / නාගරික ගණකාධිකාරී : 045-2231900**

**නාගරික කොමසාරිස්, මහා නගර සභාව,**
**රත්නපුර.**

**2022.12.16 වන දින**




# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

**ජනමාධ්‍ය අමාත්‍යාංශය**

## ප්‍රසම්පාදන දැන්වීම

# ආරක්ෂක සේවා සැපයීම-2023/2024

**2023.02.01 සිට 2024.01.31 දක්වා වර්ෂයක කාලය සඳහා ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ අංක 303, 224 කාර්යාල පරිශ්‍ර, සංස්ථා සිනමා ශාලාව සහ දළුගම සරසවි චිත්‍රාගාරය වෙනුවෙන් ආරක්ෂක සේවා සැපයීමට සුදුසුකම්ලත් ආයතන වලින් ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (NCB) යටතේ මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.**

| ප්‍රසම්පාදන අංකය | විස්තරය | ලංසු බැඳුම්කරය | වලංගු කාලය |
|---|---|---|---|
| NFC/BID/S/2022/03 | ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ අංක 303, 224 කාර්යාල පරිශ්‍ර, සංස්ථා සිනමා ශාලාව සහ දළුගම සරසවි චිත්‍රාගාරය වෙනුවෙන් ආරක්ෂක සේවා සැපයීම | රු.90,000.00 | 2023.01.17 දින සිට දින 90 |

රාජ්‍ය /අර්ධ රාජ්‍ය හෝ පිළිගත් පෞද්ගලික ආයතන සඳහා ආරක්ෂක සේවා සපයන, ව්‍යාපාර ලියාපදිංචියේ සිට අවම වසර 03 කට නොඅඩු සේවා පළපුරුද්දක් ඇති,ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි බලපත්‍රයක් සහිත හා අසාදු ලේඛන ගත නොවූ ආයතනයක් විය යුතුය.

### විස්තර ලබාගැනීම

මේ පිලිබඳ වැඩිදුර විස්තර සහකාර සාමාන්‍යාධිකාරී සැපයුම් හා වෙළඳාම් ( 0112-584295) මගින් ලබා ගත හැකි අතර ලංසුපත් ජාතික චිත්‍රපට සංස්ථාවේ සැපයුම් හා වෙළඳාම් අංශයෙන් නොමිලේ පරීක්ෂා කර බැලිය හැක. 2022.12.19 දින සිට 2023 .01.17 දින දක්වා සතියේ දින වල පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වා කාලය තුල ඉහත සේවා සැපයීමට අදාල ස්ථානීය පරීක්ෂාව සිදු කිරීමට හැකියාව ඇත.

### අයදුම්පත් ලබාගැනීම

සියලුම ලංසු පත් සිංහල භාෂාවෙන් ලබා ගත හැක. මේ සම්බන්ධව උනන්දුවක් දක්වන ලංසු කරුවන්හට 2022 . 12. 19 දින සිට 2023.01. 17 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වා රාජකාරි දිනවල ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපති වෙත තම ආයතනයේ ලිපි ශීර්ෂයක ලියූ ලිඛිත ඉල්ලීමක් ද සමඟ, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ මුදල් අයකැමි වෙත ආපසු නොගෙවනු ලබන රු. 1000.00 ක (රුපියල් දහසක් පමණි) මුදලක් ගෙවා ලබා ගත් ලදු පතක් ඉදිරිපත් කිරීමෙන් ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ සැපයුම් හා වෙළඳාම් අංශයෙන් ලංසුපත් ලබා ගත හැක.

සෑම ලංසු පත්‍රයක් සමගම ඉහතින් දක්වා ඇති වටිනාකමින් යුත් වලංගු කාලය සහිත ආපසු ගෙවනු ලබන ලංසු බැඳුම්කරයක් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති වානිජ බැංකුවකින් සභාපති ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව නමට ලබා ගෙන එහි මුල් පිටපත අමුණා තිබිය යුතුය.

### අයදුම්පත් යොමු කිරීම

නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසුපත් මුල් පිටපත හා අනු පිටපත ලෙස වෙන වෙනම සඳහන් කල ලියුම් කවර වල බහා මුද්‍රා තබා නැවතත් එම ලියුම් කවර දෙක තනි ලියුම් කවරයක බහා මුද්‍රා තබා එහි වම් පස ඉහල කෙළවරේ "ආරක්ෂක සේවා සැපයීම සඳහා මිල ගණන් -2023/2024" යනුවෙන් පැහැදිලිව සඳහන් කර 2023.01.17 වන දින ප.ව 2.00 ට පෙර ලැබෙන සේ සභාපති, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, අංක 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ පැමිණ පාලන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට වෙත බහාලිය යුතුය.

එදිනම ප. ව. 2.00 ට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කාමරයේදී මිල ගණන් විවෘත කරනු ලබන අතර එම අවස්ථාව සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක.

ජාතික චිත්‍රපට සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටු තීරණය අවසාන තීරණය වේ. මීට අදාල වැඩිදුර තොරතුරු ලංසු අයදුම්පතෙහි දක්වා ඇත .

**සභාපති, චිත්‍රපට සංස්ථා ප්‍රසම්පාදන කමිටුව**
**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, අංක 303**
**බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**
**ටෙලි/ෆැක්ස් -0112-584295**

# ලංසු තැබීම සඳහා ආරාධනයයි

## සී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

**ලංසු අංකය : 077/T/2022**

## යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි කාර්ය මණ්ඩල වාසස්ථානයක් ඉදිකිරීම

සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම වෙනුවෙන් අංක 01 ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි යෝජිත කාර්ය මණ්ඩල වාසස්ථානයක් පහත සඳහන් ආකාරයට ඉදිකිරීම සඳහා මුද්‍රා තැබූ ලංසු, සුදුසුකම්ලත් යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ගෙන් මෙයින් කැඳවනු ලැබේ.

මෙහි ඉදිකිරීම් වැඩ වලට අඩංගු වනුයේ බ්ලොක් ගල් බිත්ති ගොඩනැගිල්ලක්/ වාසස්ථානයක් සහ වහලයකින් සමන්විතව, වැසිකිළිද ඇතුළත්ව, විදුලි හා යාන්ත්‍රික වැඩ සහිතව (වපසරිය දළ වශයෙන් වර්ග මීටර් 500 කින් යුක්තව) ඉදිකිරීම වේ. එම සියලුම ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය සහ කම්කරු ශ්‍රමය සපයා ගනිමින්, අදාළ පිරිවිතර අනුව, ප්‍රමාණ සමීක්ෂණ පත්‍රයේ සඳහන් පරිදි හා අදාළ ඉංජිනේරු සැලසුම් අනුව ඉදිකිරීම් සිදුකළ යුතුවේ.

**ව්‍යාපෘති ස්ථානය: යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි වේ.**

**කොන්ත්‍රාත්තුව නිම කිරීමේ කාල පරිච්ඡේදය දින 180 කි.**

**ලංසු පවත්වගෙන යනු ලබන්නේ ජාතික තරගකාරී ලංසු ඉදිරිපත් කිරීමේ පටිපාටියකට අනුව වේ.**

මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සිදු කරනු ලබන්නේ යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ට වන අතර, මෙම ආයතනයේ මීට පෙර අසාධුගත කොන්ත්‍රාත් නාම ලැයිස්තුවේ නම අඩංගු නොවූ අයෙකු / ආයතනයක් විය යුතුයි. තවද මෙම ලංසුකරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) – (මින් පෙර ICTAD නමින් හැඳින්වූ) C2 හෝ C3 (**ගොඩනැගිලි ඉදිකිරීම සඳහා**) ලියාපදිංචි වූ අදාළ මාදිලියේ ඉදිකිරීම් කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති කොන්ත්‍රාත්කරුවන් විය යුතුයි.

මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2022.12.20 දින සිට 2023.01.17** දින දක්වා ඕනෑම රාජකාරී දිනයක **පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා** කාලය තුළ කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි, සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ, සැපයුම් දම කළමනාකරණ අංශයේ, අංශ ප්‍රධානී – සැපයුම් දම කළමනාකරණ වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හා ලංසු ලිපි ලේඛන වෙනුවෙන් ආපසු නොගෙවනු ලබන **රුපියල් 28,000/– ක්** (විසිඅට දහසක් පමණි) මුදලින් ගෙවීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද එකී සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. එම ගෙවීම් සිදුකළ යුත්තේ මුදලිනි.

ලංසු සුරැකුම් වෙනුවෙන් ලංසුකරුවන්, එක් ලංසුවක් සඳහා රුපියල් **දහසය ලක්ෂයක් පමණක් (රුපියල් 1,600,000/–)** මුදලින් හෝ ලංසු තොරතුරු ලේඛනයේ ලංසු දත්ත සහ කොන්ත්‍රාත් තොරතුරු යටතේ සඳහන් ආයතනයකින් ලබාගත් **ඉල්ලුම මත වූ ලංසු බැඳුම්කරයක්** සමග එකී ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

2023.01.05 දින පෙ.ව. 10.30 ට සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ, **යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි මගී පර්යන්ත ගොඩනැගිල්ලේදී** පැවැත්වෙන පූර්ව ලංසුකරණ රැස්වීමට සහභාගි වන ලෙස සියලුම ලංසුකරුවන්ට හා ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට මෙයින් ආරාධනා කරනු ලැබේ.

සම්පූර්ණ කරන ලද ලංසු පිටපතක් ද සහිතව **2023 ජනවාරි 18 වන දින ප.ව. 02.00** ට පෙර ලැබෙන සේ අතින් ගෙනවිත් හෝ ලියාපදිංචි තැපෑලෙන් කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ, සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ, සැපයුම් දම කළමනාකරණ අංශයේ, අංක 01 ප්‍රසම්පාදන කමිටුවේ සභාපති යන ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතුයි. **ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.** එදින එකී වේලාවට ලංසු භාර ගැනීම අවසන් වූ විගස ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරිපිට එකී ලංසු විවෘත කරනු ලැබේ.

මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට, වැඩි විස්තර දැන ගැනීමට අවශ්‍ය නම්, කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ, සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ, සිවිල් ඉංජිනේරු (සැලසුම් හා නිර්මාණ) අංශයේ, අංශ ප්‍රධානී වෙතින් දුරකථන අංක 011–226–3500 / 3506 / 3530 හෝ ෆැක්ස් අංක 011–2251356 ඔස්සේ ලබාගත හැක. පහත සඳහන් ලිපිනයේදී මෙම ලංසු ලිපි–ලේඛන කට්ටලයක් පරීක්ෂා කර බැලීම සඳහා ද අවස්ථාව සලසා දී ඇති අතර, 2022.12.20 දින සිට 2023.01.17 දින දක්වා ඕනෑම රාජකාරී දිනයක පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි, සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ, සැපයුම් දම කළමනාකරණ අංශයෙන් පරීක්ෂා කර බැලිය හැක.

**සභාපති,**
**අංක 01, ප්‍රසම්පාදන කමිටුව, සැපයුම්දාම කළමනාකරණ අංශය,**
**සී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක.**

# සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම

**(වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය)**

## ගම්මිරිස් එලදාව බදුදීම සඳහා ටෙන්ඩර් කැඳවීම

අප ආයතනය මගින් පාලනය වන නාරම්මල පළාත් වතුයායට අයත් පහත සඳහන් බෙදුම්වල හොඳින් එලදරන ලද ගම්මිරිස් වැල් 3607 ක පමණ ප්‍රමාණයක එලදාව බදුදීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

- **රාජසන්තක බෙදුම** - එලදරා ඇති වැල් 1519 ක් පමණ
- **වැලිහිටියාව බෙදුම** - එලදරා ඇති වැල් 790 ක් පමණ
- **මහවත්ත බෙදුම** - එලදරා ඇති වැල් 272 ක් පමණ
- **කොලවතුරයාය බෙදුම** - එලදරා ඇති වැල් 1026 ක් පමණ

**මිල ගණන් පත් භාරගැනීම** : 2022.12.28 දින ප.ව. 2.00 දක්වා

**මිල ගණන් පත් විවෘත කිරීම** : 2022.12.28 දින ප.ව. 2.30 ට නාරම්මල පළාත් වතු කාර්යාලයේදී සිදු කෙරේ.

**ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කිරීම** : 2022.12.28 දින පස්වරු 12.00 දක්වා කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන කාර්යාලයෙන් හා නාරම්මල පළාත් වතු කාර්යාලයෙන් ලබාගත හැක.

**ටෙන්ඩර් තැන්පතු මුදල් ගෙවීම** : 2022.12.28 දින පස්වරු 12.30 ට පෙර නාරම්මල පළාත් වතු කාර්යාලයට සිදුකළ යුතුය.

**මිල ගණන් ඉදිරිපත් කළ යුතු ලිපිනය** : පළාත් භාර වතු අධිකාරි, නාරම්මල පළාත් වතු, ඔලියදෙණිය වත්ත, දම්පැලැස්ස, නාරම්මල.

**අවශ්‍ය විස්තර හා කොන්දේසි සඳහා විමසන්න**

**071-6884085, 071-6884087, 071-4291830**

**සභාපති, ටෙන්ඩර් මණ්ඩලය,**
**සී/ස කුරුණෑගල වැවිලි සමාගම,**
**අංක 80, දඹුල්ල පාර, කුරුණෑගල.**
**2022.12.19**

---

# මහියංගනය ප්‍රාදේශීය සභාව

## මහියංගනය සී.ටී.බී. බස් නැවතුම්පළ ගොඩනැගිල්ලේ පිහිටි කඩ කාමර බදුදීම සඳහා වන ටෙන්ඩර් දැන්වීම

01. මහියංගනය සී.ටී.බී. බස් නැවතුම්පළ පරිශ්‍රයේ කඩ කාමර 24 ක් දීර්ඝ කාලීනව බදු දීමට නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියකට අනුගතව මහියංගනය ප්‍රාදේශීය සභාව විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

02. ටෙන්ඩර් අයදුම්පත් **2022.12.19** වන දින සිට **2022.12.30** වන දින පස්වරු **12.00** දක්වා නිකුත් කරන අතර, **2022.12.30 දින ප.ව. 1.00** ට ටෙන්ඩර් අයදුම්පත් භාරගැනීම අවසන් වේ. එදිනම එනම් **2022.12.30 දින ප.ව. 1.30** ට ටෙන්ඩර්පත් විවෘත කිරීම ද සිදු වේ.

03. මහියංගනය ප්‍රාදේශීය සභාවට ආපසු ගෙවීමේ පදනම මත රුපියල් 15,000.00 ක් ඇප තැන්පත් තබා ටෙන්ඩර් අයදුම්පත් ගාස්තු ලෙස රුපියල් 5,000.00 ක් ගෙවා ටෙන්ඩර් අයදුම්පතක් ලබාගත හැක. එය නිවැරදිව පුරවා 12X6 ප්‍රමාණයේ ලියුම් කවරයක දමා කවරය මුද්‍රා කර **සභාපති, ප්‍රාදේශීය සභාව, මහියංගනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ මහියංගනය ප්‍රාදේශීය සභාවේ මුද්‍රා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට **2022.12.30 දින ප.ව. 1.00** ට ප්‍රථම ගෙනවිත් බහාලිය යුතුය. කවරයේ වම්පස ඉහළින් **"සී.ටී.බී. බස් නැවතුම අංක ..............................දරන කඩ කාමරයට ලංසු තැබීම"** ලෙසට සඳහන් විය යුතුය.

04. ටෙන්ඩර් කරන කඩ කාමර සම්බන්ධ තොරතුරු පහත වගුව මත පදනම් වේ.

| ගොඩනැගිල්ල | කඩ කාමර අංකය | වර්ග අඩි ප්‍රමාණය | අවම ලංසු මුදල (එක් කඩ කාමරයක මිල) | මාසික කඩ කුලිය |
|---|---|---|---|---|
| බිම් මහල බ්ලොක් ඒ | 12,13 | 194 | 1,900,000.00 | 10,000.00 |
| බිම් මහල බ්ලොක් බී | 14,15,20,21 | 194 | 1,700,000.00 | 8,500.00 |
| උඩු මහල බ්ලොක් ඒ | 25,26,27,28,29,30, 31,32,33,34 | 194 | 1,300,000.00 | 7,000.00 |
| උඩු මහල බ්ලොක් බී | 35,36,37,38,39,40,41,42 | 194 | 1,100,000.00 | 5,500.00 |

05. ඒ ඒ කඩ කාමර සඳහා තේරී පත්වන බදුකරුවන් අදාළ කඩ කාමරය සඳහා වූ ලංසු මුදලෙන් 40% එම අවස්ථාවේදීම ගෙවිය යුතු අතර. 30% ක් වන දෙවන කොටස ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 14ක් ඇතුළතද, 30% ක්වූ තෙවන කොටස ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 28 ක් ඇතුළත ද ගෙවිය යුතුය.

06. වැඩි විස්තර සඳහා 055-2257275 දුරකථනයට කාර්යාලීය දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 කාලය තුළ ඇමතීමෙන් ලබාගත හැකිය.

**සභාපති,**
**ප්‍රාදේශීය සභාව,**
**මහියංගනය.**

---

# හලාවත වැවිලි සමාගම

**(වැවිලි අමාත්‍යාංශය)**

## අනගි ආයෝජන අවස්ථාවක් !

### වාහන සේවා ස්ථානයක් සඳහා පල්ලම නගරයේ පිහිටි සිත්තම්පලම් වත්තෙන් අක්කර 01 ක් බදු දීම

### අභිලාෂය ප්‍රකාශ කිරීම කැඳවීමයි

වයඹ පොල් නිෂ්පාදනයේ ප්‍රමුඛයා වශයෙන් රජය සතු සමාගමක් ලෙස හලාවත වැවිලි සමාගම යටතේ පාලනය වන, පුත්තලම දිස්ත්‍රික්කයේ පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලම නගරයේ බංගදෙනිය/ ආණමඩුව මාර්ගයට යාබදව පිහිටි සිත්තම්පලම් වත්තෙන් අක්කර 01 ක බිම් කොටසක් වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා සුදුසු අනර්ඝ ස්ථානයකි.

උනන්දුවක් දක්වන ආයෝජකයන්ට පල්ලම, පොත්තුක්කුලම, සිත්තම්පලම් වත්තේ පිහිටි හලාවත කොට්ඨාස භාර වතු අධිකාරී වෙතින් රු. 500/- ක ගාස්තුවක් ගෙවා ලබා ගන්නා පෝරම භාවිතා කර අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ.

නිසි පරිදි පිළියෙල කරන ලද මුද්‍රා තබන ලද අයදුම්පත් ඒවා බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"වාහන සේවා ස්ථානය"** යනුවෙන් සඳහන් කර 2023-01-08 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවාව මගින් පහත සඳහන් ලිපිනයට එවීම හෝ එකී ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කළ හැකිය. අයදුම්පත් ලැබුන බව දන්වා එවනු නොලැබේ. අයදුම්පත් පිළිගැනීමේ හෝ නොපිළිගැනීමේ සම්පූර්ණ අයිතිය හලාවත වැවිලි සමාගම සතුවේ. බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සැලකේ.

ස්ථානය පරීක්ෂා කිරීම සඳහා හලාවත කොට්ඨාස භාර වතු අධිකාරී (ජංගම දුරකථනය 070-2828028) අමතා කලින් දිනයක් හා වේලාවක් වෙන් කර ගැනීමෙන් පසුව සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ සිදුකළ හැකිය.

**සභාපති - ප්‍රසම්පාදන කමිටුව,**
**හලාවත වැවිලි සමාගම,**
**165, පුත්තලම පාර,**
**හලාවත. 61000.**

---

**ලුහුඬු දැන්වීම්**



**රැකී රක්ෂා**



325

**ඇබෑර්තු**

විවිධ

**ප්‍රමුඛ** පෙළේ උත්සව භාණ්ඩ සැපයීමේ ආයතනයක ලොරි රථවල සේවය සඳහා කඩිසර සේවා සහයකයින් අවශ්‍යව ඇත. නවාතැන් / වෛද්‍ය පහසුකම් සහ ආහාර දීමනා සැපයේ. විමසීම් : 0777818739, 0777378584. එච්.ඩී. ජයමාන්න සහ පුත්‍රයෝ, අංක 05, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ. (පැඟිරිවත්ත දුම්රියපල අසල) 077564

---

# විදුලි උපදේශන පිළිබඳ ලංසු කැඳවීමයි



## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල

01. කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ප්‍රසම්පාදන කමිටුව විසින් පහත විදුලි උපදේශන කටයුතු සඳහා විදුලි උපදේශකවරුන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු **2023.01.09 දින ප.ව. 02.00** දක්වා භාර ගනු ලැබේ.

| වැඩ විස්තරය | අරමුදල් මූලාශ්‍රය | ප්‍රසම්පාදන ක්‍රමය | වැඩ නිම කිරීමේ කාලය | ටෙන්ඩර් පෝර්ම ගාස්තුව (ආපසු නොගෙවන) | ලංසු ඇපකරය (ආපසු ගෙවන) |
|---|---|---|---|---|---|
| දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ලේ විදුලි උපදේශන කටයුතු | ඒකාබද්ධ අරමුදල | ජාතික ලංසු කැඳවීම | අවු. 2 | රු. 1,000.00 | රු. 30,000.00 |
| බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ලේ විදුලි උපදේශන කටයුතු | ඒකාබද්ධ අරමුදල | ජාතික ලංසු කැඳවීම | අවු. 2 | රු. 1,000.00 | රු. 30,000.00 |

02. i. ලංසුකරුවන් සුදුසුකම්ලත්, අසාධු ලේඛනගත නොවූවන් විය යුතු අතර ලංසුකරුවන්ගේ ලියාපදිංචිය පිළිබඳ තොරතුරු ඇතොත් ඉදිරිපත් කරන්න. VAT ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් සක්‍රිය VAT බදු ගෙවන්නෙකු බවට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ පුවත්පත් දැන්වීමට පසු දිනයක් සහිත ලිපියක් ඉදිරිපත් කළ යුතුයි.

ii. ලංසුකරු අවම වශයෙන් වර්ෂ 05 ක සේවා පළපුරුද්දක් ඇති අයෙකු විය යුතු අතර, රජයේ, පළාත් පාලන හෝ අර්ධ රාජ්‍ය ආයතනයක ඉහත සඳහන් පරිදි එකක් හෝ ඊට වැඩි එක් විදුලි උපදේශන සේවා සංඛ්‍යාවක් සිදුකර තිබිය යුතුය. (මේ සඳහා අදාළ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.) තවද, ව්‍යාපෘතිය ඉටු කිරීමට සුදුසුකම්ලත් ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් සිටිය යුතුය.

03. ඇස්තමේන්තු වටිනාකමින් 10% ක් හෝ ඊට වැඩි මූල්‍ය වටිනාකමට සරිලන ණය පහසුකම් තම ආයතනයට ලබාගත හැකි බවට පුවත්පත් දැන්වීම් දිනයට පසු ටෙන්ඩර් කාලසීමාව තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් ලිපියක් හෝ අදාළ වත්කම් තමන් සතු බවට තහවුරුවක් ඉදිරිපත් කළ යුතුය.

04. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත ආපසු නොගෙවන **රු. 1,000.00 ක** මුදලක් ගෙවීමෙන් ලබාගත් රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් **2022.12.21 දින සිට 2023.01.06 දින දක්වා වැඩ කරන දිනයන් වලදී පෙ.ව. 9.00 සිට ප.ව. 02.30 දක්වා** ලංසු ලේඛන ලබාගත හැක. වැඩි විස්තර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරුගෙන් ලබාගත හැකි අතර, පූර්ව ලංසු රැස්වීමක් (Pre-Bid Meeting) **2022.12.27 දින ප.ව 02.00** ට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වේ. **(දු. අංකය 035-2223143/ 071-1109066)**

05. ලංසුව, ලංසු භාර ගැනීමේ අවසාන දිනයේ සිට ලිත් **දින 91 ක්** දක්වා වලංගු විය යුතුය.

06. සියලුම ලංසුකරුවන් උක්ත 01 යටතේ සඳහන් ආපසු ගෙවන ලංසු ඇපකරය මෙම කාර්යාලයේ සරප් වෙත මුදලින් ගෙවීමෙන් හෝ පිළිගත් වාණිජ බැංකුවකින් දිස්ත්‍රික් ලේකම්, කෑගල්ල නමින් **2023.01.09 දින සිට 2023.04.10 දින** දක්වා වලංගු වන ලෙස ලබාගත් කොන්දේසි විරහිත බැංකු සුරක්ෂණයක් මගින් ඉදිරිපත් කළ යුතුය. මුදලින් ගෙවන්නේ නම් රිසිට්පතෙහි මුල් පිටපත ලංසුවට අමුණා එවිය යුතුවේ. වලංගු ලංසු ඇපකරයක් අමුණා නොමැති ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප වේ.

07. ලංසු මුල් පිටපත හා අනු පිටත වශයෙන් පිළියෙල කර වෙන් වෙන් වශයෙන් කවරවල බහා නැවත එම කවර 02 ක එක් කවරයක බහා වම්පස ඉහළ කෙළවරේ අදාළ ව්‍යාපෘතියේ නම සඳහන් කර මුද්‍රා තබා **2023.01.09 දින ප.ව. 2.45**ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ගොඩනැගිල්ලේ බිම් මහලේ පිහිටි ගිණුම් අංශයේ ප්‍රධාන ගණකාධිකාරී කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනැවිත් බහාලීම හෝ සිදු කළ හැකිය. එම වේලාවෙන් පසුව ලැබෙන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එදිනම **ප.ව. 3.00**ට ටෙන්ඩර් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

08. සුදුසු ලංසුකරුවෙක් තෝරා ගැනීම පිළිබඳ සම්පූර්ණ අයිතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ප්‍රසම්පාදන මණ්ඩලය සතු වේ. ඒ සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම, තෝරා ගැනීම සඳහා නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ. මෙම ලංසු කැඳවීමේ නිවේදනයෙන් සහ ලංසු ලියවිළ වලින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණයක් ගැනීමේ සම්පූර්ණ අයිතිය කෑගල්ල දිස්ත්‍රික් ලේකම්වරයා සතු වන අතර, සුදුසු ලංසුකරුවකු තෝරා ගැනීම, ලංසුවක් හෝ සියලුම ලංසු අවලංගු කිරීම පිළිබඳව අවසාන තීරණය දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

**මහින්ද එස්. වීරසූරිය**
**දිස්ත්‍රික් ලේකම්/ දිසාපති,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල.**
**2022.12.19**

---

# මිල ගණන් සඳහා ආරාධනයයි

## ප්‍රවෘත්ති පත්‍ර බෙදාහැරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු අවශ්‍යයි

LPA/34/2022

පහත සඳහන් මාර්ගයන් ඔස්සේ ප්‍රවෘත්ති පත්‍ර කොන්ත්‍රාත් පදනම මත බෙදාහැරීම සඳහා මෙමගින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ප්‍රවෘත්ති පත්‍ර ආයතනයක් වන ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක්හවුස්) කොන්ත්‍රාත්කරුවන් වෙතින් මිල ගණන් කැඳවනු ලැබේ.

| | |
|---|---|
| **මාර්ගය කොළඹ - කොටදෙනියාව (අංක 28)** (කණුවන, ඒකල, මාකෙවිට, කොටුගොඩ, මිනුවන්ගොඩ, ආඩිඅම්බලම, තිල්පනාගොඩ, දූනගහ, මරදගහමුල, මැල්ලවගෙදර. දිවුලපිටිය, බල්ලපාන, මැදගම්පිටිය, බාදුරාගොඩ, පල්ලෙවෙල, කල්එළිය, මීරිගම, අඹේපුස්ස, ලෝලුවාගොඩ, කොටදෙනියාව, බඩල්ගම, කටාන.) | **දුර ප්‍රමාණය** කි.මීටර් 185 |
| **මාර්ගය - කොළඹ - පානදුර (අංක 40 ඒ)** (කළුබෝවිල, පැපිලියාන, දෙහිවල, ගල්කිස්ස, රත්මලාන, පානදුර, මහවිල, රයිගම, මොරොන්තුඩුව, මිල්ලනිය, බණ්ඩාරගම, කිඳෙල්පිටිය, මඩපාත) | **දුර ප්‍රමාණය** කි.මීටර් 115 |
| **මාර්ගය - කොළඹ - හෝමාගම (අංක 37 බී)** (ඇතුල්කෝට්ටේ, මාදිවෙල, පිටකෝට්ටේ, නුගේගොඩ, තලපත්පිටිය, උඩහමුල්ල, දෙල්කඳ, නාවින්න, මහරගම, පන්නිපිටිය, කොට්ටාව, පාදුක්ක, මත්තෙගොඩ, කිරිවත්තුඩුව, හෝමාගම, මීගොඩ, පහත්ගම, හංවැල්ල, මීපේ හන්දිය.) | **දුර ප්‍රමාණය** කි.මීටර් 113 |
| **මාර්ගය - කොළඹ - වත්තල (අංක 38 බී)** කොළඹ 10, කොළඹ 14, පැලියගොඩ, වත්තල, හැඳල, ඇලකන්ද, එඬේරමුල්ල, ගොංගිතොට, රාගම, බටුවත්ත, ගණේමුල්ල වැලිවේරිය, දෙල්ගොඩ, මල්වාන, සිංහාරමුල්ල, බොල්ලෑගල) | **දුර ප්‍රමාණය** කි.මීටර් 90 |

මේ සඳහා අවශ්‍ය වන මිල ගණන් පත්‍ර අංක 35, ඩී.ආර්. විජේවර්ධන මාවත කොළඹ 10 පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවෙන් 2022 දෙසැම්බර් මස 15 වන දින සිට 2022 දෙසැම්බර් මස 29 වන දින දක්වා ආපසු නොගෙවන රු. 500.00 ගාස්තුවක් ගෙවීමෙන් පසු පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර ලබාගත හැක.

යථාපරිදි සම්පූර්ණ කරන ලද මිල ගණන් මුද්‍රා තබන ලද ලියුම් කවරයක බහා එහි වම්පස උඩු කෙළවරෙහි "ප්‍රවෘත්ති පත්‍ර කොන්ත්‍රාත් පදනම යටතේ බෙද හැරීම සඳහා මිල ගණන්" යන්න සටහන් කොට ලියාපදිංචි තැපෑලෙන් ප්‍රසම්පාදන ප්‍රධානී, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, අංක 35, ඩී.ආර්. විජේවර්ධන මාවත කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට 2022 දෙසැම්බර් මස 30 වන දින ප.ව. 2.30 හෝ ඊට පෙර ලැබෙන සේ බහාලීම සිදුකළ හැක. එදිනම ප.ව. 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම සිදු කරනු ලැබේ. එම අවස්ථාවට කොන්ත්‍රාත්කරුට හෝ ඔහුගේ නියෝජිතයකුට පැමිණ සිටිය හැක.

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට කිසිදු හේතුවක් නොදක්වා ඕනෑම හෝ සියලුම අර්පනයන් භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පරම අයිතිය සතුවේ.

LAKE HOUSE

**ප්‍රසම්පාදන ප්‍රධානී,**
**ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,**
**නො.35, ලේක්හවුස්,**
**ඩී. ආර්. විජේවර්ධන මාවත,**
**කොළඹ 10.**

**වැඩි විස්තර සඳහා -**
**දුරකථන අංක : 011-2429422/ 2429451/2429669**

---

**1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.**

**පුස්තකාලයාධිපති**
**දුරකථන**
**(011) 2 242 9491**

LAKE HOUSE

### මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රේගුව

## ශ්‍රී ලංකා රේගුවට දෙමුහුන් කාර් රථ 09ක් මෙහෙයුම් කල්බදු පදනම යටතේ ලබාගැනීම සඳහා වන ප්‍රසම්පාදනය සඳහා ආරාධනා කිරීම

## ජාතික තරගකාරී ලංසු ක්‍රමය (NCB)

ශ්‍රී ලංකා රේගුව සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ දෙමුහුන් කාර් රථ 09 ක් ලබා ගැනීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් දෙපාර්තමේන්තු (මහ ප්‍රසම්පාදන) කමිටුවේ සභාපති විසින් සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් (කල්බදුකරු අවම වශයෙන් වාහන 10 කට වඩා වැඩි සංචිතයක් සහිත ශ්‍රී ලංකාවේ ඇති වාහන සන්නාමයන්හි වරලත් වාහන නියෝජිතයින්, ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි මූල්‍ය ආයතන හා කුලී පදනම මත වාහන ලබා දෙන සමාගමක්) මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| කොන්ත්‍රාත් අංකය | ප්‍රසම්පාදනයේ නම | උපරිම මාසික කුලිය(රු) | ලංසු අවසන් කිරීම | |
|---|---|---|---|---|
| | | | දිනය | වේලාව |
| කොන්ත්‍රාත් අංක Log/Tr/01/Rent Vehicle (car)-2022 | සෙඩාන් දෙමුහුන් කාර් රථ 09 එන්ජින් ධාරිතාව 1600CC නොඉක්මවන | 200,000.00 | 2023.01.16 | 2.00 p.m |

1. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ පවත්වනු ලැබේ.
2. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු, රේගු අධ්‍යක්ෂ (සේවා හා සැපයීම්) වෙතින් ලබා ගත හැකි අතර, 2022.12.19 දින සිට 2023.01.02 දින දක්වා වැඩ කරන දිනයන්හි පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා පහත සඳහන් ලිපිනයේ දී ලංසු ලේඛන පරීක්ෂාකර බැලිය හැකිය.
3. උනන්දුවක් දක්වනු ලබන ලංසුකරුවන්ට 2023.01.02 දින හෝ ඊට පෙර වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00ත් ප.ව. 3.00ත් අතර රු. 5,000.00 ක ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් ගෙවා ශ්‍රී ලංකා රේගුවෙහි 06 වන මහලෙහි පිහිටි සේවා හා සැපයීම් අංශය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කර සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් සිදු කළ හැක්කේ මුදලින් පමණි.
4. සම්පූර්ණ කරන ලද ලංසු 2023.01.16 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ශ්‍රී ලංකා රේගුවේ 06 වන මහලේ සේවා හා සැපයුම් අංශයේ ඒ වෙනුවෙන් තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකි අතර, එවන මිල ගණන් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා රේගුවට මෙහෙයුම් කල්බදු පදනම යටතේ කාර් රථ ලබාගැනීම සඳහා වන ප්‍රසම්පාදනය මිල ගණන්"** යනුවෙන් පැහැදිලිව ලියා, **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, රේගු මන්දිරය, අංක 40, කෙළින් විදිය, කොළඹ 11** යන ලිපිනයට 2023.01.16 දින නියමිත වේලාවට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකිය. සෑම ලංසුවක්ම රේගු අධ්‍යක්ෂ ජනරාල් නමින් රු. 150,000.00 ක ලංසු සුරැකුමක් සමග ඉදිරිපත් කළ යුතුය.
5. එදින ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ වහාම විවෘත කරනු ලබන අතර, ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවේ පුද්ගලිකව පෙනී සිටීමට තෝරාගත් ලංසුකරුගේ නියෝජිතයන්ට ඒ සඳහා සහභාගි විය හැකිය.
6. ලංසු පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති, දෙපාර්තමේන්තු මහ ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා රේගුව,**
**අංක 40, කෙළින් වීදිය, කොළඹ 11.**

### කෘෂිකර්ම අමාත්‍යාංශය

# සී/ස ලංකා පොහොර සමාගම

## ලංසු ආරාධනය

කැබිනට් මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයට අනුකූලව රජය සතු පොහොර සමාගම් දෙක, සී/ස ලංකා පොහොර සමාගම හා කොළඹ කොමර්ෂල් පොහොර ඒකාබද්ධ කරමින් තනි ආයතනයක් ලෙස ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත. අදාළ ඉහත අවශ්‍යතාවය සපුරාලීම සඳහා මානව සම්පත් කළමනාකරණ සැලැස්ම (HRM Plan), ව්‍යාපාරික සැලැස්ම (Business Plan), අලෙවිකරණ සැලැස්ම (Marketing Plan) සමන්විත ආයතනික සංයුක්ත සැලැස්ම (Corporate Plan) සුදුසුකම්ලත් උපදේශකයකුගේ /උපදේශනාත්මක ආයතනයක උපදේශනය යටතේ සකස් කළ යුතුව ඇත.

එම නිසා, සී/ස ලංකා පොහොර සමාගම වෙනුවෙන් දෙපාර්තමේන්තු උපදේශනාත්මක තෝරා ගැනීමේ කමිටුවේ සභාපති විසින් මානව සම්පත් කළමනාකරණ සැලැස්ම (HRM Plan), ව්‍යාපාරික සැලැස්ම (Business Plan), අලෙවිකරණ සැලැස්ම (Marketing Plan) සමන්විත ආයතනික සංයුක්ත සැලැස්ම (Corporate Plan) සැකසීම සඳහා පිළිගත් උපදේශකයින්ගේ සහ / උපදේශනාත්මක ආයතනවලින් යෝජනා කැඳවනු ලැබේ.

ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය 2007 වර්ෂයේ නිකුත් කර ඇති උපදේශකයින් තෝරාපත්කර ගැනීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ විස්තර කර ඇති මාර්ගෝපදේශවලට අනුකූලව, ප්‍රමිත හා පිරිවැය ක්‍රමය (Quality and Cost based selection) යටතේ උපදේශකයින් තෝරා ගනු ලැබේ.

**පූර්ව ලංසු රැස්වීම 2023 ජනවාරි මස 03 වන දින ප.ව. 2.30 ට සී/ස ලංකා පොහොර සමාගමේ ප්‍රසම්පාදන අංශයේදී පැවැත්වේ.**

මූල්‍ය යෝජනා (Finance Proposal) සහ තාක්ෂණික යෝජනා (Technical Proposal) මුල් පිටපත සහ දෙවන පිටපත වෙන වෙනම කවරවල බහා **"මුල් පිටපත"** හා **"දෙවන පිටපත"** ලෙස පැහැදිලිවම සටහන් කර එම පිටපත් දෙකම එක් කවරයක බහා **2023 ජනවාරි මස 13 වන දින ප.ව. 2.30ට** ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතුය. එසේ නොමැති නම් **වත්තල, හුණුපිටිය ස්වර්ණ ජයන්ති මාවතේ පිහිටි සී/ස ලංකා පොහොර සමාගමේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයේ ඒ සඳහා තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතුය.**

අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා ලියකියවිලි, වෘත්තීමය සුදුසුකම් සනාථ කිරීම සඳහා ලියකියවිලි ඇතුළු වූ අනෙකුත් අදාළ වන්නා වූ ලියකියවිලි සහ මෙම කාර්යය සඳහා කාල රාමුව, තාක්ෂණික යෝජනාව සඳහා වූ අන්තර්ගත විය යුතුය. මූල්‍ය යෝජනාව සඳහා මෙම සම්පූර්ණ කාර්යය සඳහා වූ මිල ශ්‍රී ලංකා මුදලින් ඉදිරිපත් කළ යුතුය.

**මේ සම්බන්ධ වැඩිදුර තොරතුරු / කරුණු දැනගැනීම සඳහා වැ.බ. සාමාන්‍යාධිකාරී, සී/ස ලංකා පොහොර සමාගම, ලක් පොහොර ස්වර්ණ ජයන්ති මාවත, හුණුපිටිය, වත්තල සම්බන්ධ කර ගත හැකිය. (දු.ක. -011-2947765/ 077-2069777, ෆැක්ස් -011-2930423)**

**සභාපති,**
**දෙපාර්තමේන්තු උපදේශනාත්මක තෝරාගැනීම් කමිටුව,**
**ප්‍රසම්පාදන අංශය,**
**ලක් පොහොර ස්වර්ණ ජයන්ති මාවත,**
**හුණුපිටිය, වත්තල.**

# ටෙන්ඩර් දැන්වීමයි

## වැලිකන්ද ප්‍රාදේශීය සභාව

## 2023 වර්ෂයට වත්කම් බදු දීම

වැලිකන්ද ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් වත්කම් 2023 වර්ෂයට බදුදීම සඳහා මවිසින් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

- ❖ **ටෙන්ඩර් අයදුම්කරුවන් පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.**
- ❖ **ටෙන්ඩර් පෝරම නිකුත් කිරීම** : 2022.12.19 වන දින සිට 2023.01.03 වන දින පෙ.ව. 10.00 දක්වා
- ❖ **ටෙන්ඩර් භාරගැනීම** : 2022.12.19 වන දින සිට 2023.01.03 වන දින ප.ව. 2.00 දක්වා
- ❖ **ටෙන්ඩර් විවෘත කිරීම** : 2023.01.03 වන දින ප.ව. 02.00 ට වැලිකන්ද ප්‍රාදේශීය සභාවේදී

ටෙන්ඩර් කොන්දේසි හා වැඩි විස්තර වැලිකන්ද ප්‍රාදේශීය සභාව, වැලිකන්ද, පොළොන්නරුව යන ලිපිනයෙහි පිහිටි කාර්යාලයෙන් සහ දුරකථන / ෆැක්ස් අංක : 027-2259095, විද්‍යුත් තැපැල welikandaps@gmail.com ඔස්සේද ලබාගත හැක.

**උපලේඛනය**

**01. සති පොළ (දෙවෙනි වර)**

| අ/අ | වෙළඳ ස්ථානය | ටෙන්ඩර් ඇප මුදල රු. | ටෙන්ඩර් පෝරම ගාස්තු රු. | අවම ලංසුව රු. |
|---|---|---|---|---|
| 01. | කටුවන්විල සති පොළ | 3,000.00 | 2,500.00 | 15,000.00 |

**02. පොදු වැසිකිළි (දෙවැනි වර)**

| අ/අ | වෙළඳ ස්ථානය | ටෙන්ඩර් ඇප මුදල රු. | ටෙන්ඩර් පෝරම ගාස්තු රු. | අවම ලංසුව රු. |
|---|---|---|---|---|
| 01. | සෙවනපිටිය පොදු වැසිකිළිය | 5,000.00 | 2,500.00 | 33,440.00 |
| 02. | වැලිකන්ද සතිපොළ පොදු වැසිකිළිය | 3,000.00 | 2,500.00 | 6,050.00 |
| 03. | වැලිකන්ද පොදු වැසිකිළිය | 20,000.00 | 2,500.00 | 126,830.00 |

**03. සංචාරක බංගලා**

| අ/අ | වෙළඳ ස්ථානය | ටෙන්ඩර් ඇප මුදල රු. | ටෙන්ඩර් පෝරම ගාස්තු රු. | අවම ලංසුව (මසකට) රු. |
|---|---|---|---|---|
| 01. | වැලිකන්ද සංචාරක බංගලා<br>● කාමර 3 A/C හා ඇටැච් බාත්රූම් සමග<br>**කාමර අංක**<br>❖ 01-10X10 වර්ග අඩි<br>❖ 02 - 10X12 වර්ග අඩි<br>❖ 03 - 10X10 වර්ග අඩි | 100,000.00 | 3,000.00 | 25,000.00 |

4. වැලිකන්ද සති පොළ ගොඩනැගිල්ලේ ඉහළ මහල කඩ කාමර

| අ/අ | කඩ කාමර අංකය | වර්ග මීටර් ප්‍රමාණය | ඇප තැන්පතු මුදල රු. | ටෙන්ඩර් පෝරම ගාස්තු (ආපසු නොගෙවන) රු. | අවම ලංසුව (මාසික කඩ කුලිය) රු. |
|---|---|---|---|---|---|
| 1 | 1 | 4.5X4.5 | 50,000.00 | 2,500.00 | 2,700.00 |
| 2 | 2 | 4.5X4.5 | 50,000.00 | 2,500.00 | 2,700.00 |
| 3 | 3 | 4.5X4.5 | 50,000.00 | 2,500.00 | 2,800.00 |
| 4 | 4 | 4.5X4.5 | 50,000.00 | 2,500.00 | 2,800.00 |
| 5 | 5 | 4.5X4.5 | 50,000.00 | 2,500.00 | 2,900.00 |
| 6 | 6 | 4.5X4.5 | 50,000.00 | 2,500.00 | 2,900.00 |
| 7 | 7 | 4.5X4.5 | 50,000.00 | 2,500.00 | 2,900.00 |
| 8 | 8 | 4.5X4.5 | 50,000.00 | 2,500.00 | 2,900.00 |
| 9 | 9 | 4.5X4.5 | 50,000.00 | 2,500.00 | 2,800.00 |
| 10 | 10 | 4.5X4.5 | 50,000.00 | 2,500.00 | 2,700.00 |
| 11 | 11 | 4.5X4.5 | 50,000.00 | 2,500.00 | 2,700.00 |

**ඒ. එම්. නිමල් අධිකාරි,**
**සභාපති, වැලිකන්ද ප්‍රාදේශීය සභාව,**
**2022.12.15 දින,**
**වැලිකන්ද ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.**

# ලංසු ආරාධනාවයි

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## තාක්ෂණ පීඨයේ (පිට්පන පරිශ්‍රය) පවිත්‍රතා හා සනීපාරක්ෂක සේවා සැපයීම සහ ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සේවාව 2023/2024

**කොන්ත්‍රාත් අංකය - USJP/EIS/CL/FOT/2023/2024**

01. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පිට්පන පිහිටි තාක්ෂණ පීඨය සඳහා පවිත්‍රතා හා සනීපාරක්ෂක සේවා සැපයීම සහ ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සේවාව පවත්වා ගෙන යාම සඳහා යෝග්‍ය හා සුදුසුකම් සහිත සේවා සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ. 2023/2024
02. ඉහත සේවාව දින 365 ක කාලයකට අදාළ වේ.
03. මෙම ලංසු කැඳවීමේ ක්‍රියාවලිය ජාතික තරගකාරී මිල ගණන් කැඳවීමේ පටිපාටියට අනුව සිදුකරනු ලැබේ.
04. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍ය සේවා සැපයුම්කරුවන්ට දුරකථන අංක 011-2802856 ඔස්සේ සහකාර ලේඛකාධිකාරී/ ආයතන (තොරතුරු හා සේවා) ඇමතීමෙන් වැඩිදුර තොරතුරු ලබා ගත හැකි අතර, 2022.12.16 දින සිට 2023.01.05 දින පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා සතියේ දිනවල පහත ලිපිනයේ දී ලංසු පත්‍රිකා පරීක්ෂා කර බැලිය හැකිය.
05. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍ය සේවා සැපයුම්කරුවන්ට 2022.12.16 දින සිට 2023.01.05 දින දක්වා කාලය තුළ දී පහත ලිපිනයට ලිඛිතව අයදුම් කිරීමෙන් හා රුපියල් හාරදහස් පන්සීයක (රු.4,500.00) ආපසු නොගෙවන මුදලක් ගෙවීමෙන් අදාළ ලංසු පත්‍රිකා ලබා ගත හැකිය. මෙම මුදල ගෙවිය හැක්කේ සතියේ රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.2.30 දක්වා විශ්වවිද්‍යාලයේ සරප් කවුන්ටරය වෙත මුදලින් පමණි.
06. පූර්ව ප්‍රසම්පාදන පැහැදිලි කිරීම් රැස්වීමක් 2022.12.28 වන දින පෙ.ව 11.00 ට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලේ පිහිටි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී පැවැත්වේ.
07. 2023.01.09 වන දින ප.ව 02.30 ට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලේ පිහිටි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී මිල ගණන් වසා තබනු ලැබේ.
08. ලංසු බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ලංසුවේ නම හා ලංසු විවෘත කරන දිනය සඳහන් කළ යුතුය. මුද්‍රා තබන ලද ලංසු පත්‍රිකා 2023,01.09 වන දින ප.ව. 02.30 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි නුගේගොඩ, ගංගොඩවිල පිහිටි ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී/ ආයතන (තොරතුරු හා සේවා) වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කිරීම හෝ නැතහොත් ඉහත කී කර්යාලයේ තබා ඇති ලංසු බහාලන පෙට්ටියෙහි තැන්පත් කිරීම සිදු කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු පත්‍රිකා ප්‍රතික්ෂේප කර ඒවා විවෘත නොකරම ආපසු ලංසුකරුවන් වෙත යවනු ලැබේ. ප්‍රමාදයන් සම්බන්ධයෙන් තැපැල් කිරීම සනාථ කිරීමේ සක්ෂි නොපිළිගනු ඇත. මුද්‍රා තබන ලද මිල ගණන් භාර ගැනීම සඳහා නියමිත වේලාව අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ බලයලත් නියෝජිතයන්ට (එක් ලංසුකරුවෙකුට එක් නියෝජිතයෙකු බැගින්) මුද්‍රා තබන ලද මිල ගණන් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වීමට හැකියාව ඇත.
09. මේ සම්බන්ධව ගනු ලබන තීරණ ප්‍රසම්පාදන අස්ථිතය සතුවේ.
10. ලංසු පත්‍රිකා භාර ගන්නා අවසන් දින සිට 2023.03.24 වන දින දක්වා ඉදිරිපත් කරන මිල ගණන් වලංගු වේ.
11. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය උපකුලපති නමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවකින් ලබා ගත් 2023.04.21 වන දින දක්වා වලංගුවන රු.227,500.00ක වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතු වේ.
12. තෝරා ගනු ලබන සේවා සැපයුම්කරුවන් රටෙහි පවත්නා කම්කරු නීති වලට අනුගතව ක්‍රියා කළ යුතු වේ.

ඉහත අවශ්‍යතා සඳහා අදාළ ලිපිනයන් :

මිල කැඳවීමේ ලේඛන පරීක්ෂා කිරීම, මිල කැඳවීමේ ලේඛන ඉල්ලුම් කිරීම සහ ලංසු භාරදීම සඳහා

**සහකාර ලේඛකාධිකාරී,**
**ආයතන (තොරතුරු හා සේවා) අංශය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**ගංගොඩවිල, නුගේගොඩ.**

**මිල ගණන් විවෘත කිරීම**

**මාණ්ඩලික රැස්වීම් ශාලාව (පරිපාලන ගොඩනැගිල්ල),**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**ගංගොඩවිල, නුගේගොඩ.**

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.**
**2022-12-15**

2022 දෙසැම්බර් 19 සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# දේශවංශය

දේශයේ පාලන මාවත

මෙම සියලු ලිපි සංවාදයට විවෘත බව සලකන්න.

**දේශපාලනය හා සම්බන්ධ ඔබේ ලිපි අපට එවන්න.**

**‘දේශවංශය’, දිනමිණ, අංක 35, ලේක්හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.**

news.dinamina@lakehouse.lk

**සංස්කරණය - උදිත ගුණවර්ධන**



# නොබිඳෙන වාර්තාවක් තැබූ කවුද මේ ආර්.ජී.

> එංගලන්තයේ කේම්බ්‍රිජ් සරසවියෙන් නීති උපාධිය හා බැරිස්ටර් සාමාර්ථ්‍යය ලත් ඒ මහතා ධනය සොයා කළු කබාය හැඳ උසාවි ගොස් ඇත්ත නැත්ත කර නැත්ත ඇත්ත කරන නීතිඥ වෘත්තියට නොවැටුණේය.

කිසිදා නොබිඳිය හැකි වාර්තා තබන්නෝ අල්පය. බොහෝවිට කෙනකු තබන වාර්තා කාලයත් සමඟ බිඳීයාම සාමාන්‍ය දෙයකි. එහෙත් සමහරුන්ගේ වාර්තා සියවසක් ගිය ද අමතක කළ නොහැකි ඒවාය. එවැනි වාර්තා රැසක් බිහි වූයේ පනහ හැට දසකවලය. ලොව පළමු අගමැතිනියගේ සිට බොහෝ වාර්තා එයට ඇතුළත්ය. ආර්. ජී. සේනානායක මහතා ද කිසිදා නොබිඳිය හැකි වාර්තාවක් තැබූවෙකි.ඔහු තැබූ අසමසම වාර්තාවක් වන්නේ එකම මහමැතිවරණයකදී ආසන දෙකකට තරග කර ආසන දෙකම එවවර ජයග්‍රහණය කිරීමය.ඒ වාර්තාව අනගි වාර්තාවක් වන්නේ පසු කාලීනව රටේ ජනාධිපති ධූරයට පවා පත්වූ ජේ. ආර්. ජයවර්ධන මහතා කැලණිය ආසනයෙන් විශාල වැඩි ඡන්ද ප්‍රමාණකින් පරාජය කිරීමය. ඒ අතර දඹදෙණිය අසුන ද ඔහුට ජය ගැනීමට හැකියාව ලැබීම නිසා ආර්.ජී තැබූ වාර්තාව ගැන අදත් කතාබහ කරති.

දේශපාලනයේ සුවිශේෂ චරිතයක් වන ආර්. ජී. සේනානායක මහතා 1944 සිට 1970 දක්වා ව්‍යවස්ථාදායකය අඛණ්ඩව හෙබවිය. ඔහු මෙරටට මහත් සේවයක් ඉටු කළ එෆ්. ආර්. සේනානායක මහතාගේ ජ්‍යේෂ්ඨ පුතුය.

එෆ්. ආර්. සේනානායක යනු මෙරට සුදු අධිරාජ්‍යවාදී පාලනයෙන් දේශය මුදාගැනීමේත්, විශේෂයෙන් ගම් දනව් කරා ප්‍රචලිතව තිබූ සුරා සූදු ව්‍යසනයෙන් රටත්, ජාතියත් ගලවා ගැනීමට කටයුතු කළ ජාතික වීරයකු ලෙස සඳහන් කිරීම අතිශයෝක්තියක් නොවේ. ආර්.ජී. සේනානායකයන් මුලින්ම රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නාරම්මල කොට්ඨාසයෙන් දේශපාලනයට පිවිසියේය. කිසිම සමාජවාදී රටක් සමඟ සබඳතාවක් නොතිබූ සමයක යටත් පිරිසෙන් සමාජවාදී රටක සංචාරකයකුට පවා මෙරටට ඇතුළුවීමට හෝ මෙහි කිසිවකුට එම රටවලට යෑම පවා තහනම් කර තිබිණි. එවැනි තහංචි මැද වුවද එම තහනම් නියෝග කඩ කරමින් එවකට රජයේ මැති ඇමැතිවරුන්ගේ බලවත් විරෝධතා මැද ඒ මහතා චීනයට ගොස් චීන - ලංකා රබර්, හාල් ගිවිසුම අත්සන් කළ අතර. එය සුවිශේෂ ගිවිසුමක් ලෙස සඳහන් කළ හැකිය. ලෝක ඉතිහාසයේ ප්‍රථම වරට රටවල් තුනක් එකට ඈඳා තුන්කොන් වෙළෙඳ ගිවිසුමක් ඇති කළේ ඔහු විසිනි. පසු කලෙක සමාජවාදී රටවල් සමඟ ලංකාවට කටයුතු කිරීමට අවස්ථාව සැලසුණේ ඒ මහතා නිසාය. ඩී. එස්. සේනානායක රජයේ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු නියෝජ්‍ය ඇමැති පදවියට පත් ඒ මහතා පසුව ඩඩ්ලි සේනානායක, සර් ජෝන් කොතලාවල රාජ්‍ය පාලන සමයේ වෙළෙඳ ඇමැති ධුරයට පත් විය. දිවංගත බණ්ඩාරනායක මහතා සහ ඩී. ඒ. රාජපක්ෂ මහතා ප්‍රමුඛ සිංහල මහා සභාවේ ක්‍රියාකාරීන් සමඟ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවීමට පුරෝගාමී මෙහෙවරක් ඉටු කළේ ආර්.ජී.ය. මෙරට නව ප්‍රබෝධයක් ඇති කිරීමට සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු පංච මහා බලවේගය සමඟ පෙරටම ගියේය. බණ්ඩාරනායක අගමැතිවරයා විසින් පිහිටවූ නව රජයේ වෙළෙඳ ඇමැති ධුරයට පත් වූයේ කැලණි, දඹදෙණි ආසන දෙකේ මන්ත්‍රීවරයා වශයෙනි. පුරා වසර හතළිහකට අධික කාලයක් ලංකා දේශපාලනයේ ක්‍රියා කළ ආර්.ජී. ජාතික ප්‍රශ්නවලදී අභීතව කතා කළේය. අවංකව ක්‍රියා කළේය. එනිසාම ඔහු දැරූ මැති ඇමැති පදවි තල්ලු වී ගියේය. මල් පොකුරුවලට වඩා ගල් මුගුරුවලට මුහුණ දුන් දේශපාලනඥයකු වූ ඒ මහතාට ජය පරාජය සමව විඳ දරා ගැනීමේ ආත්මශක්තියක් පැවතිණි. පුරා වසර 30කට අධික කාලයක් මෙරට ගිලගෙන තිබූ ජාතික ප්‍රශ්නය පිළිබඳව දශක ගණනාවකට පෙර ඔහු අනතුරු අඟවා සිටියේය.

එංගලන්තයේ කේම්බ්‍රිජ් සරසවියෙන් නීති උපාධිය හා බැරිස්ටර් සාමාර්ථ්‍යය ලත් ඒ මහතා ධනය සොයා කළු කබාය හැඳ උසාවි ගොස් ඇත්ත නැත්ත කර නැත්ත ඇත්ත කරන නීතිඥ වෘත්තියට නොවැටුණේය. ඔහු තම දේශපාලන ජීවිතය තුළ රට වෙනුවෙන් අපමණ සේවයක් ඉටු කළ නායකයකු ලෙස සඳහන් කළ හැකිය.

**උදිත ගුණවර්ධන**



ජේ ආර් ජයවර්ධන සහ ආර්.ජී. සේනානායක මහත්වරු

# ඖෂධ මාෆියාවේ ගොදුරක් වූ සේනක බිබිලේ

රටක් ගැන රෝගීන් ගැන කතා කරන විට අපට අමතක නොකළ හැකි නාමයක් ලෙස මහාචාර්ය සේනක බිබිලේ මහතා නම් කළ හැක.

විදේශීය ඖෂධ මාෆියාවට විරුද්ධව එදා විශාල ලෙස සටනක් ගෙන ගිය අය අතර, සේනක බිබිලේ ප්‍රමුඛස්ථානයක් ගනී. මෙම ඖෂධ මාෆියාව නිසා ඔහුට තම ජීවිතයෙන් ද සමු ගැනීමට සිදු විය. ශත ගණන්වලින් එදා විදේශීය රටවලින් ගෙනා බෙහෙත් පෙත්ත රුපියල්වලට අලෙවි කරමින් රෝගීන්ව ගසා කෑ විදේශිකයන්ට සහ මෙරටට ඖෂධ ගෙන්වන්නන්ට ද විරුද්ධව විශාල හඬක් නැගුවේ මහාචාර්ය සේනක බිබිලේ මහතාය.

එදා සේනක බිබිලේ ඉදිරිපත් කළ ඖෂධ ප්‍රතිපත්තිය අදටත් සමාජය තුළ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත්තේ සේනක බිබිලේ ප්‍රතිපත්තිවලට වඩා මේ රටේ විදේශීය ජාවාරම්කරුවන් බලවත් වීම හේතුවෙනි. ඒ නිසාම සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය මේ වන තෙක් ක්‍රියාත්මක කිරීමට කිසිම රජයකට නොහැකි වීම රටේම අභාග්‍යයකි. මේ සේනක බිබිලේ උපන්නේ 1920 පෙබරවාරි මස 13 වැනිදාය. ඔහුගේ පියා මොනරාගල බිබිලේ චාල්ස් විලියම් බිබිලේය. මව අහංගම කතළුවේ සිල්වියා ජයවර්ධනයි. සේනක බිබිලේ අහංගම කතළුවේ උපත ලබා සේනක විලියම් නමින් සමාජයට එක් විය.

කුඩා කල උපන් ගමේ පාසලින් අත්පොත් තැබූ සේනක බිබිලේ කුඩා කාලයේදීම තම පියා ජීවිතයෙන් සමු ගත් අතර, එම අවධිය වන විට සේනක මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙහි අධ්‍යාපනය හදාරමින් සිටියේය.

එහිදී ඉතා දක්ෂ ලෙස ගුරු සිසු දෙපාර්ශ්වයේම සිත් දිනා ගත් සේනක එම විද්‍යාලයේදී ඉතා උසස් අන්දමින් විභාග ජය ගෙන කොළඹ වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් විය.

එහිදී ඔහුට වැඩිපුර ආශ්‍රයට ලැබුණේ කොමියුනිස්ට්වාදය සහ කාල් මාක්ස්ගේ අදහස් දරන සිසු සහෝදර සහෝදරියන් පිරිසකි. ඒ හේතුවෙන්ම සේනකට අධිරාජ්‍යවාදී අදහස් තිත්තටම තිත්ත විය. මෙම කාලයේදී ගමේ දුප්පත් ජනතාවත් සමඟ නිතර නිතර ආශ්‍රය කළ ඔහු, කොළඹ සිට බිබිලට පැමිණෙන විට ඔහු උපයාගත් මුදලින් ගමේ ගැමි ජනතාව වෙත නොයෙකුත් ඖෂධ වර්ග නොමිලේම සපයා දුන්හ. ඔහු ජනතාවට දයානුකම්පාවක් දැක්විය.

ඔහු වෛද්‍ය විද්‍යාලයේ ඉගෙනුම ලැබූ කාලයේදී පවා ඔහුගේ අදහස් වූයේ රටේ දුප්පත් ජනතාවට සේවයක් කිරීමයි. ඒ අනුව කොළඹ වෛද්‍ය විද්‍යාලයේ අවසාන විභාගයෙන් ඉතා විශිෂ්ට ලෙස සාමාර්ථ්‍යයක් ලබා වෛද්‍ය අංශයට පිදෙන ඉහළම “රන් සම්මානය” අත්පත් කර ගත්තේය. එයට අමතරව ඔහු ශල්‍ය වෛද්‍ය අංශයෙන් විශේෂ කුසලතා දක්වමින් එහිදී රන් සම්මාන හිමිකරුවෙක් වූ අතර, ඒ සඳහා ඔහු විශේෂ කාලයක් ද නොයෙදවීය. නිරන්තරයෙන් රන් සම්මාන ඔහු ලුහුබැඳ ආවේය.

පසුව කොළඹ මහාරෝග්‍ය ශාලාවේ නේවාසික වෛද්‍යවරයෙක් ලෙස සේවය කළ සේනක බිබිලේ මහතා පසුව බිංගිරිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධිකාරී තනතුරට ද පත් විය.

එදා අද මෙන් ගමින් ගම වෛද්‍යවරු නොසිටි නිසා සේනක බිබිලේ මහතා හෙට්ටිපොළ, බිංගිරිය ආදී ග්‍රාමීය රෝහල්වල ද සේවය කළේ ඉතා සතුටිනි. මෙම සෞඛ්‍ය වෛද්‍ය අධිකාරිවරයාගේ සේවය එහි රෝගීන්ගේ සහ වෛද්‍ය කාර්ය මණ්ඩලවලත් ගෞරවයට පාත්‍ර විය. මේ කාලය වන විට මොහුට වෛද්‍ය විද්‍යාලයේ කථිකාචාර්ය ධුරයක් හිමි වීමට තරම් ඔහු වාසනාවන්ත විය. එතනින් නොනැවතුණු සේනක බිබිලේට වැඩිදුර අධ්‍යාපනය සඳහා රජය මඟින් ශිෂ්‍යත්වයක් ප්‍රදානය කළේය. ඒ එංගලන්තයේ එඩින්බරෝ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධියක් හැදෑරීම සඳහාය. එහිදී රජය මඟින් ලබා දුන් ශිෂ්‍යත්වයට නියම ගෞරවයක් දක්වමින් ඔහු එම පශ්චාත් උපාධිය ඉතාමත් ගෞරවනීය ලෙස සමත් වීමට තරම් භාග්‍යවන්ත විය. එතැනින් එහි සේවය කිරීමට හොඳටම අවස්ථාව එළඹියත් ඔහු තම රටට සේවය කිරීම සඳහා නැවතත් කොළඹ වෛද්‍ය විද්‍යාලයට පැමිණ තම සේවය ඉෂ්ට කිරීම සඳහා ක්‍රියාත්මක විය.



පසුව සේනක බිබිලේ වෛද්‍ය විද්‍යාලයේ ඖෂධවේදී අංශයේ අංශාධිපති ධුරයට පත් විය. ක්‍රමක්‍රමයෙන් රටේ මැති ඇමැතිවරු මෙන්ම රෝහල් කාර්ය මණ්ඩල, රෝගීන් හා රටේ පොදු ජනතාව ද මොහුගේ ඇසුරට වැටුණි. කොමියුනිස්ට් මතධාරියෙකු ලෙස කාල් මාක්ස් අනුගමනය කළ මොහු රට තුළ මහත් ප්‍රසිද්ධියට පත්ව තිබුණි. මේ අතර මොහුට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රථම වරට ආරම්භ කළ වෛද්‍ය පීඨයේ ප්‍රථම ලාංකික හා ප්‍රථම බෞද්ධ පීඨාධිපති ලෙස ලංකා ඉතිහාසයට එක්වෙමින් එහි සේවය කිරීමට ද අවස්ථාව උදා විය.

මේ වන විට කොමියුනිස්ට්වාදයත්, කාල් මාක්ස් වාදයත් හොඳ හැටි හදාරා තිබූ සේනකට එදා ලංකා කොමියුනිස්ට් පක්ෂයේ නායක එස්. ඒ. වික්‍රමසිංහ මහතා සමඟ ළඟින්ම ආශ්‍රය කිරීමට ද අවස්ථාව උදා වී තිබුණි.

මේ වන විට දොස්තර වික්‍රමසිංහ මහතා ද, 1970 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සමඟ සුහදතාවයෙන් කටයුතු කරමින් සිටියහ. එයින් ප්‍රයෝජනයක් ගැනීමට කල්පනා කළ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය “රජයේ ඖෂධ ප්‍රතිපත්තියක්” සකස් කරන ලෙස දොස්තර වික්‍රමසිංහ මහතාට සහ සේනක බිබිලේ යන දෙදෙනාට පවරා දෙන ලදි.

ඒ අනුව 1971 මාර්තු මාසයේදී ඔවුන් විසින් ප්‍රධාන යෝජනා පහක් සහිතව තම යෝජනා ඉදිරිපත් කළහ. එම යෝජනා 05 මෙසේ සඳහන් කළ හැකිය.

* ලංකාවට අනවශ්‍ය ඖෂධ වර්ග (ප්‍රතිජීවක) ගෙන්වීම නතර කිරීම.

* රාජ්‍ය ආයතනවලත් පෞද්ගලික අංශයේත් ඖෂධවලට ඖෂධීය හෙවත් නිල නාමය පමණක් සඳහන් කිරීම.

* මෙරටට ඖෂධ ගෙන්වීම සහ මෙරට ඖෂධ බෙදා හැරීම සම්පූර්ණයෙන්ම රජයේ ආයතනයන් වෙත පැවරීම.

* ලංකාවේ ඖෂධ නිෂ්පාදන තත්ත්ව පාලන අංශය සහ පර්යේෂණ අංශය වැඩි දියුණු කිරීම.

* ඖෂධ ගැන විද්‍යාත්මක කරුණු විශ්වාස කටයුතු ලෙස වෛද්‍යවරුන්ට සහ වෛද්‍ය සේවාවන්හි යෙදී සිටින අයටත් මහජනතාවටත් ලබා දී ඔවුන් සතු දැනුම පුළුල් කිරීම.

ඉහත යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා සිරිමාවෝ බණ්ඩාරනායක රජය විසින් 1971 සැප්තැම්බර් මාසයේ දී “ශ්‍රී ලංකා ඖෂධ සංස්ථාව” පාර්ලිමේන්තු පනතක් මඟින් පිහිටුවා ක්‍රියාත්මක කරනු ලැබීය. එහි ප්‍රථම සභාපතිවරයා ලෙස මහාචාර්ය සේනක බිබිලේ මහතා පත්කර එහි සියලු වගකීම් ඔහු වෙත පවරන ලදි.

රාජ්‍ය ඖෂධ සංස්ථාව වෙත එම වගකීම් පැවරීමත් සමඟ රටට අවශ්‍ය බොහෝමයක් ඖෂධ එමඟින් ගෙන්වා ගැනීම නිසා එම වසරේම (එනම් 1971) දී රටට රුපියල් කෝටිය ඉක්මවන විදේශීය විනිමයක් ඉතිරි කර දීමට සේනක බිබිලේ මහතාට හැකි විය. ඖෂධ සංස්ථාවේ සභාපතිවරයා වූ සේනක බිබිලේ මහතා තමාට අයිති වැටුප හෝ නිල වාහනය ද ලබා නොගත් අතර, එම සංස්ථාවේ දියුණුව සඳහා ප්‍රථම වරට ඖෂධ සංස්ථාවේ වෘත්තීය සමිතියක් පිහිටුවා එම වෘත්තීය සමිතියෙන් ලබා ගත් අදහස්වලට ගරු කරමින් ඖෂධ සංස්ථාව වැඩිදියුණු කිරීමට ද ඔහුට හැකියාව ලැබුණි.

මොහුගේ සේවා කාලය තුළ ඖෂධ මඟින් අයුතු ලෙස කෝටි ගණන් මුදල් ඉපයූ විදේශීය රටවලින් ඖෂධ ගෙන්වා බෙදා හරින්නන්ගේ ආදායම් මාර්ග ශීඝ්‍ර ලෙස පහත වැටීමට පටන් ගත්හ. මෙය විදේශීය ඖෂධ සමාගම්වලටත්, මෙරටට ඖෂධ ගෙන්වා බෙදා හැරීම සිදු කළ විදේශීය සමාගම්වලටත් මහා හිසරදයක්ව පැවතිණි. නමුත් ඔහුට ඒ ගැන මෙරට දී කිසිවක් සිදු කිරීමට කිසිම ආයතනයකට හෝ කිසිම කෙනකු අවස්ථාවක් නොවූයේ, සේනක බිබිලේ දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ, සිරිමාවෝ ඩයස් බණ්ඩාරනායක, ටී.බී. සුබසිංහ, බදුද්දීන් මොහමඩ් ඇතුළු දේශපාලකයන් සමඟ උරෙනුර කටයුතු කරමින් සිටිය නිසාය.

නමුත් එක්තරා විදේශීය කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් ලෙස 1977 දී සේනක බිබිලේ මහතා ජිනීවා හි “අන්ක්ටෑඩ්” ආයතනයේ ජ්‍යේෂ්ඨ ඖෂධ ප්‍රතිපත්ති විශේෂඥයා ලෙස පත්කර ඉහළම වැටුප් සහ සියලුම වරප්‍රසාද සහිතව තනතුර පරිපූර්ණ කර තිබුණි.

ඒ අනුව තම බිරිය සමඟ ජිනීවා ගිය සේනක බිබිලේට තමන්ට හිමි රාජකාරිය අවංකව ඉටු කිරීමේදී ඖෂධ නිෂ්පාදකයන්, බෙදාහරින්නන් සහ ඇණවුම් කරන්නන් ද මොහුගේ ප්‍රධාන සතුරන් බවට පත්විය.

එම අතරතුර කාලය තුළ මොහුගේ සේවාව අගය කිරීමට යැයි සඳහන් කරමින් ජිනීවාහි දී රාත්‍රී භෝජන සංග්‍රහයක් සූදානම් කර තිබුණි. ඒ ඔහුගේ අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහය විය. එම භෝජන සංග්‍රහයේදී සේනක බිබිලේ මහතා හදිසියේම ඇති වූ හෘදයාබාධයක් හේතුවෙන් ප්‍රතිකාර ලැබීමට පෙර 1977 සැප්තැම්බර් 29 වැනිදා ජීවිතයෙන් සමුගත්තේය.

පසුව මොහුගේ බිරිය විසින් “ගයානා දූපත්” වලදී සේනකගේ සිරුර ආදාහනය කර භෂ්මාවශේෂ ලංකාවට රැගෙන විත් 1977 ඔක්තෝබර් මස 08 වැනි දා කොළඹ ජාවත්තේ (වර්තමාන බොරැල්ල) සුසාන භූමියේදී විශේෂ කුටියක තැන්පත් කරනු ලැබීය. ඔහු මිය ගිය ද අදත් සේනක බිබිලේගේ ඖෂධ යෝජනා ක්‍රියාත්මක නොකිරීමට එදා මෙන් අදත් ඖෂධ මාෆියාව රජ කරමින් සිටී. මේ වන තෙක් එය කිසිම රජයකට හෝ ක්‍රියාත්මක කිරීමට ද හැකිවී නැත. අවසානයේ සිදු වූයේ සේනක බිබිලේ අකාලයේ මිය ගොස් රටට අවශ්‍ය පුද්ගලයෙක් අපිට අහිමි වීමක් පමණකි.



**තලල්ලේ ප්‍රඥාරත්න විදානගමාච්චි**

දිනමිණ ද්වාර LOADING
කාලතුරයේ ඩිජිටල් දොරටුව



# පිටසක්වළ ජීවීන් දැනටමත් පෘථිවියේ ජීවත් වන්නේ නම්?

ඇමෙරිකානු රජය 2021 වසරේදී පසුගිය විසි වසර පුරා දර්ශනය වූ පිටසක්වළ ජීවීන් පිළිබඳ තොරතුරු හෙළිදරව් කළේය. එහි පිටසක්වළ යානා දර්ශනය වීම් 44ක තොරතුරු හෙළිදරව් කළ අතර, ඉන් බොහොමයක් සිදුවීම් දැක තිබුණේ හමුදා යානාවන් විසින් වීම විශේෂත්වයකි. නමුත් පිටසක්වළ යානා හැඳින් වූ Unidentified Flying Object (UFO) හෙවත් හඳුනා නොගත් පියාසර වස්තූන් යන නාමය වෙනුවට අමෙරිකාව විසින් Unidentified Aerial Phenomena (UAP) හෙවත් හඳුනා නොගත් ගුවන් සංසිද්ධි ලෙස හැඳින්වීමට ඔවුන් කටයුතු කර ඇත. එම හඳුනා නොගත් ගුවන් සංසිද්ධිවලට පිටසක්වළ සම්භවයක් ඇති බව තහවුරු කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ප්‍රමාණවත් සාක්ෂි එම වාර්තාවේ කිසිදු සඳහනක් නොමැත.

ගෝලාකාර හැඩැති මෙම පිටසක්වළ යානා නිරීක්ෂණය වූ ගුවන් නියමුවකුගෙන් විමසුවහොත් පවසනු ඇත්තේ පැහැදිලි කළ නොහැකි වේගයකින් එම යානා ගමන් කර ඇති බවයි. කෙසේ වෙතත් මේ වන විටම පිටසක්වළ ජීවීන් පෘථිවියේ ලැගුම් ගෙන ඇත්නම්? එය එසේ නම් අප මේ වන විටත් අනතුරේය. ඒ මන්දයත් පිටසක්වළ ආක්‍රමණයකට අප ඉලක්ක වී ඇත්නම් ඊට එරෙහි වීමට අපට කිසිදු සැලසුම් නොමැති නිසාය. පිටසක්වළයින් දැනටමත් පෘථියේ විසිර ඇත්නම් එයින් ගම්‍ය වන්නේ ඔවුන් සතුව අති නවීන දියුණු තාක්ෂණයක් සතු වන බවයි.


## පරිණාමය

අපගේ ක්ෂීරපථ මන්දාකිනියේ බොහෝ තරු අපගේ සූර්යයාට වඩා බොහෝ දිගු කාලයක් සිට පැවත එයි. මෙයින් අදහස් කරන්නේ පිටසක්වළ ජීවීන්ට පරිණාමය වීමට සහ තාක්‍ෂණිකව ඉදිරියට යාමට වැඩි කාලයක් තිබෙන බවයි. එම පිටසක්වළ ජීවීන් ආක්‍රමණශීලි නම්, අපි විනාශ වී හමාරය. අපට ආපසු සටන් කිරීමට කිසිදු අවස්ථාවක් නැත. අපගේ අවාසනාවන්ත මරණයට පෙර අපට හිස ඔසවා සමහර දේවල් අත්හදා බැලිය හැකිය.

අපේ පෘථිවියට තර්ජනයක් විය හැකි ඕනෑම දෙයක් නිරීක්ෂණය කරන වැඩසටහන් අප සතුව ඇත. එය පෘථිවිය වෙත එන ග්‍රාහකයක් හෝ අපව අතුගා දැමීමට එන සතුරු පිටසක්වළ යාත්‍රාවක් විය හැකිය. එවිට අපි මෙම ගැටලුව අපට සිතිය හැකි හොඳම ආකාරයෙන් විසඳීමට උත්සාහ කරමු. ඔවුන් අපව විනාශ කිරීමට පෙර ඔවුන්ව අක්‍රිය කළ හැකිය. ඒ අභ්‍යවකාශයට නිකුත් කරන මිසයිලයකට ඔවුන් සතු ඕනෑම පිටසක්වළ ආරක්ෂාවක් විනිවිද ගොස් සැබෑ හානියක් සිදු කළ හැකි යැයි අපි බලාපොරොත්තු වෙමු.

UFOs,සමාවන්න, UAPs,පෘථිවට පැමිණෙන ආකාරය අපට හඳුනාගත නොහැකි නම් හෝ ඔවුන් පැමිණෙන






රටාව හඳුනාගත නොහැකි නම්,අභ්‍යවකාශයේදී ඒවාට පහර දීමේ අපගේ අවස්ථා හාස්‍යජනක ලෙස අඩු වනු ඇත. ඉලක්කයට පහර දිය නොහැකි නම් ඔවුන්ව කේන්ති ගස්සන උත්සාහයක් වනු ඇත. හදිසියේවත් යූ.ඒ.පී. යානා පෘථියට ගොඩබැසීමක දී හොලිවුඩ් චිත්‍රපටවල මෙන් පෙන්ටගනය බේරා ගැනීම සඳහා පිටසක්වළයින්ට දුවන්න පහරදිය හැකි ආයුධ අමෙරිකානු හමුදාව සතු වෙතැයි ප්‍රාර්ථනා කරමු. නමුත් පිටසක්වළ ජීවීන් අපට කිසිදු හානියක් අදහස් නොකළත්, ඔවුන්ගේ පැමිණීම අපේ ශිෂ්ටාචාරයේ අවසානයට හේතු විය හැකිය.

## ව්‍යාජ පුවත්

පිටසක්වළ ජීවීන් පෘථිවියට සමීප වීමකදී ලෝකයේ රාජ්‍යයන් තර්ජන තක්සේරු කිරීමට සහ ඔවුන් සමඟ සන්නිවේදනය කිරීමට මාර්ග සොයා ගැනීමට උත්සාහ කරනු ඇති අතර, සිවිල් වැසියන්ට නිවෙසේ රැඳී සිටීමට නියෝග කරනු ඇත. නමුත් සමස්ත ජනතාව නිවෙස්වල රඳවා ගැනීමට අපහසු වනු ඇති. ව්‍යාජ පුවත් ලොව පුරා පැතිරෙනු ඇති. ඒවා විශ්වාස කර භීතියට පත්ව ජීවිත බේරා ගැනීමට විවිධ උත්සාහයන් දැරීමට ජනතාව කටයුතු කරනු ඇත. ඒ හරහා සමස්ත ලෝකයේ සමාජයන් බෙදී වෙන් වනු ඇත. ඒවායේ ගැටුම් ඇති වනු ඇත.

අපි අපේ පාඩුවේ සිටියත්, පිටසක්වළ ජීවීන්ට අපට ප්‍රතිශක්තියක් නොමැති පිටසක්වළ ක්ෂුද්‍ර ජීවීන් ගෙන ඒමට හැකියාව ඇත. ඒ හරහා සිතා ගත නොහැකි වේලාවකදී ඔවුන් අපව මේ මිහිතලයෙන් අතුගා දමනු ඇත. එම නිසා පිටසක්වළයින් දැන්ම අප වෙත නොඑතැයි අනුමානු කර සතුටින් ජීවත ගත කරමු.

**පී.කේ. බණ්ඩාර**



# මහා ඇලෙක්සැන්ඩර්

ඉසාක් අසිමොව්

Sci-fy

**විද්‍යා ප්‍රබන්ධය**

**අවසන් කොටස**

සිදු වන මරණ කළු මරණ ලෙස නම් කෙරිණ.* කළු මරණ යනු මාර්කස් ඔරේලිස් සහ පර්සිලස් කාලයේ ඇති වූ තත්ත්වය නැවත ඇති වීමක් පමණයි. විසි වැනි සියවසේදී ඇති වූ ජාත්‍යන්තර යුද්ධ මෙන්ම දහසය සහ දහහත් වැනි සියවස්වල ඇති වූ ආගමික යුද්ධවලින් විනාශ සිදු වුවත් එය නැවත නැවතත් සිදු වේවි. කෙසේ වෙතත් ඔබට දිගටම කටයුතු කරගෙන යන්න මම නියෝග කරනවා. ඔබ මගේ නියෝග පිළිපැදිය යුතුයි"

"එය එසේ විය යුතුයි" බියුසිපෙලස් එකඟතාව පළ කළේය.

විසි අට හැවිරිදි විය වන විට ඇලෙක්සැන්ඩර් කවදා හෝ ජීවත්ව සිටි අය අතර, පොහොසත්ම මිනිසා වූ අතර, බියුසිපෙල්ස්ටවත් එය හරියටම ගණනය කළ නොහැකි විය. සහතිකවම එය බිලියන සියය ඉක්මවූ අතර, ඔහුගේ දෛනික ආදායම දවසකට දශ ලක්ෂයක් පමණ විය.

කිසිම ජාතියක් ඇත්ත වශයෙන්ම ස්වාධීන නොවූ අතර, ඇලෙක්සැන්ඩර්ට අහිතකර කිසිදු ක්‍රියාවක් කිරීමට කිසිම ජන කණ්ඩායමකට නොහැකි විය.

ලෝකය පුරා සාමය පැතිර ගියේය. එසේ වූයේ ඇලෙක්සැන්ඩර්ට තම දේපළ විනාශ වනු දැකීමට දැක්වූ අකමැත්තයි. ඇලෙක්සැන්ඩර්ට හිරිහැර විය හැකි කිසිවක් කිරීමට ලෝකයට නොහැකි විය. ඒ නිසාම කිසිදු නිදහසක් නැති විය. සියල්ල සිදු කළ යුත්තේ ඇලෙක්සැන්ඩර්ගේ කැමැත්ත පරිදියි.

"මම හැම තැනම ඉන්නවා බියුසිපෙලස්"ඇලෙක්සැන්ඩර් කීය. "තව දෙවසරක් යන විට කිසිම මිනිසකුට මට හිරහැර කිරීමට හැකි තරම් බලයක් තියෙන එකක් නැහැ. සියලුම විද්‍යාවන් මා වෙනුවෙන් එක් කාර්යයක් කිරීමට බැඳී සිටීවි. එම කාර්යය නම් මා අමරණීය තත්ත්වයට පත් කිරීමයි. මහා ඇලෙක්සැන්ඩර් රජුටත් වඩා මා බලවත් වේවි. මම මහා ඇලෙක්සැන්ඩර් දෙවියන් බවට පත් වේවි. සියලුම මිනිස්සු මට වන්දනාමාන කරාවි."

"මෙතෙක් කල් මා ඔබ වෙනුවෙන් කළ හැකි සියල්ල ඉටු කළා. එහෙත් ඉදිරියේදී මට ඔබ ආරක්‍ෂා කිරීමට හැකියාවක් ලැබෙන්නෙ නැහැ. සිදු වන වෙනස්කම්වලින් ඔබ ගලවා ගැනීමට මට හැකියාවක් නැහැ. " බියුසිපෙලස් පැවසුවේය.

"ඒක එහෙම වෙන්න බැහැ බියුසිපෙලස්." ඇලෙක්සැන්ඩර් නොඉවසිලිමත් ලෙස කිවේය. "බයෙන් ඇකිළෙන්න එපා. තවමත් මගෙ පාලනයෙන් බැහැරව තියෙන පෘථිවියට අයත් සියලු ධනය මගෙ අතට පත් කරන්න කටයුතු කරන්න."

"මම හිතන්නෙ නැහැ මට පුළුවන් කියලා."බියුසිපෙලස් කිවේය. "මම මිනිස් ඉතිහාසයෙ කරුණු සියල්ල සොයා බැලූවා. ඒ අනුව මෙතෙක් නොපැවති සම්පූර්ණයෙන්ම අලුත් දෙයක් මගේ චක්‍රයට ඇතුළත් කරන්න බැහැ."

"කිසිම අලුත්ම දෙයක් තියෙන්න බැහැ." ඇලෙක්සැන්ඩර් කෝපයෙන් කීවේය. "පහුබහින්න එපා. මම ඔබට නියෝග කරනවා දිගටම කරගෙන යන්න."

"හොඳයි." බියුසිපෙලස් මිනිස් හඬකින් සුසුමක් හෙළමින් කීවේය.

බියුසිපෙලස් තම ශක්තිය මුළුමනින්ම වැය කරමින් තමා අමරණීයත්වයට පත් කිරීමේ ශ්‍රේෂ්ඨ කාර්යයට උර දෙන බවත් කොයි මොහොත් හෝ එය සාර්ථක වනු ඇති බවත් ඇලෙක්සැන්ඩර් දැන සිටියේය. "එවිට මුළු ලෝකයම සදාකාලිකව මා යටතේ."

"අලුත්ම තත්ත්වය කුමක්ද?" ඔහු මහත් කුතුහලයෙන් විමසුවේය.

"ඒ මම" බියුසිපෙලස් කෙඳිරිලි හඬකින් කිවේය. "මීට පෙර මගේ තත්ත්වයේ කිසිම දෙයක් ...."

ඔහු වාක්‍ය අවසාන කිරීමටත් පෙර බියුසිපෙලස්ගේ විද්‍යුත් පරිපථ මැකී ගොස් සියල්ල අඳුරු විය. බියුසිපෙලස් දැරූ දැඩි උත්සාහය නිසා එහි විලයනය දැවී ගොසිනි. ඒ සමඟ එහි මතක ගබඩාවේ තිබූ ආර්ථික හා මූල්‍ය තොරතුරුද මැකී ගොසිනි. ඒ සමඟම ඇලෙක්සැන්ඩර් මැකී ගියේය.

යළිත් පෘථිවිය නිදහස් විය. යම් යම් අඩුපාඩු සහ දුර්වලතා පැවතියත් පෘථිවිය යථා තත්ත්වයට පත් කිරීමට වැය වී ඇත්තේ අඩු ගාස්තුවකි.

අනුවාදය
**බොබී පී බොතේජු**

# ත්‍රීඩී ස්කෑනරයේ රූප විප්ලවය



වර්තමානයේ ත්‍රිමාණකරණයට හිමි වන්නේ සුවිශේෂී තැනකි. ත්‍රිමාණ රූප රාමු සහිත චිත්‍රපට බොහෝ දෙනකුගේ ආකර්ෂණයට ලක්ව ඇති අතර, ඒ සඳහා වෙනම සිනමා ශාලා ද පවතී. තවද Scanner එකක් මඟින් ද අපට ද්විමාන ආකෘතියක් Scan කර ගත හැකි අතර, අපට යම් භාණ්ඩයක්, පුද්ගල රූපයක් ත්‍රිමාණව Scan කර ගැනීමේ හැකියාවක් මෙතෙක් නොතිබිණි. එහෙත් Revopoint pop 2 හඳුන්වා දීමත් සමඟ යම් දෙයක් ත්‍රිමාණව Scan කර ගත හැකි අතර, නැවත යම් ද්‍රව්‍යයක් භාවිතයෙන් ත්‍රිමාණව එම රූප ගොඩනැංවීමට ද පුළුවන.

Revopoint pop 2 උපාංගයට සක්‍රිය ත්‍රිමාණ මුද්‍රණ නිර්මාණය කළ හැකි අතර, කැමරා මඟින් අවශ්‍ය රූපය පරිගණක තිරයක් මතට ගෙන ඒමට හැකිය. තවද ත්‍රිමාණ මුද්‍රණ යන්ත්‍රයකට එම දත්ත සැපයීමෙන් Scan කළ රූපය එලෙසින්ම නිර්මාණය කර දෙන අතර, කරකැවෙන පුංචි උපකරණයක් ද Revopoint pop 2 සමඟ නොමිලේ ලැබේ. ඊට හේතුව කුඩා දෙයක් Scan කර ගැනීමේදී Revopoint pop 2 කරකැවීම අවශ්‍ය නොවීමටය. මින් ත්‍රිමාණව Scan ගැනීමේ හැකියා ඉහළ මට්ටමක පවතින බවට ද මව් සමාගම මේ වන විටත් ඔප්පු කර අවසන්ය. අනාගතයේදී ත්‍රිමාණ රූප නිර්මාණයේදී මෙය හැරවුම් ලක්ෂ්‍යයක් සටහන් කරනු ඇතැයි විද්‍යාඥයෝ පවසති.

# අතේ ගෙන යන සේදුම් යන්ත්‍රයකි කුඩා



මුළුතැන්ගෙයි පිරිසුදුභාවයට ප්‍රමුඛස්ථානයක් හිමි විය යුත්තේ අප පරිභෝජනය කරන ආහාර එහිදී පිළියෙල වීමය. මුළුතැන්ගෙය අපිරිසුදු නම් අපට ලෙඩ රෝගවලින් ද අඩුවක් නොවනු ඇත. මේ කියන්නට යන්නේ මුළුතැන්ගෙයි මෙන්ම ඔබට මේ දිනවල කොවිඩ් වසංගතයෙන් ආරක්ෂා වීමට උපකාරී වන උපාංගයක් ගැනය.

Capsule personal dishwasher නමින් හඳුන්වන මෙමඟින් පලතුරු සහ එළවළු සෝදා පිරිසුදු කර ගැනීම, මේ කාලයේ පලඳින මුව ආවරණ මෙන්ම කොවිඩ් වයිරසයෙන් ආරක්ෂා වන පරිදි භාණ්ඩ විෂබීජහරණය කර ගැනීම, පිඟන් සහ කෝප්ප ආදි හොඳින් සෝදා පිරිසුදු කර ගත හැකිය. මෙය ඕනෑම තැනකට පහසුවෙන් රැගෙන යෑමේ හැකියාව ද ඇති අතර, එය තැබීමට මුළුතැන්ගෙයි කුඩා ඉඩ ප්‍රමාණයක් හොඳටම ප්‍රමාණවත්ය.


# පහසු රෝද ගලවන්නා 'Trestle Jacks'



යතුරුපැදිය හැරුණුකොට අනෙක් වාහන සඳහා අමතර රෝදයක් එම වාහනයේම ඇත. ඊට හේතුව හදිසියකදී එක් රෝදයක හුළං බැසීමක් සිදු වූයේ නම් සේවා ස්ථානයක් වෙත ගමන් කිරීමටය. මෙහිදී අමතර රෝදය සවි කර ගැනීමට ප්‍රථම හුළං බැසීමක් සිදු වූ රෝදය ගලවා ගත යුතු අතර, එහිදී Jack එකක් භාවිත කරනු ලබයි. කෙසේ වෙතත් ද්‍රව Jack එකක් භාවිතයෙන් අමතර රෝදය සවි කර ගැනීමේදී වැඩි වේලාවක් ගත වන අතර, Trestle Jacks භාවිතයෙන් තත්පර කිහිපයකදී රෝදය මාරු කර ගැනීමට හැකිය.

Trestle Jacks යනු ත්‍රිකෝණාකාර උපකරණයකි. එය ගලවන රෝදය ආසන්නයේ තබමින් වාහනය පසුපසට ගැනීමේදී වාහනයේ පිටුපස හෝ ඉදිරිපස එසවීමක් සිදු වේ. ඉන් අනතුරුව රෝදය මාරු කිරීමක් සිදු කළ හැකි අතර, නැවතත් වාහනය ඉදිරියට හෝ පසුපසට ගැනීමෙන් Trestle Jacksඑක ගලවා තත්පර ගණනකදී වාහනයේ රෝදය මාරු කරන කොටස ඉහළට ඔසවා ගත හැකිය. කාන්තාවක් වාහනය පදවන විටදී රෝදයක් මාරු කර ගැනීමට අවශ්‍ය විටදී මෙය වඩාත් පහසු වන අතර, වාහනයට ද අනතුරක් නොවන පරිදි Trestle Jacks භාවිතයෙන් රෝදය සුළු වේලාවකදී ගලවා අමතර රෝදය සවි කර ගත හැකිය. එසේම වෙනත් Jack මෙන් Trestle Jacks බරකින් ද යුක්ත නොවන අතර, භාවිතයට මෙන්ම රැගෙන යෑමට ද පහසුය.

Gadget පිටුව




**ගයාන් සංජය**

සංස්කරණය - රජිත බස්නායක




# වගා කව අයිතිකාරයෝ පිටසක්වළ ජීවීන්ද





## CROPE CIRCLE



ලෝකයේ බොහෝ තැන්වලින් අසන්නට ලැබෙන සිදුවීමක් වන්නේ පෘථිවියේ ජීවත් නොවන, වෙනම ග්‍රහ ලොවකින් පැමිණි ජීවීන් පිරිසක් සිදු කරන ක්‍රියාකාරකම් පිළිබඳවය. එය කොයි මොහොතේ කොතැනක සිදු වෙනවා ද යන්න කිසිවෙකුටත් අනුමාන කළ නොහැකි අතර, මේ හා සම්බන්ධ සිදුවීම් පිළිබඳව විශේෂිතව ගවේෂණය කරනු ලබන පිරිසක් ද ලොව පුරා විසිරී සිටිති. ඔවුනගේ ක්‍රියාකාරකම් යම් විශේෂිත වූ ස්ථානයක් මූලික කර ගනිමින් සිදු නොවන අතර, යම් විටෙක ඓතිහාසික ස්ථාන මෙන්ම ආගමික ස්ථාන මූලික කර ගනිමින් ද තවත් විටෙක පෞරාණික ස්ථාන ආශ්‍රයෙන් ද සිදුව ඇති බව පසුගිය සිදුවීම් පිළිබඳව විමසන කල පෙනීයන කරුණකි. එහෙත් යම් විටෙක සමස්ත මිනිස් ප්‍රජාවටම අවබෝධ කර ගත නොහැකි යම් සිදුවීමක් පිළිබඳව සලකුණු දක්නට ලැබෙන කල බොහෝ දෙනෙක් ඒවා ගොනු කරනු ලබන්නේ පිටසක්වළ ජීවීන් විසින් සිදු කරනු ලැබූ ක්‍රියාවක් ලෙසයි.

කෙසේ වෙතත් මෑත කාලීන ඉතිහාසයේදී වඩාත් කතාබහට ලක්වූ කාරණාව වන්නේ මෙලොව ජීවත් වන මිනිසුනට අදහාගත නොහැකි අයුරින් නිර්මාණය වී තිබෙන වගාකව පිළිබඳවයි. වගා කව සම්බන්ධයෙන් දිගුකාලීන ඉතිහාසයක් ඒ හා සබැඳි සිදුවීම් පිළිබඳව දිගහැරෙන විස්මිත දෑ සමඟ හෙළිදරව් වේ. කවරාකාරයෙන් පැවසුවද වගා කව හෙවත් CROPE CIRCLE හා ගොඩනැඟුණු සිදුවීම් අතුරින් ඒවා පිටසක්වළ ජීවීන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව මේ වන විටත් විසඳුමක් නිසි ආකාරයෙන් ලබාගත නොහැකි කරුණක් ලෙසින් මේ පිළිබඳව විමර්ශනය කරන්නන්ගේ අදහසයි.

වගා කව සම්බන්ධයෙන් දැන ගැනීමට ලැබෙන ප්‍රථම සාක්ෂිය හමුවන්නේ මීට වසර තුන්සියයකටත් එහා අතීතයකදීය. ඒ 1678 වසරේදීය. මේ ආකාරයට හමුවූ ලිඛිත සාක්ෂියෙන් විග්‍රහ කර තිබෙන්නේ අස්වැන්නට අධිපති වශයෙන් හඳුන්වන දෙවියන් විසින් වගා බිම්වල මේ ආකාරයට හැඩතල නිර්මාණය කරමින් එම අස්වැන්න විනාශ කිරීමට කටයුතු කළ බවයි. එහෙත් මෙවැනි වගාකව නිරීක්ෂණය කළ ඒ පිළිබඳව පර්යේෂණ සිදු කරනු ලබන විද්‍යාඥයන්ගේ මතය වූයේ කවරාකාරයෙන් හෝ එම අස්වනු විනාශ වීමක් හෝ ඒවාට හානියක් සිදු නොවූ බවයි. මේ නිසා පුරාතනයේ වගා කව සම්බන්ධයෙන් ඉදිරිපත් කළ සාක්ෂිය මිථ්‍යාවක් බව වර්තමානයේදී ඔප්පු කරන්නට විද්‍යාඥයන් සමත් විය. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වූ එයට ප්‍රතිවිරුද්ධ අදහස වන්නේ මේ ආකාරයට වගා කව දක්නට ලැබුණු වගා භූමිවල අස්වැන්න අනෙකුත් භූමියන්හි වගාවන්ට වඩා ඉහළ අගයක් ගත් බවයි. තවදුරටත් ඔවුන් පවසන්නේ වගාවන්ට අයත් ශාකයන් යම් ආකාරයකට හැඩ වෙනස් වුවද අස්වැන්න අඩුනොවූ බවයි.

වගා කව සම්බන්ධයෙන් දැන ගැනීමට තිබෙන ප්‍රථම සාක්ෂිය 1678 වසරේදී හමු වුවද මේ සිදුවීම් සම්බන්ධ මුල්ම වගාකවය පිළිබඳව වාර්තා වී ඇත්තේ බ්‍රිතාන්‍යයේ වික්ටර් බෝන් නම්වූ ප්‍රදේශයෙන්ය. ඒ විශේෂිත සිදුවීම් වන්නේ මේ වන විට ලෝකයේ වාර්තා වී ඇති වගාකව අතුරින් 80%ක් ම වාර්තා වී ඇත්තේ බ්‍රිතාන්‍යයෙනි. තවද රුසියාව, බ්‍රිතාන්‍ය, කැනඩාව, ඇමරිකාව, ජර්මනිය වැනි රටවල වැඩි වශයෙන් වගා කව පිළිබඳව වාර්තා වන අතර, ඉන්දියාවෙන් ද වගා කව බහුල ලෙසින් මේ වන විට වාර්තා වී තිබේ.

මේ සම්බන්ධව ඉතිහාසයේ සිට මෙන්ම වර්තමානය දක්වා නොයෙක් ආකාරයේ වාර්තාවන් මෙන්ම නිරීක්ෂණයන් ද එළිදක්වා ඇති අතර, පසුගිය වසර 25 කට එහා සිට වගා කව සම්බන්ධයෙන් පර්යේෂණයක් සිදු කළ කොලින් ඇන්ඩෘස් පවසන්නේ මෙම වගා කවයන් සිදු කර ඇත්තේ සමමිතික ආකාරයෙන් ජාමිතික රූප බහුලව සිටින ආකාරයෙන් බවයි. මේ සම්බන්ධව ඔහු දිගින් දිගටම පර්යේෂණ කාර්යයන්හි නිරත වෙමින් සිටී. වගා කව ආශ්‍රිතව ඇන්ඩෘස් පර්යේෂණ පවත්වමින් කියා සිටියේ පසුදින වගා කවයක් නිර්මාණය වූ ස්ථානයක ඉහළින් පෙරදින රාත්‍රියේදී ආලෝකයක් ඇදී යනු දුටු බවයි. ඒ අනුව ඔහු නිගමනයකට පැමිණ තිබූයේ ආලෝක ධාරාවක් ඇදී යාමෙන් පසු වගා කව නිර්මාණය වන බවයි. එමෙන්ම ඉතිහාසයේ ඈතට යන විට දක්නට ලැබෙන්නේ රතු ඉන්දියානු ජාතිකයන් පවා වගාකව සම්බන්ධයෙන් විමසිලිමත්ව ඇති බවයි. මේ ආකාරයේ වගාකව දක්නට ලැබෙන සමයේදී රතු ඉන්දියානුවන් විසින් දින ගණනාවක් පුරා උත්සව පවත්වන අතර, ඔවුන්ගේ විශ්වාසය වන්නේ වගා කව යනු දිව්‍යමය මෙන්ම ශුද්ධවූ සලකුණු බවයි.

පුදුම සහගත වූ මෙම වගාකව අරඹයා 1980 දී මුලින්ම අවධානය යොමුවිය. දශක ගණනාවකට පෙර සිටම මේ සම්බන්ධව තොරතුරු එක්රැස් කිරීම් මෙන්ම පර්යේෂණයන් සිදු වුවද විශේෂිතම කරුණ වන්නේ පිටසක්වළ ජීවීන් විසින් නිර්මාණය කළා යැයි සැලකෙන වගාකව නිර්මාණය වන්නේ කොයි මොහොතේ, කෙලෙසක ද යන්න කිසිවෙකුත් මේ මොහොත වන විටත් දැක නොමැතිවීමයි. වාර්තාවන්හි සඳහන් වන්නේ විශාල ප්‍රමාණයේ වගා කව නිර්මාණය වීමට ගත වන්නේ පැය කිහිපයක් පමණක් බවයි.

මෙම වගා කව සම්බන්ධයෙන් නොයෙක් ආකාරයේ මති මතාන්තර ඉදිරිපත් වී ඇති අතර, එක් පිරිසක් පවසන්නේ අනිවාර්යෙන්ම මෙම වගාකව කටයුතු සඳහා පිටසක්වළ ජීවීන් සම්බන්ධ බවයි. ඔවුන් පවසන්නේ මේ ආකාරයට විවිධ ජ්‍යාමිතික හැඩතල මඟින් ඔවුන් විදහා දක්වන්නේ පිටසක්වළ ජීවීන් භාවිතා කරනු ලබන අක්ෂර බවයි. ලෝකයේ මේ ආකාරයට වගා කව නිර්මාණය වන ප්‍රදේශ දැනට හඳුනාගෙන ඇති අතර, වැඩි වශයෙන් මෙම කව හමුව ඇත්තේ පූජනීය ස්ථාන, භූගත ජලය හමුවන ප්‍රදේශ ආදිය ආශ්‍රිතව බව සඳහන් වේ. කවරකු කවරාකාරයෙන් මත ඉදිරිපත් කළ ද මේ මොහොත වන විට වැඩි දෙනෙකුගේ මතය වන්නේ මෙවන් වගා කටයුතු නිර්මාණයන් සිදු වන්නේ පිටසක්වළ ජීවීන්ගේ ක්‍රියාකාරකම් මත බවයි.

ඉහත සඳහන් කරනු ලැබූ ස්ථානයන්ට අමතරව කලාතුරකින් කාන්තාර ප්‍රදේශවල ද මේවා දක්නට ලැබේ.

කෙසේ වෙතත් මේ සියල්ල නිර්මාණය වන අයුරු දුටු කෙනෙකු නොමැති හෙයිනුත් මිහිපිට ජීවත්වන කවරකු හෝ වගා කව නිර්මාණය නොකළ හෙයිනුත් තවමත් ඒ සම්බන්ධයෙන් ඇත්තේ නොවිසඳුණු අබිරහසක් පමණි.

**රජිත බස්නායක**





වගාකව සම්බන්ධයෙන් දැන ගැනීමට තිබෙන ප්‍රථම සාක්ෂිය 1678 වසරේදී හමු වුවද මේ සිදුවීම් සම්බන්ධ මුල්ම වගාකවය පිළිබඳව වාර්තා වී ඇත්තේ බ්‍රිතාන්‍යයේ වික්ටර් බෝන් නම්වූ ප්‍රදේශයෙන්ය. ඒ විශේෂිත සිදුවීම් වන්නේ මේ වන විට ලෝකයේ වාර්තා වී ඇති වගාකව අතුරින් 80%ක් ම වාර්තා වී ඇත්තේ බ්‍රිතාන්‍යයෙනි. තවද රුසියාව, බ්‍රිතාන්‍ය, කැනඩාව, ඇමරිකාව, ජර්මනිය වැනි රටවල වැඩි වශයෙන් වගාකව පිළිබඳව වාර්තා වන අතර, ඉන්දියාවෙන් ද වගාකව බහුල ලෙසින් මේ වන විට වාර්තා වී තිබේ.



